විදේශ සම්පත් දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යාංශය
ශ්‍රී ලංකාව

# කාර්යසාධන වාර්තාව

# 2018

©2018 විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

**විදේශ සම්පත් දෙපාර්තමේන්තුව**
මහලේකම් කාර්යාලය (3 වැනි මහල)
තැ.පෙ. 277
කොළඹ 00100
ශ්‍රී ලංකාව

info@erd.gov.lk
http://www.erd.gov.lk

# අන්තර්ගතය


සමස්ත විග්‍රහය

විදේශීය මූල්‍යයනය

## එක් එක් අංශයන්හි කාර්යසාධනය

ආසියානු සංවර්ධන බැංකු අංශය

පෙරදිග ආසියානු අංශය

- ජපානය
- කොරියාව

ලෝක බැංකුව හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල් අංශය

චීන හා ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකු අංශය

මැදපෙරදිග හා දකුණු ආසියා අංශය

- මැදපෙරදිග රටවල්
- දකුණු ආසියානු රටවල්

දියුණු ආර්ථික අංශය

එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන සහ තාක්ෂණික ආධාර අංශය

- එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන
- තාක්ෂණික ආධාර අංශය

ප්‍රාග්ධන වෙළඳපොළ හා ආයෝජන අංශය

ණය කළමනාකරණ අංශය

අංශ සම්බන්ධීකරණ හා කාර්යසාධන අධීක්ෂණ ඒකකය

පාලන හා ගිණුම් අංශවල කාර්යසාධනය

# දැක්ම

කඩිනම් ආර්ථික සංවර්ධනයක් සඳහා අවශ්‍ය අන්තර්ජාතික දැනුම, ප්‍රවීණතාවන් සහ මූල්‍ය පහසුකම් සලසාදීම මඟින් ශ්‍රී ලංකාවේ අනාගතය හැඩගැස්වීම.

# මෙහෙවර

රට තුළ ණය තිරසාරත්වය දිගුකාලීනව පවත්වා ගෙන යාමට උපකාරී වෙමින් ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංවර්ධනය සඳහා දරාගතහැකි පිරිවැයක් සහිතව හා අවම කොන්දේසිවලට යටත්ව විදේශ ආධාර/ මූල්‍ය පහසුකම් යෙදවීම.

# අපගේ අරමුණු

- සංවර්ධන ව්‍යාපෘති හිතකර කෝන්දේසි හා නියමයන් මත අවම පිරිවැයකින් හා අවධානමකින් යුතුව මූල්‍යයනය කිරීම, විදේශ මූල්‍ය සම්පත් ඒකරාශි කිරීම
- විදේශ සම්පත් ඵලදායි අන්දමින් හා කාර්යක්ෂම ලෙස උපයෝජනය කිරීම පිණිස පහසුකම් සැපයීම
- දිගුකාලීන විදේශ ණය තිරසාරභාවයෙන් පවත්වා ගැනීමෙහිලා දායකවීම
- විදේශ පුහුණු අවස්ථා ඵලදායී ලෙස උපයෝගී කර ගැනීම තුළින් රාජ්‍ය අංශයේ මානව සම්පත් සංවර්ධනය සඳහා දායක වීම
- දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති වගකීම් සම්භාරය ඵලදායී මෙන්ම කාර්යක්ෂම ලෙස ඉටුකිරීම උදෙසා දෙපාර්තමේන්තුවේ හැකියාවන් තවදුරටත් සවිමත් කිරීම

# අපගේ සාරධර්ම

- සියලුම අණපනත්වලට අවනත වෙමින් හෘද සාක්ෂියට අනුකූලව කටයුතු කිරීම, ඉතා උසස් මට්ටමේ යහපාලනය, විනිවිදභාවය හා අනාවරණය පිළිබඳ ප්‍රතිපත්තීන් පිළිපදිමින් ආචාරශීලීව කටයුතු කිරීම
- උසස් මට්ටමේ පුද්ගල එකමුතුභාවයට අනුකූලතාවයක් දක්වමින් පෞද්ගලික අභිලාෂයන්ට වඩා දෙපාර්තමේන්තුවේ අභිලාෂයන්ට ප්‍රමුඛස්ථානය දීම
- කාර්ය මණ්ඩලයට ස්වකීය උපරිම කාර්යසාධන මට්ටම කරා ළඟාවීමට හැකිවන පරිදි සහ එම කාර්ය ප්‍රදර්ශනය කිරීමට හැකිවන ලෙස අන්‍යෝන්‍ය ගෞරවයෙන් හා විශ්වාසයෙන් කටයුතු කළහැකි පරිසරයක් බිහිකිරීම
- සත්‍ය හා සාධාරණවූත්, ගණුදෙනු තුළින් සංවර්ධනය කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශ්වකරුවන් සමඟ දිගුකාලීන යහපත් සබඳතා ප්‍රවර්ධනය කිරීම
- සෑම මට්ටමකම කාර්ය මණ්ඩලය සවිබලකරණය හා ඔවුන්ගේ කටයුතුවලට මැදිහත්වීම අවම කිරීම තුළින් ස්වකීය රාජකාරී සම්බන්ධව වගකිව යුතු බව ඒත්තු ගැන්වීම

# විදේශ සම්පත් දෙපාර්තමේන්තුව පිළිබඳ සැකෙවින්

විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, විදේශ මූල්‍යයනය ඒකරාශී කිරීම පිළිබඳ වගකීම දරණ දෙපාර්තමේන්තුව වේ. එය මුදල් අමාත්‍යාංශය යටතේ වන භාණ්ඩාගාර දෙපාර්තමේන්තු සමඟ සම්බන්ධීකරණය ඇතිව ක්‍රියාත්මක වන අතර, 2018 වර්ෂයේ නොවැම්බර් 04 දින දක්වා ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ සෘජු අධික්ෂණය යටතේ ක්‍රියාත්මක විය.

විදේශ සම්පත් දෙපාර්තමේන්තුව අධ්‍යක්ෂ ජනරාල් ප්‍රමුඛ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් සිව්දෙනෙකු යටතේ පාලනය වේ. අංශ ප්‍රධානීන් ලෙස කටයුතු කරන අධ්‍යක්ෂවරුන්ගේ අධීක්ෂණය යටතේ පහත සඳහන් අංශ හා ඒකක ක්‍රියාත්මක වේ.

- ආසියානු සංවර්ධන බැංකු අංශය
- පෙරදිග ආසියානු අංශය
- ලෝක බැංකුව හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල් අංශය
- චීන හා ආසියානු යටිතල පහසුකම් හා අයෝජන බැංකු අංශය
- මැදපෙරදිග හා දකුණු ආසියානු රටවල් අංශය
- දියුණු ආර්ථික අංශය
- එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන සහ තාක්ෂණික ආධාර අංශය
- ප්‍රාග්ධන වෙළඳපොළ හා ආයෝජන අංශය
- ණය කළමනාකරණ අංශය
- තොරතුරු, සම්පත් සම්බන්ධීකරණ සහ ප්‍රතිපත්ති පර්යේෂණ අධ්‍යයන අංශය
- පාලන අංශය
- ගිණුම් අංශය
- අංශ සම්බන්ධීකරණ හා කාර්යසාධන අධීක්ෂණ ඒකකය
- තොරතුරු තාක්ෂණ ඒකකය

# සමස්ත විග්‍රහය

ශ්‍රී ලංකාව, මැදි ආදායම් ලබන රටක් ලෙස සහ රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය වන “දැක්ම 2025" හි සඳහන් වන ආකාරයට තම නව සංවර්ධන අභියෝගයන් අවබෝධ කර ගෙන ඇති අතර ඒ අනුව, ආර්ථික වර්ධනය සහ සමාජ සුභසාධනය ඇති වන ආකාරයේ තත්ත්වයන් රට තුළ නිර්මාණය කිරීමට කැපවී සිටියි. මෙම පසුබිම තුළ කෙටි කාලයකින් සැලකිය යුතු ආර්ථික හා මූල්‍ය ප්‍රතිලාභ ලැබෙන අංශයන් කෙරෙහි පෞද්ගලික ආයෝජන දිරිගන්වමින්, වාර්ෂික රාජ්‍ය ආයෝජනය ඉදිරි වසර පහක කාලය තුළ දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 5-6 අතර මට්ටමක පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය පියවරයන් ගෙන ඇත.

රාජ්‍ය ඉතුරුම්-ආයෝජන පරතරය පියවා ගැනීම සඳහා දේශීය ඉතිරිකිරීම් කිසිසේත්ම ප්‍රමාණවත් නොවන බැවින්, රජයේ ආයෝජන කළඹ තුළ සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරනු ලබන විදේශ මූල්‍යයන අවස්ථා මත යැපීමට රජයට සිදුව ඇත. මෙම විදේශ මූල්‍යයනයන් ප්‍රධාන වශයෙන් ආයෝජනය කරනුයේ මධ්‍යකාලීනව හා දිගුකාලීනව සැලකිය යුතු ආර්ථික ප්‍රතිලාභ උත්පාදනය කිරීමට හැකිවෙතැයි අපේක්ෂා කරන සහ විදේශ ඍජු ආයෝජන, අපනයන හා සංචාරක ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීමට ඉවහල්වෙතැයි හඳුනාගනු ලබන මහා පරිමාණ සහ උපායමාර්ගික වශයෙන් වැදගත් යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා වේ. මේ අතර, දිගුකාලීන වශයෙන් බොහෝ ධනාත්මක ප්‍රතිඵල අත්කර දෙනු ලබන පරිදි අපගේ මානව සම්පතෙහි ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා සෞඛ්‍යය, අධ්‍යාපන හා නිපුණතා සංවර්ධන ව්‍යාපෘතීන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර ඇත.

ඒ අනුව, ඉහත කරුණු පිළිබඳව සලකා බලමින් අපගේ ණය උපායමාර්ගයන්ට අනුකූලව රටේ ණය තිරසාරීත්වය පවත්වා ගනිමින් රටට අවශ්‍ය විදේශ මූල්‍යයනය අවම පිරිවැයක් යටතේ ලබාගැනීමේ හැකියාව මෙම දෙපාර්තමේන්තුව මඟින් සොයා බලනු ලැබේ.

කෙසේ වෙතත්, ශ්‍රී ලංකාව ඉහළ මැදි ආදායම්ලාභී තත්ත්වයට ළඟාවීමත් සමඟ සහනදායී මූල්‍යයන ලබාගැනීමේ හැකියාව පසුගිය වසර කිහිපය තුළ සීඝ්‍රයෙන් අඩු වී ඇත. එබැවින් ණය ගැනීමේදී දැරීමට සිදුවන පිරිවැය දරා ගත හැකි මට්ටමක පවත්වාගෙන යාම සඳහා ද්විපාර්ශ්වික හා බහුපාර්ශ්වික සංවර්ධන පාර්ශ්වකරුවන්ගෙන් ලැබෙන සහනදායී නොවන, සහනදායී හා වාණිජ අරමුදල් සහ මූල්‍ය වෙළඳපොළ තුළින් සම්මිශ්‍ර වූ විදේශ මූල්‍යයන ලබාගැනීමට අවශ්‍ය පියවරයන් පුළුල් කර ඇත. මෙම කාර්යය සපුරා ගැනීම සඳහා, අදියර කිහිපයකින් සමන්විත මූල්‍යයන පහසුකම්, විවිධ විචල්‍ය/ස්ථාවර ණය පොළී අනුපාතයන් හා ණය පරිණත ව්‍යූහයන් සමඟ නම්‍යශීලී ණය මිලකිරීම් විකල්පයන් සහ ‘‘සංවර්ධන වැඩසටහන් ණය’’ වැනි නව මූල්‍යයන ආකෘතීන් කෙරෙහි රජයේ අවධානය යොමු වී ඇත. උපායමාර්ගික සංවර්ධන ව්‍යාපෘතීන් කිහිපයක් මූල්‍යයනය කිරීම සඳහා සාකච්ඡා කර එකඟවන ලද ණය අනුපාතයන් යටතේ දේශීය බැංකු මඟින් ණය ලබාගැනීමට අවශ්‍ය පියවර ද ගෙන ඇත.

අනෙක් අතට, රේඛීය අමාත්‍යාංශ විසින් අරමුදල් ලබාගැනීම සඳහා ඉදිරිපත් කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති යෝජනා සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇති අතර, එමඟින් විදේශ මූල්‍යයනය සඳහා ඇති ඉල්ලුම මෑත කාලයේදී සැලකිය යුතු ලෙස වැඩි වී ඇත. කෙසේ වෙතත්, විදේශ මූල්‍යයන ලබාගැනීමට අදාළව පවත්නාවූ නෛතික සහ ආයතනික සීමාවන්, මධ්‍යකාලීන හා දිගුකාලීන ණය තිරසාරත්වය පවත්වා ගත යුතුවීම හා වාර්ෂික රාජ්‍ය අයවැයෙහි ප්‍රතිපාදන සලසාදීමේ ධාරිතාව සීමාවීම ඇතුළු හේතු ගණනාවක් නිසා විදේශ ණය ගැනීම් වැඩිකිරීමට ශ්‍රී ලංකාවට අපහසු වී ඇත.

ඒ අනුව, ඉහත දක්වා ඇති කරුණු කෙරෙහි අවධානය යොමු කරමින්, විදේශ ව්‍යවහාර මුදලේ අගයන් උච්චාවචනය වීම හා ආර්ථිකය කෙරෙහි ඍණාත්මකව බලපෑ අනෙකුත් අන්තර්ජාතික තත්ත්වයන් වලට මුහුණ දෙමින්, නිවැරදි රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ක්‍රමෝපායන් අනුගමනය කරමින්, රටේ ණය ආපසු ගෙවීම නිසි පරිදි පවත්වා ගනිමින්, 2018 වසර තුළ රාජ්‍ය ආයෝජනය සඳහා අවශ්‍ය විදේශ මූල්‍යයනය ඒකරාශී කිරීමට රජය සමත්විය.

# විදේශ මූල්‍යයනය

## විදේශ මූල්‍යයන ඒකරාශී කිරීම

ශ්‍රී ලංකාවේ සංවර්ධනය සඳහා රජය වෙනුවෙන් විදේශ සම්පත් ඒකරාශී කිරීම විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ කාර්යය වේ. ඒ අනුව, රජය පසුගිය දශක හතරක පමණ කාලපරිච්ඡේදයක සිට විවිධ ද්විපාර්ශ්වීය හා බහුපාර්ශ්වීය සංවර්ධන පාර්ශ්වකරුවන් මෙන්ම, විදේශ වෙළඳපොළ අවස්ථාද උපයෝගී කරගනිමින් සහනදායි ණය, අපනයන ණය, තාක්ෂණික ආධාර, පූර්ණ ප්‍රදාන හා ප්‍රාග්ධන වෙළඳපොළ ණය ලෙස විදේශ මූල්‍යයන සම්පාදනය කරගෙන ඇත.

ශ්‍රී ලංකාවේ ණය කළඹ කාලානුරූපීව සැලකිය යුතු විවිධාංගීකරණයකට ලක්වී ඇත. රටේ ආර්ථික සංවර්ධනය හේතුවෙන් සිදුවන ඒකපුද්ගල ආදායමේ අනවරත ඉහළ යාමට සමගාමීව ඇතිවන ඉල්ලුමට සාපේක්ෂව එහි පරිමාව, සංයුතිය සහ වර්ගය කාලානුරූපීව වෙනස්වී ඇත. මාර්ග, අධිවේගී මාර්ග, පාලම්, විදුලිබල, වරාය, ගුවන් තොටුපල, ජල සම්පාදනය, වාරිමාර්ග හා දුම්රිය මාර්ග ආදී ආර්ථික යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති මූල්‍යයනයෙහිලා රජය විශාල ලෙස විදේශ අරමුදල් යොදවා ගන්නා ලදී. ශ්‍රී ලංකාව පහළ මැදි ආදායම් රටක් ලෙස වර්ගීකරණය වීමත් සමඟ, පූර්ණ ප්‍රදාන හා සහනදායි ණය සඳහා තිබූ ප්‍රවේශය අඩු වූ අතර, සහනදායි හා සහනදායි නොවන ණය වල මිශ්‍රණයක් හා විදේශ ප්‍රාග්ධන වෙළඳපොළ ණය, ණය කළඹෙහි ප්‍රමුඛ අංගයක් බවට පත්විය.

විදේශ සම්පත් ඒකරාශී කිරීමෙහිලා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, රාජ්‍ය ණය තිරසාරත්වය පවත්වා ගනිමින් රජයේ මධ්‍යකාලීන මූල්‍ය ප්‍රතිපත්ති රාමුව හා ණය උපායමාර්ග මඟින් සකස්කර ඇති ඉලක්ක සපුරා ගනිමින් රටේ පවතින නෛතික සීමාවන්ට යටත්ව සිය කාර්යය නිසියාකාරව සිදුකර ඇත.

2018 දී විදේශ සංවර්ධන පාර්ශ්වකරුවන්ගෙන් සහ ණය ලබාදෙන නියෝජිතායතන මඟින් සංවර්ධන ව්‍යාපෘති සහ වැඩසටහන් ආරම්භ කිරීම සඳහා ලැබුණු සමස්ත මූල්‍යයන එකඟතා ප්‍රමාණය ඇ.ඩො. මිලියන 1,241.59ක් වේ. එයින් ඇ.ඩො. මිලියන 1,108.67, ගිවිසුම් 28ක් හරහා ණය ලෙසද ඉතිරි ඇ.ඩො. මිලියන 132.92 ප්‍රදාන ආධාර ගිවිසුම් 11ක් හරහාද 2018 වර්ෂයේදී ලබාගෙන ඇත. 2018 වර්ෂයේදී ණය එකඟතා පහත පරිදි ප්‍රධාන ව්‍යාපෘති ඇරඹීම සඳහා ලබාදෙන ලදී. මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන සඳහා ඇ.ඩො. මිලියන 210ක් ආසියානු සංවර්ධන බැංකුවෙන්ද, පොදු අධ්‍යාපනය නවීකරණ ව්‍යාපෘතිය සඳහා ඇ.ඩො. මිලියන 100ක් ජාත්‍යන්තර සංවර්ධන සමායතනය හෙවත් ලෝක බැංකුව විසින් ද නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් අතිරේක අරමුදල් වශයෙන් ඇ.ඩො. මිලියන 100ක් ආසියානු සංවර්ධන බැංකුව විසින් ද, ශ්‍රී ලංකාවේ මධ්‍යම හා ඌව පළාත්වල කිලෝමීටර් 64.31ක් දිගැති මාර්ග පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම හා පාලම් 13ක් නැවත ඉදිකිරීම වෙනුවෙන් චීන රජය මඟින් ඇ.ඩො. මිලියන 84.98ක් ලබාදෙන ලදී.

මීට අමතරව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ජල සම්පාදන ව්‍යාපෘති සඳහා නෙදර්ලන්තයේ අයි.එන්.ජී බැංකුවෙන් හා ඔස්ට්‍රියාවේ යුනික්‍රෙඩිට් බැංකුවෙන් ලබාගත් ඇ.ඩො. මිලියන 160ක් සඳහා ශ්‍රී ලංකා රජය විසින් ස්වෛරීත්ව ඇපකර නිකුත් කර ඇත.

## විදේශ මූල්‍යයන එකඟතා 2018 - සංවර්ධන පාර්ශ්වකරු අනුව

| සංවර්ධන පාර්ශ්වකරු | මූල්‍යයන එකඟතා (ඇ.ඩො. මිලියන) | | |
|---|---|---|---|
| | ණය | ප්‍රදාන | එකතුව |
| **ද්විපාර්ශ්වීය** | **475.99** | **57.00** | **532.99** |
| ඕස්ට්‍රේලියාව | | 25.10 | 25.10 |
| ප්‍රංශය | 50.88 | | 50.88 |
| ජපානය | 95.78 | 2.30 | 98.08 |
| කොරියාව | 14.00 | 7.50 | 21.50 |
| සෞදි අරාබිය | 15.83 | | 15.83 |
| නෙදර්ලන්තය | 59.07 | | 59.07 |
| ඔස්ට්‍රියාව | 30.38 | | 30.38 |
| ඉන්දියාව | 45.27 | | 45.27 |
| ඇමරිකා එක්සත් ජනපදය | | 22.10 | 22.10 |
| චීනය | 164.78 | | 164.78 |
| **බහුපාර්ශ්වීය** | **632.68** | **75.92** | **708.60** |
| ආසියානු සංවර්ධන බැංකුව | 472.50 | 25.00 | 497.50 |
| ලෝක බැංකුව | 104.00 | | 104.00 |
| කෘෂිකාර්මික සංවර්ධන සඳහා වූ ජාත්‍යන්තර අරමුදල | 6.18 | | 6.18 |
| ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල | 50.00 | | 50.00 |
| එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන | | 50.92 | 50.92 |
| **එකතුව** | **1,108.67** | **132.92** | **1,241.59** |

*සටහන - මෙම වාර්තාව සඳහා යොදාගත් හුවමාරු අනුපාතික වනුයේ වසරේ අදාළ ගිවිසුම් අත්සන් කල දිනයේ විවිධ මුදල් වර්ග සඳහා පැවති විනිමය අනුපාතික වේ.*

## විදේශ මූල්‍යයන ප්‍රතිලබ්ධීන් හා උපයෝජනය

2018 දී සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන් තුළින් ණය සහ ප්‍රදාන වශයෙන් විදේශ සංවර්ධන පාර්ශ්වකරුවන් සහ ණය ලබාදෙන නියෝජිතායතන මඟින් ලැබුණු සමස්ත ප්‍රතිලබ්ධීන් ඇ.ඩො. මිලියන 1,389.98කි. මෙයින් ඇ.ඩො. මිලියන 1,368.34ක් ණය ලෙසද, ඉතිරි ඇ.ඩො. මිලියන 21.64ක් ප්‍රදාන ආධාර ලෙසද ලැබී ඇත. මෙම කාලය තුළ එක් එක් සංවර්ධන පාර්ශ්වකරුවන් විසින් සිදු කරනු ලැබූ ප්‍රතිලබ්ධීන් පහත වගුවෙන් පෙන්නුම් කරයි.

# විදේශ මූල්‍යයන උපයෝජන 2018

| සංවර්ධන පාර්ශ්වකරුවන් | උපයෝජන (ඇ.ඩො. මිලියන) | | |
|---|---|---|---|
| | ණය | ප්‍රදාන | එකතුව |
| **ද්විපාර්ශ්වීය** | **791.27** | **17.70** | **808.97** |
| ප්‍රංශය | 71.74 | 0.40 | 72.14 |
| චීනය | 371.19 | | 371.19 |
| ජර්මනිය | 2.53 | | 2.53 |
| ඉන්දියාව | 49.34 | | 49.34 |
| ජපානය | 156.76 | 14.40 | 171.16 |
| කොරියාව | 15.44 | | 15.44 |
| කුවේට් | 14.03 | | 14.03 |
| ස්පාඤ්ඤය | 4.84 | | 4.84 |
| සෞදි අරාබිය | 16.93 | | 16.93 |
| නෙදර්ලන්තය | 31.59 | | 31.59 |
| එක්සත් රාජධානිය | 15.83 | | 15.83 |
| ඕස්ට්‍රේලියාව | 1.01 | | 1.01 |
| ඇමරිකා එක්සත් ජනපදය | 9.42 | 2.90 | 12.32 |
| හංගේරියාව | 0.04 | | 0.04 |
| HSBC (ඩෙන්මාර්ක්) | 8.37 | | 8.37 |
| බෙල්ජියම | 0.29 | | 0.29 |
| ඔස්ට්‍රියාව | 21.92 | | 21.92 |
| **බහුපාර්ශ්වීය** | **577.07** | **3.94** | **581.01** |
| ආසියානු සංවර්ධන බැංකුව | 400.79 | 0.20 | 400.99 |
| ලෝක බැංකුව | 153.20 | | 153.20 |
| කෘෂිකාර්මික සංවර්ධන සඳහා වූ ජාත්‍යන්තර අරමුදල | 3.46 | | 3.46 |
| ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල | 19.62 | | 19.62 |
| එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන | | 3.74 | |
| **එකතුව** | **1,368.34** | **21.64** | **1,389.98** |

*සටහන - මෙම වාර්තාව සඳහා යොදාගත් හුවමාරු අනුපාතික වනුයේ වසරේ අදාළ ප්‍රතිලාභීන් සිදුවූ දිනයේ විවිධ මුදල් වර්ග සඳහා පැවති විනිමය අනුපාතික වේ.*

## පළ කරන ලද එකඟතාවයන් මත ඉදිරියට උපයෝජනය වීමට නියමිත ශේෂය සහ උපයෝජන අනුපාතිකය

2018 වර්ෂය අවසාන වන විට එකඟතාවය පළ කරන ලද එහෙත් තවමත් සංවර්ධන ව්‍යාපෘතීන්හි උපයෝජනය වීමට නියමිත විදේශ මූල්‍යයන ප්‍රමාණය ඇ.ඩො. මිලියන 8,139.8ක් විය. මෙයින් සියයට 61ක් ද්විපාර්ශ්වීය සංවර්ධන පාර්ශ්වකරුවන්ගෙන් උපයෝජනය වීමට නියමිත අතර, ඉතිරි සියයට 39ක් බහුපාර්ශ්වීය සංවර්ධන පාර්ශ්වකරුවන්ගෙන් උපයෝජනය වීමට නියමිතය.

### 2018 දෙසැම්බර් අවසන් වන විට සංවර්ධන පාර්ශ්වකරු අනුව එකඟතාවය පළකරන ලද එහෙත් උපයෝජනය වීමට නියමිත විදේශ මූල්‍යයන ප්‍රමාණය

| සංවර්ධන පාර්ශ්වකරු | මුදල (ඇ.ඩො. මිලියන) | % |
|---|---|---|
| **ද්විපාර්ශ්වීය** | **4,957.2** | **61.0** |
| ප්‍රංශය | 411.3 | 5.1 |
| ඕස්ට්‍රේලියාව | 0.1 | 0.0 |
| චීනය | 1,878.0 | 23.1 |
| නෙදර්ලන්තය | 96.5 | 1.2 |
| එක්සත් රාජධානිය | 5.1 | 0.1 |
| ඔස්ට්‍රියාව | 29.6 | 0.4 |
| ඉන්දියාව | 524.3 | 6.4 |
| ජපානය | 1,565.0 | 19.2 |
| කුවේට් | 77.9 | 1.0 |
| පකිස්තානය | 14.9 | 0.2 |
| කොරියාව | 83.0 | 1.0 |
| රුසියාව | 134.7 | 1.7 |
| ජර්මනිය | 35.5 | 0.4 |
| HSBC (ඩෙන්මාර්ක්) | 11.1 | 0.1 |
| බෙල්ජියම | 0.1 | 0.0 |
| ස්පාඤ්ඤය | 24.4 | 0.3 |
| HSBC (හොංකොං) | 65.7 | 0.8 |
| **බහුපාර්ශ්වීය** | **3,182.5** | **39.0** |
| ලෝක බැංකුව | 1,092.8 | 13.4 |
| කෘෂිකාර්මික සංවර්ධන සඳහා වූ ජාත්‍යන්තර අරමුදල | 58.9 | 0.7 |
| ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල | **156.8** | **1.9** |
| සෞදි අරමුදල | 159.2 | 2.0 |
| යුරෝපීය ආයෝජන බැංකුව | 57.2 | 0.7 |
| ආසියානු සංවර්ධන බැංකුව | 1,657.6 | 20.4 |
| **එකතුව** | **8,139.8** | **100.0** |


උපයෝජනය වීමට නියමිත ශේෂයෙන් සියයට 26.18ක් මාර්ග හා පාලම් අංශය සඳහාත් සියයට 22.38ක් ජල සම්පාදන හා සනීපාරක්ෂාව සඳහාත් උපයෝජනය වීමට නියමිතය.

### 2018 දෙසැම්බර් අග වන විට පැවති එකඟතා පළකල එහෙත් උපයෝජනය වීමට නියමිත විදේශ මූල්‍යයන උපයෝජනයන් - ආර්ථිකයේ විවිධ අංශ අනුව

| අංශය | මුදල (ඇ.ඩො.මිලියන) | % |
|---|---|---|
| **කෘෂිකර්ම** | **599.60** | **7.37** |
| කෘෂිකර්මය | 144.00 | 1.77 |
| පශු සම්පත් සංවර්ධනය | 56.40 | 0.69 |
| ඉඩම් හා වාරිමාර්ග | 399.20 | 4.90 |
| **ආර්ථික යටිතල පහසුකම්** | **5,370.50** | **65.98** |
| මහාමාර්ග සහ පාලම් | 2,130.70 | 26.18 |
| වරාය හා නාවික | 186.30 | 2.29 |
| විදුලිය හා බලශක්ති | 532.50 | 6.54 |
| ප්‍රවාහනය | 699.50 | 8.59 |
| ජල සම්පාදන හා සනීපාරක්ෂාව | 1,821.50 | 22.38 |
| **සමාජ යටිතල පහසුකම්** | **1,031.30** | **12.67** |
| අධ්‍යාපනය හා පුහුණු | 16.30 | 0.20 |
| කම්කරු හා වෘත්තීය පුහුණු | 64.20 | 0.79 |
| සෞඛ්‍යය හා සමාජ සුභසාධනය | 194.30 | 2.39 |
| නිවාස හා නාගරික සංවර්ධනය | 293.20 | 3.60 |
| ආපදා කළමනාකරණය | 463.30 | 5.69 |
| **ග්‍රාමීය සංවර්ධනය** | **133.20** | **1.64** |
| **පරිසරය** | **293.40** | **3.60** |
| **මූල්‍ය** | **290.00** | **3.56** |
| **වෙනත්** | **421.80** | **5.18** |
| **එකතුව** | **8,139.80** | **100.00** |

## විදේශ ණය ස්කන්ධය සහ විදේශ ණය සේවාකරණය

2018 වර්ෂය අවසාන වන විට රජයේ විදේශ ණය ස්කන්ධය ඇ.ඩො. බිලියන 32.54කි. 2018 දී සමස්ත ණය සේවාකරණ ගාස්තුව ඇ.ඩො. මිලියන 2,920.0ක් විය. ඉන් ඇ.ඩො. මිලියන 1,805.7ක් මූලික ණය වාරික ගෙවීම් සඳහාද ඉතිරි ඇ.ඩො. මිලියන 1,114.3ක් පොළී ගෙවීම සඳහාද විය. වර්ෂ 2015-2018 දක්වා ණය සේවාකරණ ගාස්තු සහ 2026 වර්ෂය දක්වා ඇස්තමේන්තු කරන ලද ණය සේවාකරණ ගාස්තු මෙම ප්‍රස්තාරයෙන් පෙන්නුම් කෙරේ.





*සටහන :*

*1. සංවර්ධන ව්‍යාපෘති සඳහා ලබාගත් ණය, ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර, විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම් මෙහි ඇතුලත් වන අතර, හම්බන්තොට වරාය සංවර්ධනය සඳහා ලබාගත් ණය හැර සෙසු අර්ධ රාජ්‍ය ආයතන විසින් ලබාගත් විදේශ ණය අන්තර්ගත නොවේ.*

*2. ණය සේවාකරණය = ණය වාරික ගෙවීම + ණය පොලී ගෙවීම.*
*හම්බන්තොට වරාය සංවර්ධනය සඳහා ලබාගත් ණය හැර සෙසු අර්ධ රාජ්‍ය ආයතන විසින් ලබාගත් විදේශ ණය අන්තර්ගත නොවේ*

## විදේශ ණය කල්පිරීමේ ව්‍යුහය

සංවර්ධන ව්‍යාපෘති මූල්‍යයනය සඳහා ඇ.ඩො. බිලියන 32.54ක් වූ සමස්ත ණය ස්කන්ධය ආසන්න වශයෙන් සියයට 22ක් පමණ ඉදිරි වසර 5 කාලය තුළ කල්පිරීම සිදුවේ. ඉදිරි වසර 5-10 කාලයේදී මුළු ණය ස්කන්ධයෙන් සියයට 32ක් කල්පිරීමට නියමිත අතර ඉතිරිය වන සියයට 46 වසර 10 කට පසු කල්පිරීම සිදුවේ.



# එක් එක් අංශයන්හි කාර්යසාධනය

# ආසියානු සංවර්ධන බැංකු අංශය

ආසියානු සංවර්ධන බැංකු අංශය විසින්, ආසියානු සංවර්ධන බැංකුවෙන් සංවර්ධන ආධාර ලෙස ලැබෙන ව්‍යාපෘති/ණය සුවිශේෂී සංඛ්‍යාවකින් සමන්විත, විවිධාංගීකරණය වූ සුවිසල් ආයෝජන කළඹ උපයෝජනය කිරීමට අදාළ වූ සියලු මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබයි. ආසියානු සංවර්ධන බැංකුවේ ශ්‍රී ලංකාව සඳහා වූ දේශීය සහයෝගීතා උපායමාර්ගයන් පිළියෙළ කිරීම, දේශීය ක්‍රියාකාරකම් ව්‍යාපාරික සැලැස්ම සකස් කිරීම, ණය සම්මුති සාකච්ඡා පැවැත්වීම, ආසියානු සංවර්ධන බැංකුවෙන් ලැබෙන මූල්‍යමය සහයෝගීතාවය ඵලදායී ලෙස භාවිතා කිරීම සඳහා පහසුකම් සැපයීම යනාදී ක්‍රියාකාරකම් මීට ඇතුළත් වේ. ආසියානු සංවර්ධන බැංකුවෙන් ලැබෙන සහයෝගීතාවය ව්‍යාපෘති සහ ප්‍රතිපත්ති පදනම් වූ ණය, ප්‍රදාන, කොටස් ආයෝජන, ප්‍රතිපත්ති සාකච්ඡා සහ තාක්ෂණික සහයෝගීතා ආකාරයෙන් උපයෝජනය කරනු ලැබේ. ඒ අනුව විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ ආසියානු සංවර්ධන බැංකු අංශය, ආසියානු සංවර්ධන බැංකුවෙන් ලැබෙන අරමුදල් උපයෝජනය කිරීමට අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීමේ ක්‍රියාව තහවුරු කිරීම සිදුකරන අතර, ආසියානු සංවර්ධන බැංකුව සහ අනෙකුත් පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධීකරණය සිදුකරනු ලබයි.


ආසියානු සංවර්ධන බැංකුවට සම්බන්ධිත දකුණු ආසියා උප කලාපීය ආර්ථික සහයෝගීතාවය (SASEC) සහ ආසියා පැසිපික් ආපදා අවදානම් අරමුදල ආදී අනෙකුත් මූලාශ්‍රවලින් ලැබෙන සම්පත් සුදුසු පරිදි වැඩිකර ගැනීම සඳහා ඒවායෙහි නියමයන් හා කොන්දේසි ඇගයීමද ආසියානු සංවර්ධන බැංකුවේ වගකීමක් වේ. මීට අමතරව මෙම අංශය ආසියානු සංවර්ධන බැංකුවේ ස්වෛරී නොවන ණය පහසුකම් මෙහෙයුම් කටයුතු සඳහාද පහසුකම් සලසයි.

### ආසියානු සංවර්ධන බැංකුව ශ්‍රී ලංකා සංවර්ධන සහයෝගිතාකරු ලෙස කටයුතු කරයි

ආසියානු සංවර්ධන බැංකුව විසින් 1966 සිට ශ්‍රී ලංකාව සමඟ සමීපව කටයුතු කර ඇති අතර, 2018 දෙසැම්බර් 31 වන දිනට ඇ.ඩො. බිලියන 9.7 ක ණය, ප්‍රදාන සහ තාක්ෂණික ආධාර ලබාදී තිබේ. ආර්ථික විවිධාංගීකරණය හා ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා ප්‍රමුඛතා ආයෝජන ලෙස ප්‍රවාහන, බලශක්ති හා නාගරික අංශවල යටිතල පහසුකම් ගොඩනැංවීමත්, ආර්ථික කවුළුවක් ගොඩනැංවීම සහ මානව ප්‍රාග්ධනය වැඩිදියුණු කිරීම සඳහා යොමුකෙරේ. තවද ඒකාබද්ධතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රමුඛ ආයෝජනයන් වනුයේ කෘෂිකාර්මික යටිතල පහසුකම් සහ වාණිජකරණය ශක්තිමත් කිරීම, ග්‍රාමීය සම්බන්ධතා වැඩිදියුණු කිරීම, රාජ්‍ය සේවා සැපයීම වැඩිදියුණු කිරීම සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා මූල්‍ය පහසුකම් පුළුල් කිරීමයි.


## 2018 වර්ෂයේ එකඟතා සහ උපයෝජනයන්

ආසියානු සංවර්ධන බැංකුව විසින් 2018 වර්ෂය තුළ සිදුකරන ලද සමස්ත එකඟතාවය ඇ.ඩො. මිලියන 497.5ක් වන අතර, ඉන් ඇ.ඩො. මිලියන 472.5ක මුදලක් ණය ලෙසත්, ඇ.ඩො. මිලියන 25ක් ප්‍රදානයන් ලෙසත් වේ. මෙම සමස්ත එකඟතාවයෙන් වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අංශය සඳහා ඇ.ඩො. මිලියන 210ක්, අධ්‍යාපන නිපුණතා අංශය සඳහා ඇ.ඩො. මිලියන 103ක්, මූල්‍ය අංශය සඳහා ඇ.ඩො. මිලියන 84.5ක් හා සෞඛ්‍යය, විදුලිබල හා බලශක්ති යන අංශ සඳහා ඇ.ඩො. මිලියන 50ක් බැගින් ලබා දී තිබේ.





2018 වර්ෂයේදී සමස්ත උපයෝජනය ඇ.ඩො මිලියන 497.5ක් වන අතර, එය ආසියානු සංවර්ධන බැංකුව දැනට ක්‍රියාත්මක වන ණය ගිවිසුම් සඳහා ලබා දී ඇත.

2018 වර්ෂයේ උපයෝජනයන්හි ආංශික සංයුතිය (ඇ.ඩො. මිලියන)




## 2018 ආසියානු සංවර්ධන බැංකු ණය කළඹ

වත්මන් ආසියානු සංවර්ධන බැංකුවේ ආයෝජනය කළඹ ව්‍යාපෘති 29ක්, ප්‍රදාන 05ක් සහ තාක්ෂණික ආධාර 22කින් සමන්විත වන අතර, එය විදුලිබල හා බලශක්ති, නාගරික සංවර්ධන, ජල සම්පාදන හා සනීපාරක්ෂක කටයුතු, අධ්‍යාපන, නිපුණතා, මානව සම්පත් සංවර්ධනය, වාරිමාර්ග, පාරිසරික හා කෘෂිකාර්මික, මාර්ග හා ප්‍රවාහන යන අංශයන් ඇතුලුව අංශ 06ක් පුරා ව්‍යාප්තව ඇත. 2018 දෙසැම්බර් 31 වන විට ආසියානු සංවර්ධන බැංකුවේ ආයෝජන කලඹේ ආංශික ව්‍යාප්තිය පහත දැක්වේ.




## 2018 දී ක්‍රියාත්මක කරන ප්‍රධාන ව්‍යාපෘති

2018 දී ආසියානු සංවර්ධන බැංකුවේ සහයෝගීතාවයෙන් ක්‍රියාත්මක වන ප්‍රධාන ව්‍යාපෘතින් පහත වගුවේ දැක්වේ.

| වැඩසටහන / ව්‍යාපෘතිය | මුදල (ඇ.ඩො. මිලියන) |
|---|---|
| **මාර්ග සහ ප්‍රවාහන අංශ** | |
| දක්ෂිණ මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය | 75.00 |
| ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන - පළමු අදියර | 90.00 |
| ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන - දෙවන අදියර | 107.00 |
| ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන - තෙවන අදියර | 200.00 |
| දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන - පළමු අදියර | 150.00 |
| ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන - සිව්වන අදියර | 150.00 |
| උතුරු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය - අතිරේක මූල්‍යයනය | 95.00 |
| ප්‍රවාහන ව්‍යාපෘති සඳහා පහසුකම් සැපයීමේ ව්‍යාපෘතිය | 24.48 |
| ගොඩනැගිලි මත සවිකරන සූර්ය බලශක්ති උත්පාදනය කිරීමේ ව්‍යාපෘතිය | 50.00 |
| කාන්තා ව්‍යවසායකත්ව මූල්‍යාධාර ව්‍යාපෘතිය (We - Fi) | 9.50 |
| **විදුලිබල හා බලශක්ති** | |
| පිවිතුරු බලශක්ති හා ජාල කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 128.00 |
| හරිත බලශක්ති සංවර්ධන හා බලශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - පළමු අදියර | 150.00 |
| හරිත බලශක්ති සංවර්ධන හා බලශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - දෙවන අදියර | 150.00 |
| විදුලිය සැපයීමේ විශ්වාසනීයත්වය වැඩිදියුණු කිරීමට සහායවීමේ ව්‍යාපෘතිය | 115.00 |
| සුළං විදුලිබල සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | 200.00 |
| **නාගරික සංවර්ධනය, ජලය සහ සනීපාරක්ෂාව** | |
| මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය | 100.00 |
| යාපනය සහ කිලිනොච්චිය ජල සම්පාදන ව්‍යාපෘතිය | 90.00 |
| වියළි කලාපය නාගරික ජල හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය - අතිරේක මූල්‍යයනය | 40.00 |
| පුර නැගුම - පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - අතිරේක මූල්‍යයනය | 60.00 |

| වැඩසටහන / ව්‍යාපෘතිය | මුදල (ඇ.ඩො. මිලියන) |
|---|---|
| මහ කොළඹ ප්‍රදේශයේ ජල සම්පාදනය ඉහළ නැංවීම සහ අපජල කළමනාකරණය වැඩිදියුණු කිරීමේ වැඩසටහන - පළමු අදියර | 84.00 |
| මහ කොළඹ ප්‍රදේශයේ ජල සම්පාදනය ඉහළ නැංවීම සහ අපජල කළමනාකරණය වැඩිදියුණු කිරීමේ වැඩසටහන - දෙවන අදියර | 88.00 |
| මහ කොළඹ ප්‍රදේශයේ ජල සම්පාදනය ඉහළ නැංවීම සහ අපජල කළමනාකරණය වැඩිදියුණු කිරීමේ වැඩසටහන - තෙවන අදියර | 128.00 |
| යාපනය සහ කිලිනොච්චිය ජල සම්පාදන ව්‍යාපෘතිය - අතිරේක මූල්‍යයනය | 120.00 |
| **මුදල්** | |
| මූල්‍ය කළමනාකරණය කාර්යක්ෂම කිරීමේ ව්‍යාපෘතිය | 30.80 |
| ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධන වැඩසටහන | 250.00 |
| කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය මාලා ව්‍යාපෘතිය | 100.00 |
| කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය මාලා ව්‍යාපෘතිය - අතිරේක මූල්‍යයනය | 75.00 |
| **අධ්‍යාපනය / නිපුණතා / මානව සම්පත් සංවර්ධනය** | |
| අධ්‍යාපන ආංශීය සංවර්ධන වැඩසටහන | 200.00 |
| නිපුණතා අංශය වැඩිදියුණු කිරීමේ වැඩසටහන | 100.00 |
| නිපුණතා අංශය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - අතිරේක මූල්‍යයනය | 103.00 |
| **වාරිමාර්ග, පරිසර හා කෘෂිකාර්මික කටයුතු** | |
| මහවැලි ජල සුරැකුම් ආයෝජන වැඩසටහන - පළමු අදියර | 150.00 |
| උතුරු පළාත් තිරසාර ධීවර සංවර්ධන ව්‍යාපෘතිය | 1.30 |
| මහවැලි ජල සුරැකුම් ආයෝජන වැඩසටහන - දෙවන අදියර | 210.00 |
| **එකතුව** | **3,624.08** |

## 2018 වර්ෂයේදී සාකච්ඡා සම්මුති පවත්වන ලද සහ බලාත්මක කරන ලද ණය පහසුකම්

ඇ.ඩො. මිලියන 841.5ක් වටිනා ණය මුදලක්, ණය 07ක් සහ ප්‍රදාන 03ක් ලෙස ලබා දීම සඳහා ණය සම්මුති සාකච්ඡා පවත්වන ලද අතර, 2018 දී, ණය 08ක් සහ ප්‍රදාන 02ක් සඳහා ඇ.ඩො. මිලියන 992.5ක් බලාත්මක බවට ප්‍රකාශ කරන ලදී.

| ව්‍යාපෘතිය | ණය / ප්‍රදාන | මුදල (ඇ.ඩො. මිලියන) |
|---|---|---|
| **බලාත්මක කරන ලද ණය ගිවිසුම්** | | |
| නිපුණතා ආංශීය වැඩිදියුණු කිරීමේ වැඩසටහන - අතිරේක මූල්‍යයනය | ණය | 100.0 |
| නිපුණතා ආංශීය වැඩිදියුණු කිරීමේ වැඩසටහන - අතිරේක මූල්‍යයනය | ප්‍රදාන | 3.0 |
| යාපනය සහ කිලිනොච්චිය ජල සම්පාදන ව්‍යාපෘතිය - අතිරේක මූල්‍යයනය | ණය | 120.0 |
| ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධන වැඩසටහන | ණය | 125.0 |
| දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන | ණය | 150.0 |
| කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය මාලා ව්‍යාපෘතිය - අතිරේක මූල්‍යයනය | ණය | 75.0 |
| ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන - සිව්වන අදියර | ණය | 150.0 |
| කාන්තා ව්‍යවසායකත්ව මූල්‍යාධාර ව්‍යාපෘතිය (We – Fi) | ප්‍රදාන | 9.5 |
| ගොඩනැගිලි මත සවිකරන සූර්ය බලශක්ති උත්පාදනය කිරීමේ ව්‍යාපෘතිය | ණය | 50.0 |
| මහවැලි ජල සුරැකුම් ආයෝජන වැඩසටහන - දෙවන අදියර | ණය | 210.0 |
| **එකතුව** | | **992.5** |

## 2019 දී ණය සැකසුම

වර්ෂ 2019 දී ආසියානු සංවර්ධන බැංකුව වෙතින් ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතින ප්‍රධාන ව්‍යාපෘති පහත වගුවේ දැක්වේ.

| ව්‍යාපෘතිය | මුදල (ඇ.ඩො. මිලියන) |
|---|---|
| නාගරික ව්‍යාපෘති සූදානම් කිරීමේ පහසුකම (UPPF-TA) | 10 |
| විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය (STHRDP) | 145 |
| කුළුණු මතින් දිවෙන වරාය පිවිසුම් අධිවේගී මාර්ග ව්‍යාපෘතිය (SASEC - PAEH) | 300 |
| දුම්රිය කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 160 |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය | 50 |
| දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන - පළමු අදියර | 150 |
| **එකතුව** | **815** |

## වර්ෂ 2018 විශේෂ සිද්ධීන්

- මාර්තු - ආසියානු සංවර්ධන බැංකුව සමඟ පවත්වන වාර්ෂික උපදේශන සැසිය
- මැයි - ආසියානු සංවර්ධන බැංකුවේ 51 වන වාර්ෂික රැස්වීම පිලිපීනයේ මැනිලා හි පැවැත්විණි
- ඉහළ පෙළේ උපදේශන කටයුතු සඳහා පැමිණි දූත කණ්ඩායම
    - ජනවාරි - ආසියානු සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ පැමිණීම කෂාත්‍රපති ක්ෂිවාජි මහතා - විධායක අධ්‍යක්ෂ, හලේමට හයේස් ෆිවර් මහතා - විධායක අධ්‍යක්ෂ, මුහම්මඩ් සමී සයිඩ් මහතා - විධායක අධ්‍යක්ෂ, ඉං චෑංග් සොංග් මහතා - විධායක අධ්‍යක්ෂ, මාරියෝ ගයිස්පි දී මායියෝ - විකල්ප විධායක අධ්‍යක්ෂ, ජොහෑන්ස් ඉම්මෑනුවල් මහතා - විකල්ප විධායක අධ්‍යක්ෂ, මෂාසි ටැනබ් මහතා - විකල්ප විධායක අධ්‍යක්ෂ
    - මාර්තු - ඉන්ග්‍රිඩ් වෑන් වීස් මහත්මිය - උප සභාපති (මූල්‍ය සහ අවදානම් කළමනාකරණ)
    - අප්‍රේල් - හුන් කිම් මහතා - අධ්‍යක්ෂ ජනරාල් දකුණු ආසියා කලාපීය දෙපාර්තමේන්තුව
    - අගෝස්තු - වෙන්කායී ෂැංග් මහතා - උප සභාපති (මෙහෙයුම් 1)

ඉහත ඉහළ පෙළේ උපදේශන දූත මණ්ඩලද ඇතුළත්ව ආසියානු සංවර්ධන බැංකු දූත මණ්ඩල 150ක්, 2018 වර්ෂයේදී ශ්‍රී ලංකාවට පැමිණ ඇත.

# චීන හා ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකු අංශය

මහජන චීන සමූහාණ්ඩුවේ ණය ලබාදෙන ආයතන හරහා මෙරට ප්‍රමුඛ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විදේශීය සම්පත් ඒකරාශී කිරීම චීන හා ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකු අංශයේ ප්‍රධාන කාර්යභාර්ය වේ. සඵලදායී සම්බන්ධීකරණයක් තුළින් සංවර්ධන ව්‍යාපෘතිවල සුමට ක්‍රියාකාරීත්වය තහවුරු කිරීම මෙම අංශයේ ඉටුවන සුවිශේෂි කාර්යභාර්යකි.

චීන රජය මෙරට සමාජීය හා ආර්ථික සංවර්ධනය උදෙසා ඉතා සුවිශේෂි කාර්යභාර්යක් ඉටුකර ඇති අතර, ජාතිකමය වශයෙන් වැදගත් මහා පරිමාණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට දායක වෙමින් පසුගිය දශක කිහිපය තුළදී චීනය මෙරට ප්‍රධාන සංවර්ධන පාර්ශ්වකරුවෙක් බවට පත්ව ඇත. චීන රජයෙන් ලබා ගත් ණය අරමුදල් වලින් වැඩි ප්‍රතිශතයක් ආයෝජනය කර ඇත්තේ අධිවේගී මාර්ග හා ප්‍රවාහන, වරාය හා ගුවන්තොටුපල, ජල සැපයුම් හා සනීපාරක්ෂක කටයුතු සහ විදුලිබල හා බලශක්ති ක්ෂේත්‍රයන්හිය. සහනදායී මූල්‍යයන පහසුකම්වල ලක්ෂණයන්ගෙන් සමන්විත ස්ථාවර මූල්‍යමය කොන්දේසි සහිත වීම, දීර්ඝ පරිණත කාලයකින් යුක්ත වීම මෙන්ම ඉහළ ආයෝජන මුදලකින් සමන්විත මහා පරිමාණ ව්‍යාපෘති සඳහා අවශ්‍ය මූල්‍යමය පහසුකම් ලබාදීම චීන රජයෙන් ලබාදෙන මූල්‍ය පහසුකම් වල දක්නට ලැබෙන විශේෂ වාසි සහගත තත්ත්වයන්ය.

චීනයේ අපනයන ආනයන බැංකුව, චීන සංවර්ධන බැංකුව, චීනයේ කර්මාන්ත හා වාණිජ බැංකුව යනාදී චීන රජය සතු මූල්‍ය ආයතන හරහා ණය, ආධාර හා පොළී රහිත ණය ලෙස ආකාර තුනකින් චීන රජය මෙරටට අවශ්‍ය සංවර්ධන සහයෝගීතාවය ලබා දේ. ආධාර හෝ පොළී රහිත ණය මුදල් චීනයේ වෙළඳ හා ආර්ථික සහයෝගීතාවය පිළිබඳ අමාත්‍යාංශය හරහා සෘජුවම ලබා දේ. ජාත්‍යන්තර බැංකුවක් ලෙස හොංකොං සහ ෂැන්හයි බෑන්කින් කෝපරේෂන් ලිමිටඩ් ද (එච්.එස්.බී.සී), චීන ජාතික කොන්ත්‍රාත්කරුවන් විසින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘති සඳහා අවශ්‍ය මූල්‍යමය පහසුකම් ලබා දේ.

## එකඟතා

2008 සිට 2018 දක්වා චීනයේ සංවර්ධන පාර්ශ්වකරුවන් විසින් ඇ.ඩො මිලියන 8,319ක් අරමුදල් ලබා දීමට එකඟතාවය පලකර ඇති අතර, ඉන් ඇ.ඩො. මිලියන 1,707ක් ලබා දීමට එකඟතාවය පලකර ඇත්තේ 2018 වසරෙන් පසුවය. ශ්‍රී ලංකාවේ මධ්‍යම සහ ඌව පළාත්වල කි.මී. 64.31ක් දිගැති මාර්ග පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම හා පාලම් 13ක් නැවත ඉදිකිරීමේ ව්‍යාපෘතියේ සහ උඩරට දුම්රිය මාර්ගයේ මෙහෙයුම් කටයුතු සඳහා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව වෙත ඩීසල් බලවේග කට්ටල 09ක් ප්‍රසම්පාදනය, මිලදී ගැනීම හා බෙදා හැරීමේ ව්‍යාපෘතියට අදාළ ණය ගිවිසුම් දෙක 2018 වසර තුළදී අත්සන් කරන ලදී.

### උඩරට දුම්රිය මාර්ගයේ මෙහෙයුම් කටයුතු සඳහා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව වෙත ඩීසල් බලවේග කට්ටල 09ක් ප්‍රසම්පාදනය, මිලදී ගැනීම හා බෙදා හැරීමේ ව්‍යාපෘතිය


උඩරට දුම්රිය මාර්ගයේ මෙහෙයුම් කටයුතු සඳහා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව වෙත ඩීසල් බලවේග කට්ටල 09ක් ප්‍රසම්පාදනය, මිලදී ගැනීම හා බෙදා හැරීමේ ව්‍යාපෘතිය මූල්‍යයනය කිරීම සඳහා ඇ.ඩො. මිලියන 80ක ණය මුදලක් ලබා ගැනීම සඳහා හොංකොං සහ ෂැන්හයි බෑන්කින් කෝපරේෂන් ලිමිටඩ් සමඟ රජය විසින් ණය ගිවිසුමකට එළඹෙන ලදී. ඒ අනුව, මෙම නව ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකා දුම්රිය සේවයේ උඩරට දුම්රිය මාර්ග සඳහා නව දුම්රිය එන්ජින් එක් කිරීම මඟින් දුම්රිය සේවාවන්හි කාර්යසාධනය ඉහළ නැංවීමට අපේක්ෂිත අතර, මෙහි පළමු ඩීසල් බලවේග කට්ටලය 2019 වසර අවසානයේ ශ්‍රී ලංකාවට නැව්ගත කරනු ඇත. පළමු ඩීසල් බලවේග කට්ටල ඒකකය ශ්‍රී ලංකාව තුළ අවම වශයෙන් මාස තුනක කාලයක් ක්‍රියාත්මක කරනු ඇති අතර, පළමු පිරික්සුම් ධාවනයෙන් අනතුරුව, එම පිරික්සුම් ධාවනය අතරතුර හඳුනාගනු ලබන අවශ්‍ය වෙනස්කම් සිදුකිරීමෙන් පසුව ඉතිරි ඩීසල් බලවේග කට්ටල නැව්ගත කරනු ඇත.

### ශ්‍රී ලංකාවේ මධ්‍යම සහ ඌව පළාත්වල කි.මී. 64.31ක් දිගැති මාර්ග පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම හා පාලම් 13ක් නැවත ඉදිකිරීමේ ව්‍යාපෘතිය

සේවය සලසා දිය හැකි උපරිම තත්ත්වයට පත්ව ඉතා අබලන් තත්ත්වයේ පවතින පාලම් හා මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ රජයේ ප්‍රමුඛතාවය සැලකිල්ලට ගනිමින් චීනයේ අපනයන ආනයන බැංකුවේ හුනාන් ශාඛාව ඇ.ඩො. මිලියන 85ක (මුළු කොන්ත්‍රාත් මුදලින් සියයට 85ක්) ණය මුදලක් ලබා දෙමින්, මධ්‍යම සහ ඌව පළාත්වල කි.මී. 64.31ක් දිගැති මාර්ග පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම හා පාලම් 13ක් නැවත ඉදිකිරීමේ ව්‍යාපෘතියට මූල්‍ය පහසුකම් ලබා දීමට එකඟතාවය පළකරන ලදී.

## උපයෝජනය

පසුගිය වසර 10 තුළ චීන රජය විසින් මූල්‍යයන පහසුකම් ලබා දුන් ව්‍යාපෘති සඳහා ඇ.ඩො මිලියන 6,173ක් උපයෝජනය කර ඇත. චීනයේ අපනයන ආනයන බැංකුව හා චීන සංවර්ධන බැංකුව මඟින් 2018 වසරේදී පමණක් සිදු කළ උපයෝජනය ඇ.ඩො මිලියන 371කි. (රජය සතු ව්‍යාපාරවල උපයෝජනයන්ද ඇතුලත් වේ).



## චීන අපනයන ආනයන බැංකුවෙන් ලබාගනු ලබන සංවර්ධන ආධාර

රටට සැලකිය යුතු ආර්ථික ප්‍රතිලාභ අත්කර දෙනු ලබන යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකා රජය චීන අපනයන ආනයන බැංකුවෙන් ලබාදෙන ණය ආධාර වරණීය ගැණුම්කරුගේ ණය, චීන රජයේ සහනදායී ණය හා ගැණුම්කරුගේ ණය වශයෙන් ලබා ගනියි. ජාතික වශයෙන් වැදගත්, මාතර සිට හම්බන්තොට දක්වා වන දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝකිරීමේ ව්‍යාපෘතිය, කඩවත සිට කෙරවලපිටිය දක්වා වන පිටත වටරවුම් අධිවේගී මාර්ගය ඉදිකිරීම් අදියර III ව්‍යාපෘතිය වැනි විශාල ප්‍රමාණයේ ව්‍යාපෘතීන් චීන අපනයන ආනයන බැංකුවේ මූල්‍යමය පහසුකම් යටතේ 2018 වසරේදී වර්ධනාත්මකව ක්‍රියාත්මක කරන ලද අතර, රටේ පවතින අධිවේගී මාර්ග ජාලයෙහි අන්තර් සම්බන්ධතාවය වැඩිදියුණු කරමින් එම ව්‍යාපෘතීන්හි අවසන් අදියර කරා ලඟා වී ඇත. දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතියේ අදියරයන් හතරෙහිම ව්‍යාපෘති ක්‍රියාකාරකම් සියයට 80කට වඩා වැඩි ප්‍රතිශතයකින් සම්පූර්ණ කර ඇති අතර, සම්පූර්ණ ව්‍යාපෘතිය 2019 වසරේදී අවසන් කිරීමට නියමිතය. පිටත වටරවුම් අධිවේගී මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘතිය අදියර III හි සමස්ත ප්‍රගතිය සියයට 85ක් වන අතර, මෙම ව්‍යාපෘතිය 2019 ජූනි මසදී නිම කිරීමට අපේක්ෂිතය.

එයට අමතරව, චීන අපනයන ආනයන බැංකු ආධාර යටතේ කුරුණෑගල ප්‍රදේශයේ වර්තමාන හා අනාගත පානීය ජල අවශ්‍යතාවය තහවුරු කරමින් හා විධිමත් මළාපවහන හා අපජල පද්ධතියක් පිහිටුවමින් විසල් කුරුණෑගල ජල සම්පාදන හා මළාපවහන ව්‍යාපෘතියෙහි ඉදිකිරීම් කටයුතු 2018 වසරේදී නිම කරන ලදී. මාතර කතරගම දුම්රිය මාර්ග ව්‍යාපෘතියේ, මාතර සිට බෙලිඅත්ත කොටස සියයට 80කට වඩා වැඩි භෞතික ප්‍රගතියක් වාර්තා කරමින් එහි ක්‍රියාත්මක කිරීම් අවසන් අදියරට පැමිණ තිබේ. එහි දුම්රිය මෙහෙයුම් කටයුතු 2019 මැද භාගයේදී ආරම්භ කිරීමට නියමිතය.

වැඩිදුරටත්, රටේ යටිතල පහසුකම් ව්‍යාපෘති වැඩි ප්‍රමාණයක් මූල්‍යයනය සඳහා තවදුරටත් සහයෝගීතාවය වැඩි කරමින් චීන අපනයන ආනයන බැංකුවේ හුනාන් ශාඛාව වෙතින් මධ්‍යම සහ ඌව පළාත්වල කි.මී 64.31ක් දිගැති මාර්ග පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම හා පාලම් 13ක් නැවත ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා ඇ.ඩො මිලියන 85ක මූල්‍යමය ආධාරයන් ලබා ගැනීමට රජයට හැකි වී තිබේ.

එසේම, 2018 වසර තුළදී මහනුවර උතුර පාතදුම්බර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය, දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතියේ සිවිල් වැඩ ඉදිකිරීම් අධීක්ෂණය සහ සැලසුම් නිර්මාණය විමර්ශනය සඳහා උපදේශන සේවා ව්‍යාපෘතිය හා මධ්‍යම සහ ඌව පළාත්වල කි.මී. 64.31ක් දිගැති මාර්ග පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම හා පාලම් 13ක් නැවත ඉදිකිරීමේ ව්‍යාපෘති වලට අදාළ ණය ගිවිසුම් බලාත්මක කරන ලදී.

පෙරකී දායකත්වයට අමතරව, "රජරට නවෝදය - ජනපති වැඩසටහන පිබිදෙමු පොළොන්නරුව දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන 2016-2020" යටතේ වන කෘෂිපාදක කර්මාන්ත හා කෘෂි නිෂ්පාදන අලෙවි යටිතල පහසුකම් ප්‍රවර්ධන ව්‍යාපෘතිය හා නැගෙනහිර නගර පොළොන්නරුව ජල සම්පාදන ව්‍යාපෘතීන් සඳහා ණය ඉල්ලුම් කිරීමේ ක්‍රියාවලියට අදාළ මූලික කටයුතු 2018 වසරේදී නිම කරන ලද අතර, ණය ලබා ගැනීමේ ක්‍රියාවලිය 2019 වසරේදී අවසන් කිරීමට අපේක්ෂිතය. එසේම, රජයේ ඉතා ප්‍රමුඛ ව්‍යාපෘති අතරින් එකක් වන මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ පළමු අදියරෙහි ණය ගිවිසුම අත්සන් කිරීමට අදාළ වන ක්‍රියාපටිපාටීන් හා අනුමැතීන් සියල්ල නිම කරන ලද අතර, චීන අපනයන ආනයන බැංකුව සමඟ වන ණය ගිවිසුම 2019 වසරේ මුල් භාගයේදී අත්සන් කිරීමට අපේක්ෂිතය.

# චීන සංවර්ධන බැංකුවෙන් ලබා දෙනු ලබන සංවර්ධන ආධාර

ශ්‍රී ලංකා රජය චීන සංවර්ධන බැංකුවෙන් සැලකිය යුතු මූල්‍යාධාර ප්‍රමාණයක් ලබා ගෙන ඇති අතර, චීන සංවර්ධන බැංකුව, ශ්‍රී ලංකාවට දෙවැනියට විශාලම චීන මූල්‍යාධාර සපයන ආයතනය බවට පත්ව ඇත. චීන සංවර්ධන බැංකු ණය ආධාර මඟින් මේ වන විට ජල සම්පාදන ව්‍යාපෘති පහක් ක්‍රියාත්මක වන අතර, ඒවා වනුයේ, ගම්පහ, අත්තනගල්ල සහ මිනුවන්ගොඩ ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය, කටාන ජල සම්පාදන ව්‍යාපෘතිය, තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය, වාලච්චේන ජල සම්පාදන ව්‍යාපෘතිය සහ බණ්ඩාරවෙල, දියතලාව හා හපුතලේ ජල සම්පාදන ව්‍යාපෘතියයි. තවද, ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතියේ පළමු හා දෙවන අදියරයන්හි අදාළ ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතින අතර, ණය මුදල් වලින් සියයට 60කට වැඩි ප්‍රතිශතයක් භාවිතා කරනු ලැබ ඇත. මෙම ව්‍යාපෘති 2019 වර්ෂයේදී නිම කිරීමට අපේක්ෂිතය. එයට අමතරව, චීන සංවර්ධන බැංකුව වෙතින් දේශීය වත්කම්හි සුවිශාල වැඩිවීමක් සිදු කරමින් සහ රුපියල මත වූ බාහිර සාධක පදනම් වූ පීඩනය වළකමින් ඉහළ තරඟකාරී පොළී අනුපාතිකයකට ඇ.ඩො. බිලියන 1ක විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකමක් ලබා ගන්නා ලදී.

## හොංකොං සහ ෂැන්හයි බැන්කින් කෝපරේෂන් ලිමිටඩ් මඟින් ලබා දෙනු ලබන සංවර්ධන ආධාර

රටෙහි පොදු මහජනතාවගේ ප්‍රවාහන පහසුකම් වැඩිදියුණු කිරීම අරමුණු කරගත් වැදගත් ව්‍යාපෘති අතුරින් එකක් වූ උඩරට දුම්රිය මාර්ගයේ මෙහෙයුම් කටයුතු සඳහා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව වෙත ඩීසල් බලවේග කට්ටල 09ක් ප්‍රසම්පාදනය, මිලදී ගැනීම හා බෙදා හැරීමේ ව්‍යාපෘතිය, චීන කොන්ත්‍රාත්කරුවෙකු වූ ඩොංෆැන්ග් ඉලෙක්ට්‍රික් ඉන්ටර්නැෂනල් කෝපරේෂන් සමඟ සිදු කිරීමට හොංකොං සහ ෂැන්හයි බැන්කින් කෝපරේෂන් ලිමිටඩ් වෙතින් ඇ.ඩො මිලියන 80ක ණය මුදලක් රජය විසින් ලබා ගන්නා ලදී. තවද, රෝහල් 13ක් සංවර්ධනය කිරීම අරමුණු කරගත් ශ්‍රී ලංකාවේ තෝරාගත් රෝහල්වල සෞඛ්‍යය පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ඇ.ඩො. මිලියන 72.25ක ණය මුදලක් ලබා ගැනීමට අදාළ සම්මුති සාකච්ඡා රජය හා හොංකොං සහ ෂැන්හයි බැන්කින් කෝපරේෂන් ලිමිටඩ් අතර සිදුකර අවසන් කරන ලදී. 2019 මුල් භාගයේදී ණය ගිවිසුම අත්සන් කිරීමට අපේක්ෂිතය.

# ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව

ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව ශ්‍රී ලංකාවට බහුපාර්ශ්වීය මූල්‍යාධාර සපයන්නන් කණ්ඩායමට නවතම එකතු කිරීමයි. මාර්ග හා දුම්රිය මාර්ග සම්බන්ධතා, පුනර්ජනනීය බලශක්ති සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සඳහා වැඩි ප්‍රමුඛතාවයක් ලබාදෙමින් සාමාජික රටවල තිරසාර යටිතල පහසුකම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම කෙරෙහි ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව උනන්දුවේ.

ශ්‍රී ලංකාව ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවෙහි ආරම්භක සාමාජිකයින් අතරින් කෙනෙක් ලෙස 2017 සහ 2018 අතරතුර ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවෙහි මූල්‍යයනය මඟින් ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති කිහිපයක් යෝජනා කරන ලදී. මෙම යෝජනා අතරින් යෝජනා දෙකක් ක්‍රියාත්මක කිරීම සඳහා ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව උනන්දුවක් දක්වා ඇත. එම ව්‍යාපෘති යෝජනා දෙක පහත පරිදි වේ.

1. ආපදා අවම කිරීමේ පියවර මඟින් නායයාම් අවදානම් අවම කිරීමේ ව්‍යාපෘතිය
2. කොළඹ නගරයේ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සහය වීම - කොළඹ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය යටතේ පැල්පත්වාසින් සඳහා අඩු ආදායම් නිවාස ඉදිකිරීම

2018 වසරේදී, මෙම ව්‍යාපෘති දෙක ක්‍රියාත්මක කරන ආයතන එනම්, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (NBRO) සහ නාගරික සංවර්ධන අධිකාරිය (UDA), ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවෙහි සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවෙහි උපදෙස් ලබාගනිමින් මෙම ව්‍යාපෘති දෙකෙහි සියලුම මූලික ක්‍රියාකාරකම් සම්පූර්ණ කරන ලදි. විස්තරාත්මක ව්‍යාපෘති ලේඛනය, පාරිසරික සහ සමාජීය කළමනාකරණ රාමුව, සාමාජීය කළමනාකරණය සහ නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්ති රාමුව, නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්ති රාමුව සහ ප්‍රසම්පාදන සැලසුම් ඇතුලු විවිධ වාර්තා ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවෙහි අවශ්‍යතාවයන්ට අනුකූලව සකස් කරන ලදි. මෙම ප්‍රාරම්භක ක්‍රියාකාරකම් සඳහා උපකාර කිරීම, එම ක්‍රියාකාරකම් නිරීක්ෂණය සහ ඇගයීම සඳහා ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව මඟින් දූත මණ්ඩල කිහිපයක් ක්ෂේත්‍රගත කරන ලදී.

ආපදා අවම කිරීමේ පියවර මඟින් නායයෑම් අවදානම අවම කිරීමේ ව්‍යාපෘතියෙහි ණය මුදල ඇ.ඩො මිලියන 80කි. මෙම ව්‍යාපෘතිය යටතේ නායයාම් අවදානම අවම කිරීම සඳහා ප්‍රමුඛ ස්ථාන 147ක් හඳුනාගෙන ඇත. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම අදියර දෙකකින් සිදුකෙරෙනු ඇත. අදියර I මඟින් තීරණාත්මක ස්ථාන 27ක හදිසි තත්ත්වයන් සඳහා පිළියම් යොදන අතර, අදියර II මඟින් ඉතිරි ස්ථාන 120 සඳහා පිළියම් යොදනු ලැබේ. මෙම නායයාම් හදිසි අවදානම් ස්ථාන රට තුළ දිස්ත්‍රික්ක 11ක් පුරා පැතිර පවතී.

කොළඹ නාගරික පුනර්ජනනීය ව්‍යාපෘතියට සහයවීම සඳහා වූ ණය මුදල ඇ.ඩො මිලියන 200කි. කොළඹ නාගරික පුනර්ජනනීය ව්‍යාපෘතියට, නාගරික සංවර්ධන අධිකාරිය මඟින් කොළඹ දිස්ත්‍රික්කයේ අඩු ආදායම්ලාභී ප්‍රජාවන් සඳහා නිවාස ඒකක 60,000ක් ඉදිකිරීම අරමුණු කරගනිමින් දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘතියකි. ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවෙහි කොළඹ නාගරික පුනර්ජනනීය ව්‍යාපෘතියට සහායවීම යටතේ නිවාස ඒකක 5,500ක් ඉදිකරනු ලැබේ.

මෙම ව්‍යාපෘති දෙකෙහි සියලුම මූලික ක්‍රියාකාරකම් සම්පූර්ණ කර ඇති බැවින්, 2019 දී නිල ණය සම්මුති සාකච්ඡා පැවැත්වීමට සැලසුම් කර ඇත. සම්මුති සාකච්ඡා අවසන් වූ පසු, ණය ගිවිසුම් අත්සන් කිරීම සඳහා ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව ඔවුන්ගේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගනු ඇත.

මීට අමතරව, ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවෙහි මූල්‍යයනය සඳහා ඉහළ ප්‍රමුඛතා ව්‍යාපෘති කිහිපයක් පෙළගස්වා ඇත. වර්තමානයේ රට මුහුණපා ඇති මූල්‍යමය බාධක සැලකිල්ලට ගනිමින්, ශ්‍රී ලංකා රජයට වඩාත් හිතකර නියමයන් සහ කොන්දේසිවලට අනුකූලව මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව දැනට සාකච්ඡා පවත්වනු ලැබේ.

## ව්‍යාපෘති පෙළගැස්ම

පහත සඳහන් ව්‍යාපෘති චීනයේ අපනයන ආනයන බැංකුව, චීන සංවර්ධන බැංකුව සහ ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවෙහි මූල්‍යයනය සඳහා පෙළගස්වා ඇත.

### චීනයේ අපනයන ආනයන බැංකුව

- මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය අදියර I කඩවත සිට මීරිගම දක්වා
- නැගෙනහිර නගර පොළොන්නරුව ජල සම්පාදන ව්‍යාපෘතිය
- කෘෂි පාදක කර්මාන්ත සහ කෘෂි නිෂ්පාදන අලෙවි යටිතල පහසුකම් ප්‍රවර්ධන ව්‍යාපෘතිය
- මාදුරු ඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය

### චීන සංවර්ධන බැංකුව

- බණ්ඩාරවෙල, දියතලාව හා හපුතලේ ජල සම්පාදන ව්‍යාපෘතිය
- වාලච්චේන ජල සම්පාදන ව්‍යාපෘතිය

### ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව

- අනුරාධපුර අපජලය බැහැර කිරීමේ පද්ධතිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (සංවර්ධනය පිළිබඳ ප්‍රංශ නියෝජිතායතනයේ සම මූල්‍යයන පහසුකම් සමඟ)
- කොළඹ නගරාසන්න දුම්රිය ව්‍යාපෘතිය
- සීතාවක ගඟ ජල විදුලි ව්‍යාපෘතිය

## චීන රජය විසින් ලබාදෙන ප්‍රදාන ආධාර

ශ්‍රී ලංකාවේ විවිධ සංවර්ධන කටයුතු සඳහා මහජන චීන සමුහාණ්ඩුව විසින් ප්‍රදාන ආධාර සපයනු ලැබේ. මෙවැනි ප්‍රදාන වැඩි වශයෙන් ලබාදෙනු ලබන්නේ ආදායම් ඉපැයීමෙන් තොර, රාජ්‍ය අංශයේ සේවා වන සෞඛ්‍යය අංශයේ ව්‍යාපෘති හෝ දෙරට අතර මිත්‍ර සම්බන්ධතාවය සඳහා වැඳගත්වන අනෙකුත් සුවිශේෂී ප්‍රමුඛස්ථාන වන බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව, නෙළුම් පොකුණ ජාතික කලා රංග පීඨය සහ උපරිමාධිකරණ සංකීර්ණය වැනි ව්‍යාපෘති සඳහා ය.

ශ්‍රී ලංකාවේ උතුරු මැද පළාතේ නිදන්ගත වකුගඩු රෝගයට එරෙහි ශ්‍රී ලංකා රජයේ ප්‍රමුඛතාවයට ප්‍රතිචාර වශයෙන්, නිදන්ගත වකුගඩු රෝගය සඳහා පොළොන්නරුවේ නව රසායනාගාරයක් හා රෝහල් සංකීර්ණයක් ඉදිකිරීම හා ඒකාබද්ධ චීන - ශ්‍රී ලංකා ජල තාක්ෂණය සඳහා වන පර්යේෂණ හා ආදර්ශ මධ්‍යස්ථානය සඳහා ප්‍රදාන පහසුකම් ලබාදෙන ලදී. මෙම ව්‍යාපෘති දෙක දැනට ක්‍රියාත්මක වෙමින් පවතී. ඉහත මුල් ව්‍යාපෘතිය විසින් නිදන්ගත වකුගඩු රෝගයෙන් පීඩා විඳින රෝගීන් සඳහා ප්‍රතිකාර ලබාදෙන අතර, අනෙක් ව්‍යාපෘතිය මඟින් මෙම නිදන්ගත වකුගඩු රෝගය සඳහා හේතුව සහ එයට විසඳුමක් සොයා ගැනීමට පර්යේෂණ සිදුකරනු ලබයි. ශ්‍රී ලංකාවේ ජාතික රෝහලේ බාහිර රෝගී අංශය ඉදිකිරීම චීන ප්‍රදාන ආධාර යටතේ දැනට ඉදිවෙමින් පවතින තවත් ප්‍රධාන ව්‍යාපෘතියක් වේ.

# පෙරදිග ආසියානු අංශය

විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පෙරදිග ආසියානු අංශය මඟින්, මෙරට සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ජපානය, කොරියානු ජනරජය, තායිලන්තය, වියට්නාමය, සිංගප්පූරුව හා මැලේසියාව යන රටවලින් නිල සංවර්ධන සහයෝගීතාවය සපයා ගැනීමෙහි මෙන්ම එම රටවල් හා සම්බන්ධව හැකියාවන් වර්ධනය කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමෙහිලා ද වගකීම දරනු ලබයි.

ජපාන රජයේ සංවර්ධන සහයෝගීතාවය, ජපාන ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය (JICA) මඟින් මෙරටට ලබාදෙන අතර, කොරියානු රජයේ ණය ආධාර, කොරියානු අපනයන ආනයන බැංකුවේ ආර්ථික සංවර්ධන සහයෝගීතා අරමුදල (EDCF) හරහාද, ප්‍රදාන ආධාර කොරියානු අන්තර්ජාතික සහයෝගීතා නියෝජිතායතනය (KOICA) මඟින්ද මෙරටට ලබාදේ. ඉහත ප්‍රධාන ද්විපාර්ශ්වීය සහයෝගීතාවයන්ට අමතරව අනෙකුත් රටවල නිල සංවර්ධන සහයෝගීතාවය, මූලිකවම හැකියාවන් වර්ධනය කිරීමේ වැඩසටහන් උදෙසා ලබා දේ.

## ජපානය



### ජපානය සමඟ පවත්නා සංවර්ධන සහයෝගීතාවය

ජපාන රජය ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය (JICA) හරහා ජපානය තම නිල සංවර්ධන සහයෝගීතාවය මෙරට සමාජීය හා ආර්ථික සංවර්ධනය උදෙසා ලබාදෙන අතරම, එමඟින් ශ්‍රී ලංකාවේ ක්‍රමෝපාය සංවර්ධන ක්‍රියාවලියට මහඟු දායකත්වයක් ලබාදේ.

ජපාන රජයේ නිල සංවර්ධන සහයෝගීතාවය මූලික වශයෙන් යෙන් ණය පැකේජ, ප්‍රදාන ආධාර, ක්ෂේත්‍ර සංවර්ධන සැලසුම් සකස්කිරීම, ශක්‍යතා අධ්‍යයනයන් සිදුකිරීම සහ තාක්ෂණික සහයෝගීතා වැඩසටහන් සඳහා සහය යන විවිධ අංශයන්ගෙන් ලබා දේ. ජපානයෙන් යෙන් ණය පැකේජ වාර්ෂිකව ලබාදෙන අතර එමඟින්, විදුලිබල හා බලශක්තිය, ජල සම්පාදනය හා ජලාපවහනය, වරාය, මහාමාර්ග, ප්‍රවාහනය, ගුවන් සේවා, සෞඛ්‍යය, කෘෂිකර්මය හා වාරිමාර්ග, ආපදා කළමනාකරණය, විදුලි සංදේශ සහ ග්‍රාමීය සංවර්ධනය ආදී පුළුල් ක්ෂේත්‍ර රැසක් ආවරණය වේ.

ජපාන තාක්ෂණික සහයෝගීතාවය හරහා ජපාන රජය විසින් විශේෂඥ දැනුමැති පුද්ගලයින් මෙරටට එවීමට හා දියුණු තාක්ෂණික උපකරණ සැපයීමට කටයුතු කිරීම මඟින් මෙරට ආර්ථික සංවර්ධනය වෙනුවෙන් උසස් තාක්ෂණික විශේෂඥ දැනුම, අත්දැකීම් හා නිපුණතාවයන් හුවමාරු කරගැනීම අපේක්ෂා කෙරේ.

තවද, තාක්ෂණික සහයෝගීතාවය යටතේ ගැනෙන තිරසාර සංවර්ධනය සඳහා වන විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ සහයෝගීතාවය යන වැඩසටහන් හරහා මෙරට සමාජීය හා ආර්ථික අවශ්‍යතා හා තාක්ෂණික නව නිපැයුම් මත පදනම්ව අන්තර්ජාතික ඒකාබද්ධ පර්යේෂණ වැඩසටහන් ප්‍රවර්ධනය කරනු ලබයි.

1965 වසරේ සිට, ශ්‍රී ලංකා රජය ජපානයෙන් ලබාගන්නා ලද නිල සංවර්ධන සහයෝගීතාවය ඇ.ඩො මිලියන 8,829ක් වන අතර, එය ඉතා සහනදායී පොළී අනුපාතික යටතේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති 120කින් හා පාරිභෝගික භාණ්ඩ සඳහා වූ ණය ව්‍යාපෘති 15කින් මෙන්ම ඇ.ඩො. මිලියන 1,392ක් වූ ප්‍රදාන ආධාර වලින් සමන්විත වේ.

## 2018 වර්ෂයේ සමස්ත එකඟතාවය

දැනට පවත්නා ජපාන ආයෝජන කළඹ 2018 වසරේදී සෞඛ්‍යය හා වෛද්‍ය සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම උදෙසා මෙරටට ලැබුණු ඇ.ඩො. මිලියන **100**ක සහනදායී ණය ආධාරය හේතුවෙන් තවදුරටත් ඉහළ නැංවිණි. ශ්‍රී ලංකා රජය, කොළඹ සැහැල්ලු දුම්රිය සංක්‍රමණ පද්ධතියක් (LRT) ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය 2019 වසරේදී ක්‍රියාත්මක කිරීම උදෙසා ප්‍රථම ණය වාරිකය ලෙසින් ඇ.ඩො. මිලියන 300ක සහනදායී ණයක් ජපාන රජයෙන් ලබාගැනීමට අදහස් කර ඇත.

### සෞඛ්‍යය හා වෛද්‍ය සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - ඇ.ඩො මිලියන 100.25


ශ්‍රී ලංකාවේ මෑත කාලීන සමාජීය - ආර්ථික හා ජනගහන පරිවර්තනයන්හි ප්‍රතිඵලයක් ලෙස හෘද රෝග හා මස්තිෂ්කවාහිනී, ආඝාත වැනි බෝ නොවන රෝග වල (NCD) වර්ධනයක් පෙන්නුම් කරයි.

මෙම ගැටළුව විසඳීම සඳහා බෝ නොවන රෝග, විශේෂයෙන්ම හෘද රෝග නිර්ණය කිරීමට සහ ප්‍රතිකාර කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ වෛද්‍ය සේවා වැඩිදියුණු කිරීම මඟින් මෙරට ජනතාවගේ සෞඛ්‍යය තත්ත්වය නඟා සිටුවීම උදෙසා ජපාන රජය විසින් ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය හරහා ජපන් යෙන් මිලියන 10,639ක මුදලක් ලබා දීමට එකඟ වී ඇත.

හෘද රෝග හා සම්බන්ධ ප්‍රතිකාර කිරීම සඳහා අනුරාධපුර, මහනුවර, කුරුණෑගල, බදුල්ල සහ ත්‍රිකුණාමලය යන ප්‍රදේශ වල ස්ථාපිත කර ඇති තෘතීයික රෝහල් 05ක් සහ වෛද්‍ය කාර්ය මණ්ඩල සඳහා පුහුණු මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීමට මෙම ව්‍යාපෘතිය මඟින් මූලික අවධානය යොමුකර ඇත. මෙම ව්‍යාපෘතිය හරහා වෛද්‍ය උපකරණ නඩත්තුව ශක්තිමත් කිරීම සිදුවන අතර, එමඟින් ඒවායේ තිරසාරත්වය සහතික කිරීම උදෙසා ඵලදායී උපයෝගීතාවය වැඩිදියුණු කෙරේ.


## ජපාන ණය එකඟතාවයන්හි ආංශික ව්‍යාප්තිය 2013 - 2018

2013-2018 ආංශික ණය එකඟතාවය
(ඇ.ඩො. මිලියන)





2013-2018 කාල පරාසය ඇතුළත ජපාන මුළු එකඟතාවය ඇ.ඩො. මිලියන 2,055ක් වන අතර එය ඇ.ඩො මිලියන 1,896ක් වන ණය හා ඇ.ඩො මිලියන 159ක් වූ ප්‍රදානයන්ගෙන් සමන්විතය. 2015 වසරේදී විදුලිබල හා බලශක්ති හා ගුවන් සේවා යන අංශවල ඉහළම වාර්ෂික එකඟතාවය වාර්තා වූ අතර, එය ඇ.ඩො. මිලියන 569කි.

## ජපාන ප්‍රදාන එකඟතාවයන්හි ආංශික ව්‍යාප්තිය 2013-2018




# 2018 වර්ෂයේ සමස්ත උපයෝජනය

2018 වර්ෂයේ ජපාන නිල සංවර්ධන සහයෝගීතා සඳහා සමස්ත උපයෝජනය ඇ.ඩො. මිලියන 17,123කි.




ඉහත සමස්ත උපයෝජනය, මාර්ග හා පාලම් සංවර්ධන ක්ෂේත්‍රය සඳහා ඇ.ඩො මිලියන 78.2කින්, විදුලිබල හා බලශක්තිය සඳහා ඇ.ඩො. මිලියන 47.53කින්, ජල සම්පාදනය හා සනීපාරක්ෂාව සඳහා ඇ.ඩො. මිලියන 25.38කින්, සමුද්‍රීය ආරක්ෂණය සඳහා ඇ.ඩො මිලියන 8.39කින්, අධ්‍යාපන හා පුහුණු සේවා සඳහා ඇ.ඩො. මිලියන 06කින් හා සෞඛ්‍යය හා සමාජ සුභසාධනය සඳහා වෙන්වූ ඇ.ඩො. මිලියන 5.7කින්ද සමන්විතය.

## 2018 වර්ෂයේදී සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති

| ව්‍යාපෘතිය | ණය මුදල (ඇ.ඩො මිලියන) |
|---|---|
| SLP – 101<br>මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය අදියර II | 390.97 |
| SLP – 105<br>පිබිදෙන කලාප ඉලක්ක කරගත් මූලික සමාජ සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 47.40 |

## මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය

ජපාන රජය විසින් විශාල ජාතික මහාමාර්ග සහ අධිවේගී මාර්ග සඳහා අරමුදල් සැපයීම හරහා ශ්‍රී ලංකාවේ මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීමෙහිලා මහඟු දායකත්වයක් දරයි. කි.මී 29.1ක දිගින් යුක්ත වන මෙම පිටත වටරවුම් අධිවේගී මාර්ගය මඟින් සියලු අධිවේගී මාර්ග කොළඹ නගරයෙන් පිටතදී "ඒ" ශ්‍රේණියේ මහාමාර්ග සමඟ සම්බන්ධ කරනු ලබයි.

කොට්ටාව සිට කඩුවෙල දක්වා වූ කි.මී. 12ක දිගින් යුතු මාර්ග කොටස ඉදිකිරීම් කටයුතු ඇ.ඩො මිලියන 186ක වියදමින් 2014 වසරේ දී, අවසන් කරන ලදී. කඩුවෙල සිට කඩවත දක්වා කි.මී. 8.9ක මාර්ග කොටසද ජපාන ආධාර යටතේ නිමකරන ලදී.

පිටත වටරවුම් මාර්ගයේ කඩුවෙල සිට කඩවත දක්වා වූ මාර්ග කොටස මඟින් කොළඹ නගර සීමාව තුළ රථවාහන තදබදය අඩු කිරීම සඳහා මෙන්ම අධිවේගී මාර්ග ජාලයේ සම්බන්ධතාවය වැඩි දියුණු කිරීම සඳහා ද පහසුකම් සපයනු ඇත.



පිටත වටරවුම් මාර්ගය

මීට අමතරව, මාකුඹුර (කොට්ටාව), කඩුවෙල සහ කඩවත යන ප්‍රධාන නගර තුන ද උපරිම යටිතල පහසුකම් සහිතව සංවර්ධනය වෙමින් පවතී.

## පිබිදෙන කලාප ඉලක්ක කරගත් මූලික සමාජ සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන ධාරිතාවය පුළුල් කිරීම සහ ද්විතීයික මට්ටමේ රෝහල්වල පවත්නා වූ පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා ඇ.ඩො මිලියන 47.4ක ණය මුදලක් ආයෝජනය කිරීමට, රජය සැලසුම්කර ඇත.

*තවද, ග්‍රාමීය ජනතාවගේ සෞඛ්‍යය තත්ත්වය ඉහළ නැංවීම උදෙසා තෙල්දෙණිය, වරකාපොළ, ගල්ගමුව සහ කලවංචිකුඩි යන තෝරාගන්නා ලද ද්විතීයික රෝහල් කිහිපයක පවත්නා පහසුකම් ඉහළ නැංවීමට කටයුතු කර ඇත.*

*මීට අතිරේකව, බරපතල තත්ත්වයේ පසුවන රෝගීන් කඩිනම් රෝග නිවාරණ කටයුතු සඳහා පර්යන්ත, මධ්‍යම හා දිස්ත්‍රික් රෝහල්වලින් මූලික හා ශික්ෂණ රෝහල්වලට අප්‍රමාදව මාරුකර යැවීම සහතික කරමින් මධ්‍යම, සබරගමුව, වයඹ, උතුරු මැද, ඌව, නැගෙනහිර සහ උතුරු පළාත්හි රෝහල් සඳහා ගිලන් රථ 124ක් ලබාදී ඇත.*



*ඖෂධ නිෂ්පාදනය කිරීම*

# 2019 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන ව්‍යාපෘති

**කොළඹ සැහැල්ලු දුම්රිය සංක්‍රමණ පද්ධතියක් (LRT) ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය (I) (කොළඹ කොටුව සිට මාලඹේ දක්වා)** - පළමු වාරිකය ඇ.ඩො. මිලියන 300 (ඇ.ඩො. මිලියන 1,800ක මුළු පිරිවැයෙන්)

"දැක්ම 2025: පොහොසත් රටක්" රජයේ සංවර්ධන ප්‍රතිපත්තිය සහ බස්නාහිර කලාප මහනගර ප්‍රධාන සැලසුම 2030 මඟින් යෝජනා කළ පරිදි, කොළඹ නගරයේ සහ තදාසන්න ප්‍රදේශවල පවතින දැඩි රථවාහන තදබදයට පිළියමක් ලෙස කාර්යක්ෂම සහ සුවපහසු මගී ප්‍රවාහන පද්ධතියක් ස්ථාපනය කිරීමට රජය තීරණය කර ඇත.

*ඉහත ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයනය ජපාන ප්‍රදාන ආධාර යටතේ සිදුකරන ලදී. මේ අනුව ඉහත ණය මුදල JICA ආයතනයෙන් ලබාගැනීම සඳහා අවශ්‍ය කටයුතු මේ වනවිට සිදුකෙරෙමින් පවතී. මෙම සැහැල්ලු දුම්රිය පද්ධතිය කොළඹ-කොටුව සිට මාලඹේ දක්වා කොන්ක්‍රීට් කුළුණු මත ඉදිවන, කි.මී 17ක පමණ දිගින් යුක්ත දුම්රිය මාර්ගයකින් සහ කොළඹ නගරයේ වැදගත් සහ ප්‍රධාන මංසන්ධි ආවරණය වන පරිදි සැලසුම් කර ඇති දුම්රිය නැවතුම්පලවල් 16කින් සමන්විතය.*



**සැහැල්ලු දුම්රිය සංක්‍රමණ**

ව්‍යාපෘතියේ කටයුතු 2026 වසරේදී අවසන් කිරීමට නියමිත අතර, මෙම දුම්රිය පද්ධතිය මඟින් කොළඹ නගරයට තදාසන්න පරිපාලන කේන්ද්‍රස්ථාන, වාණිජ මධ්‍යස්ථාන හා ඉහළ ජන ඝනත්වයකින් යුතු නේවාසික ප්‍රදේශ රැසක් එකිනෙක සම්බන්ධ කරනු ලබයි.

යෝජිත සැහැල්ලු දුම්රිය පද්ධතිය යටතේ මගීන් 800ක් ගමන් කලහැකි වායුසමනය කල මැදිරි 04 කින් සමන්විත දුම්රිය කට්ටල 25ක් සේවයේ යෙදවීමට අපේක්ෂිතය.

## ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මළාපවහන පිරිපහදු මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය

ශ්‍රී ලංකාවේ මළාපවහනය සඳහා වන ප්‍රධාන සැලැස්මක් සැකසීම සඳහා වූ ක්‍රියාවලිය තුළ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ හා නුවරඑළිය නගර සභා බල ප්‍රදේශයන්හි මළාපවහන පිරිපහදු මධ්‍යස්ථාන 02ක් ස්ථාපිත කිරිම, සඳහා වන ශක්‍යතා අධ්‍යයනයන් ද ඇතුළත් වන අතර, එය දැනට ජපාන ආධාර යටතේ ක්‍රියාත්මකව පවතී.

එසේම, ජපන් රජයේ ණය අධාර යටතේ, හීනටිකුඹුර ප්‍රදේශයේ කලපළුවාව මාර්ගයේ සිට කොස්වත්ත මංසන්දිය දක්වා වූ කොටසෙහි ප්‍රධාන අපවහන පිරිපහදු මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමටත්, ඒ අනුව ප්‍රධාන පොම්පාගාර 07ක් ඇතුලත්ව පොම්ප කිරීමේ ස්ථාන 50ක් මඟින් රාජගිරිය, නුගේගොඩ, දෙල්කඳ, දියවන්නාව හා මාදිවෙල යන ප්‍රදේශ ආවරණය කිරීමටත් සැලසුම් කර ඇත.

## මධ්‍යම අධිවේගී මාර්ගයේ 3 වන අදියර ඉදිකිරීමේ ව්‍යාපෘතිය - පොතුහැර සිට ගලගෙදර

පොල්ගහවෙල හා රඹුක්කන අන්තර් හුවමාරු මධ්‍යස්ථාන සමඟින් පොතුහැර සිට ගලගෙදර දක්වා ඉදිවන මධ්‍යම අධිවේගී මාර්ගයේ තෙවන කොටසෙහි මුළු දුර ප්‍රමාණය කි.මී. 32.5ක් වේ.

මෙම අදියරයෙහි ශක්‍යතා අධ්‍යයනය හා මූලික සැලැස්ම මේ වන විට අවසන් වී ඇති අතර, ඉඩම් අත්පත් කරගැනීම සිදුකරමින් පවතී. මෙම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය ජපාන යෙන් බිලියන 100ක ණය මුදල ලබාගැනීම උදෙසා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සහ ජපානයේ ටෝකියෝ MUFG බැංකුව සමඟ සම්මුති සාකච්ඡා මේ වන විට සිදුකෙරෙමින් පවතී.

## 2018 වර්ෂයේ ක්‍රියාත්මක ප්‍රධාන ව්‍යාපෘති

| ව්‍යාපෘතිය | මුදල (ඇ.ඩො. මිලියන) |
|---|---|
| **ණය ව්‍යාපෘති** | |
| මහනුවර නගරයේ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය | 152.38 |
| මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය - අදියර II | 390.97 |
| කළු ගඟ ජල සම්පාදනය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය I | 279.48 |
| පිඹිදෙන කලාපයන්හි ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | 113.84 |
| හබරණ - වේයන්ගොඩ සම්ප්‍රේෂණ ජාල ව්‍යාපෘතිය | 115.33 |
| මහ කොළඹ සම්ප්‍රේෂණ හා බෙදා හැරීමේ නාස්තිය අවම කිරීමේ ව්‍යාපෘතිය | 166.38 |
| ජාතික මාර්ග ජාලයේ ප්‍රධාන පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 129.23 |
| නාය යෑමේ ආපදා වලින් ජාතික මාර්ග ජාලය ආරක්ෂා කරගැනීමේ ව්‍යාපෘතිය | 79.52 |
| අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය - අදියර I | 53.92 |
| අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය - අදියර II | 212.16 |
| බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල සංවර්ධන ව්‍යාපෘතිය - අදියර II (I) | 272.89 |
| බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල සංවර්ධන ව්‍යාපෘතිය - අදියර II (II) | 427.94 |
| කැළණි ගඟ හරහා නව පාලමක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 342.85 |
| භෞමික රූපවාහිනී විකාශන කටයුතු ඩිජිටල්කරණය කිරීමේ ව්‍යාපෘතිය | 132.10 |
| ජාතික විදුලිබල සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ජාල සංවර්ධනය සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය | 200.07 |
| පිඹිදෙන කලාප ඉලක්ක කරගත් මූලික සමාජ සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 47.40 |
| සෞඛ්‍යය හා වෛද්‍ය සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 100.25 |
| **ප්‍රදාන** | |
| යාපනය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ පර්යේෂණ හා පුහුණු ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම | 15.70 |
| සමුද්‍රීය ආරක්ෂක හැකියාවන් වර්ධනය කිරීම වෙනුවෙන් ප්‍රදාන ආධාර | 17.05 |
| ත්‍රිකුණාමලය වරායට නාවික සැලසුම් ආධාර ලබාදීම සඳහා ව්‍යාපෘති නොවන ආධාර | 9.42 |
| ශ්‍රී ලංකාවේ ඩොප්ලර් රේඩාර් ජාලයක් ස්ථාපනය කිරීම වෙනුවෙන් ප්‍රදාන ආධාර | 23.58 |

# කොරියාව

## කොරියානු ජනරජයෙහි සංවර්ධන සහයෝගීතාවය

සහන ණය පහසුකම් සැලැසීම, ප්‍රදාන, තාක්ෂණික සහයෝගයන් ලබාදීම, දැනුම හුවමාරු කරගැනීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, සංස්කෘතික කණ්ඩායම් හුවමාරු කරගැනීමේ වැඩසටහන්, විශේෂඥ සහයවීම්, ස්වේච්ඡා සේවකයන් හුවමාරු කරගැනීමේ වැඩසටහන් ඇතුළත්ව විවිධ ක්ෂේත්‍ර ඔස්සේ, ශ්‍රී ලංකාවට සංවර්ධන සහයෝගීතාවයන් ලබාදෙමින් කොරියානු ජනරජය ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ ද්විපාර්ශ්වීය සංවර්ධන සහයෝගීතාකරුවකු බවට පත්ව ඇත. තවද කොරියානු රජය වාර්ෂික පුහුණු වැඩසටහන් ඔස්සේ විශාල වශයෙන් රාජ්‍ය නිලධාරීන්ගේ අධ්‍යාපනික හා වෘත්තීමය කුසලතා ප්‍රවර්ධනය සඳහා අවස්ථා සපයනු ලබයි.

## ආර්ථික සංවර්ධන සහයෝගීතා අරමුදල (EDCF)

කොරියානු රජය, කොරියානු ආනයන අපනයන බැංකුවේ ආර්ථික සංවර්ධන සහයෝගීතා අරමුදල හරහා සහනදායී ණය පහසුකම් ශ්‍රී ලංකාව වෙත සපයනු ලබයි. රජයෙහි සංවර්ධන ප්‍රමුඛතා වලට සමපාත වෙමින් ප්‍රවාහනය, ජල කළමනාකරණය සහ සනීපාරක්ෂාව, අධ්‍යාපනය සහ ග්‍රාමීය සංවර්ධනය යන ක්ෂේත්‍රයන්හි ව්‍යාපෘති මූල්‍යයනය කිරීම සඳහා දෙරට අතර පවත්නා ක්‍රමෝපායික අන්‍යෝන්‍ය එකඟතාවය අනුව තීරණය කර ඇත.

**කොරියානු ආර්ථික සංවර්ධන සහයෝගීතා අරමුදල විසින් ලබාදෙන ණය ආධාරවල වත්මන් නියමයන් හා කොන්දේසි**


| නියමයන් හා කොන්දේසි | සාමාන්‍ය කොන්දේසි | කොරියානු විශේෂඥ සහය සමඟ | සංයුක්ත සහය |
|---|---|---|---|
| පොළී අනුපාතය | 0.20% | 0.15% | 0% |
| නැවත ගෙවීම | වසර 30 | වසර 40 | වසර 30 |
| සහන කාලය | වසර 10 | | |
| ණය මුදලේ වටිනාකම | මුළු ව්‍යාපෘති පිරිවැයෙන් 100%ක් දක්වා | | |
| මුදල | කොරියානු වොන් | | |
| ශක්‍යතා අධ්‍යනය | සඵලදායී ව්‍යාපෘති සඳහා ආධාර පදනම මත | | සම්මත ආකෘතිය පරිදි |

## දැනුම හුවමාරුකර ගැනීමේ වැඩසටහන (KSP)

කොරියාවේ මුදල් සහ ක්‍රමෝපායික අමාත්‍යාංශයේ අනුග්‍රහය යටතේ ක්‍රියාත්මක වන දැනුම හුවමාරු කර ගැනීමේ **(KSP)** වැඩසටහන් පසුගිය දශකයන්හිදී කොරියාව විසින් අත්කරගන්නා ලද සංවර්ධන අත්දැකීම් හා දැනුම අනෙකුත් සහයෝගීතා රටවල් සමඟ හුවමාරු කර ගැනීම අරමුණු කරගෙන ක්‍රියාත්මක කරනු ලබන විශේෂ තාක්ෂණික සහයෝගීතා වැඩසටහනකි.

2018 වර්ෂයේ දී මෙම දැනුම හුවමාරු කර ගැනීමේ වැඩසටහන් යටතේ කොළඹ මහනගර සභාවේ බදු පරිපාලන පද්ධතිය අනාගත අභියෝගවලට ගැලපෙන අයුරින් ප්‍රතිසංවිධානය කිරීමට අවශ්‍ය නිර්දේශයන් ලබාදීම සඳහා උපදේශනාත්මක ව්‍යාපෘතියක් සාර්ථක අයුරින් ක්‍රියාත්මක කරනු ලැබිණි. මෙහිදී කොරියාවේ සෝල් නුවර නවීන බදු තොරතුරු පද්ධතියක් පිහිටවීමේදී ලද අත්දැකීම් බෙදාගැනීම සිදු කෙරිණි.

## කොරියානු ණය උපයෝජනය 2014 - 2018 (ඇ.ඩො)




## ශ්‍රී ලංකාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා කොරියානු රජයේ සහයෝගීතාවය

ශ්‍රී ලංකාවේ ක්‍රමිකව බරපතල ගැටළුවක් බවට වර්ධනය වෙමින් පවත්නා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා නවීන තාක්ෂණය හා භාවිතයන් හඳුන්වාදෙමින් තිරසාර වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම සඳහා මැදිහත්වීමේ අවශ්‍යතාවය රජය විසින් අවබෝධ කරගෙන ඇත. ප්‍රාදේශීය පාලන ආයතන මඟින් ක්‍රියාත්මක කෙරෙන නාගරික ප්‍රදේශවල විවෘත කසල රඳවන ප්‍රදේශ කරා කසල බැහැර කිරීමේ ක්‍රමවේදය විවිධ සෞඛ්‍යය ගැටලු සහ පාරිසරික ගැටලු රැසක් නිර්මාණය කර ඇත.

කොරියානු රජය ශ්‍රී ලංකාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්ෂේත්‍රය විධිමත් කිරීම සඳහා ප්‍රමුඛ දායකත්වයක් ලබාදී ඇත. කොරියානු ජාත්‍යන්තර සහයෝගීතා ආයතනයේ (KOICA) මූල්‍යමය හා තාක්ෂණික සහයෝගයෙන් සනීපාරක්ෂක බිම් පිරවීමේ නියමු ව්‍යාපෘතියක් ලෙස බස්නාහිර පළාතේ දොම්පේ නගරයේ ඉදිකරන ලද කසළ රඳවන ව්‍යාපෘතිය දැනට ක්‍රියාකාරී මට්ටමේ පවතී. තවද මෙබඳු සනීපාරක්ෂක බිම් පිරවීමේ කසළ අංගන හතරක් ආර්ථික සංවර්ධන සහයෝගීතා අරමුදලේ ණය අධාර දායකත්වය යටතේ අනුරාධපුරය, ගාල්ල, යාපනය හා පොළොන්නරුව යන දිස්ත්‍රික්කවල පිහිටුවීමට කටයුතු මේ වන විට සැලසුම්කර ඇත.

## ප්‍රාදේශීය පාලන ආයතන වෙත කසළ රැස්කිරීමේ යන්ත්‍ර 190 ක් සැපයීම

ප්‍රාදේශිය පාලන ආයතන වල කසළ කළමනාකරණ ක්‍රමවේදය තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණින් කසළ එකතු කිරීමේ යන්ත්‍ර 190ක් කොරියානු ආර්ථික සංවර්ධන සහයෝගීතා අරමුදලේ සංයුක්ත ණය වැඩසටහන හරහා පොළී රහිත ණය මුදලක් ඔස්සේ සැපයීමට කොරියානු රජය එකඟ වී ඇත. ශ්‍රී ලංකා රජය මෙකී කසළ එකතු කිරීමේ උපකරණ ලංකාවේ සියලුම පළාත් ආවරණය වන අයුරින් ප්‍රාදේශීය පාලන ආයතන වල කසළ එකතු කිරීමේ හා ප්‍රවාහනය කිරීමේ ධාරිතාවය වර්ධනය කිරීමේ අරමුණින් බෙදාදීමට නියමිතය.



### කොරියානු ආර්ථික සංවර්ධන සහයෝගීතා අරමුදල හරහා මූල්‍යයනය කළ දැනට ක්‍රියාත්මක ව්‍යාපෘති

| ක්ෂේත්‍රය | ව්‍යාපෘතිය | අනුමත කළ දිනය | මුදල (ඇ.ඩො. මිලියන) |
|---|---|---|---|
| පාරිසරික | ඝන අපද්‍රව්‍ය අපහරණය කිරීමේ පහසුකම් ගොඩනැංවීමේ ව්‍යාපෘතිය | 2010 | 33.54 |
| අධ්‍යාපන හා වෘත්තීය පුහුණු | මැද කොළඹ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය හා ගම්පහ කාර්මික විද්‍යාලය ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය | 2011 | 26.05 |
| ජල සැපයුම | දැදුරු ඔය ජල සැපයුම් ව්‍යාපෘතිය | 2013 | 58.16 |
| ජල සැපයුම | රුවන්වැල්ල ජල සැපයුම් ව්‍යාපෘතිය | 2014 | 20.53 |
| පාරිසරික | ශ්‍රී ලංකාවේ දකුණු ප්‍රදේශය සඳහා කසළ එකතුකිරීමේ යන්ත්‍ර සැපයීමේ ව්‍යාපෘතිය | 2017 | 7.00 |
| පාරිසරික | ශ්‍රී ලංකාවේ මධ්‍යම හා උතුරු ප්‍රදේශ සඳහා කසළ එකතුකිරීමේ යන්ත්‍ර සැපයීමේ ව්‍යාපෘතිය | 2017 | 7.00 |
| | | **එකතුව** | **152.28** |

## කොරියාවෙන් හිමිවන ප්‍රදාන

කොරියානු රජය මඟින් ලබාදෙනු ලබන ප්‍රදානයන් ප්‍රමුඛ ලෙස කොරියානු ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය (KOICA) හරහා ලබාදෙනු ලබයි. මෙම ආධාර, ප්‍රදාන මඟින් ක්‍රියාත්මක වන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, තාක්ෂණික සහයෝගීතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, රාජ්‍ය නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම විශේෂඥයින් සේවයේ යෙදවීම සහ (ලෝක කොරියානු මිත්‍රත්ව) ස්වේච්ඡා සේවකයින් සේවයේ යෙදවීම ආදී කටයුතු සඳහා යොදවනු ලැබේ.

### කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පාසල් සංවර්ධනය

කිලිනොච්චි දිස්ත්‍රික්කයේ අධ්‍යාපන පරිසරය සංවර්ධනය කිරීමෙහිලා කොරියානු ජාත්‍යන්තර සහයෝගීතා අරමුදල (KOICA) මඟින් ලබාදී ඇති දායකත්වය තවදුරටත් පුළුල් කරමින් ඇ.ඩො. මිලියන 7.5ක ආධාර මුදලක් ප්‍රදේශයේ පාසල් සංවර්ධනය සඳහා ලබාදීමට කොරියානු ජාත්‍යන්තර සහයෝගීතා අරමුදල (KOICA) කටයුතු කරනු ලැබිණි. මෙම ව්‍යාපෘතිය සඳහා වන ගිවිසුමට 2018 නොවැම්බර් මසදී දෙරට විසින් අත්සන් කරනු ලැබිණි.

ව්‍යාපෘතිය ප්‍රදේශයේ අධ්‍යාපන ධාරිතාවය සංවර්ධනය කිරීමේ අරමුණින් යටිතල පහසුකම් සංවර්ධනය, ගුරුවරුන් පුහුණු කිරීම, මහජනතාව අධ්‍යාපනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම යන සෑම ක්ෂේත්‍රයක්ම ආවරණය වන ලෙස ක්‍රියාත්මක කිරීමට නියමිතය. තවද, ව්‍යාපෘතියේ අභිමතාර්ථය සාක්ෂාත් කරගැනීම සඳහා දරුවන්ගේ අධ්‍යාපනයට දෙමාපියන්ගෙන් ලැබිය යුතු සහයෝගය ලබාගැනීම සඳහා දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමද ව්‍යාපෘතිය හරහා සිදුකෙරෙනු ඇත.

## දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘති

| අමාත්‍යාංශය | ව්‍යාපෘතියේ නම /කාලය /මුදල |
|---|---|
| අධ්‍යාපන අමාත්‍යාංශය | නව තාක්ෂණික විෂය මාලාව සඳහා ගුරුවරුන් පුහුණු කිරීමේ ජාතික අධ්‍යාපන ආයතනයක් පිහිටුවීමේ ව්‍යාපෘතිය (2015-2022 / ඇ.ඩො. මිලියන 13)<br><br>කිලිනොච්චි පාසල් සංවර්ධනය ව්‍යාපෘතිය (2018-2022/ ඇ.ඩො මිලියන 7.5) |
| සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | මාතර දිස්ත්‍රික් රෝහල් මාතෘ හා ළදරු ඒකකය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (2016-2020/ ඇ.ඩො. මිලියන 8.5) |
| නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය | ශ්‍රී ලංකාවේ සාගර විශ්වවිද්‍යාලය පිහිටුවීම සඳහා තාක්ෂණික සහය (2017-2021/ ඇ.ඩො. මිලියන 2.5) |


# ලෝක බැංකුව හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල් අංශය

ලෝක බැංකුව ලොව පුරා දරිද්‍රතාවයට එරෙහිව තිරසාර විසඳුම් සැපයීමේ අරමුණ පෙරදැරිව සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා මූල්‍ය හා තාක්ෂණික සහාය සැපයීම අරමුණු කරගත් මූල්‍ය ආයතනයකි. ජාත්‍යන්තර සංවර්ධන සමායතනය (IDA), ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ අන්තර්ජාතික බැංකුව (IBRD), ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතාව (IFC), බහුපාර්ශ්වීය ආයෝජන ඇප ආවරණ ආයතනය (MIGA) සහ ආයෝජන ආරවුල් සමථයට පත් කිරීම සඳහා ජාත්‍යන්තර මධ්‍යස්ථානය (ICSID) යන ආයතන පහෙන් ලෝක බැංකු සමූහය සමන්විත වේ.

2018 වර්ෂය අවසානයේ දී ශ්‍රී ලංකාවේ විවිධ අංශයන්හි ආයෝජන සඳහා ලෝක බැංකුව විසින් නිකුත් කරන ලද මුළු ක්‍රියාකාරී ණය ප්‍රමාණය ඇ.ඩො මිලියන 1,957.6ක් විය. විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ ලෝක බැංකු අංශය මඟින් ලෝක බැංකු සමූහයේ මූල්‍ය හා තාක්ෂණික සහයෝගීතාව සම්බන්ධීකරණය කිරීම සිදු කරයි.

## 2018 වසරේදී ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති

| වැඩසටහන /ව්‍යාපෘති | මුදල (ඇ.ඩො මිලියන) |
|---|---|
| නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය | 101.5 |
| උපායමාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය | 147.0 |
| දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය | 110.0 |
| දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය - අතිරේක මූල්‍යයනය | 42.0 |
| පාසල් අධ්‍යාපනය දැනුම කේන්ද්‍ර කරගත් අධ්‍යාපන ක්‍රමයට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘති | 100.0 |
| කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය | 213.0 |
| පූර්ව ළමාවිය සංවර්ධන ව්‍යාපෘතිය | 50.0 |
| ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 165.0 |
| උපායමාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය - අතිරේක මූල්‍යයනය | 55.0 |
| පරිසර පද්ධති සංරක්ෂණය හා කළමනාකරණය කිරීමේ ව්‍යාපෘතිය | 45.0 |
| කෘෂිකාර්මික අංශය නවීකරණ සඳහා වූ ව්‍යාපෘතිය | 125.0 |
| උසස් අධ්‍යාපනය පුළුල් කිරීම සහ සංවර්ධනය කිරීම වේගවත් කිරීමේ ව්‍යාපෘතිය | 100.0 |
| ප්‍රවාහන සම්බන්ධතා හා වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය | 125.0 |
| මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය | 75.0 |
| සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය | 75.0 |
| මළාපවහන සේවාව සඳහා ගෘහස්ථ ප්‍රවේශතාවය වැඩිදියුණු කිරීම | 5.1 |
| සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය | 100.0 |
| වැඩසටහන් සැකසුම් අත්තිකාරම් | 4.0 |
| දෙවන සෞඛ්‍යය අංශයේ සංවර්ධන ව්‍යාපෘතිය | 200.0 |
| පාසල් අධ්‍යාපනය දැනුම කේන්ද්‍ර කරගත් අධ්‍යාපන ක්‍රමයට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය | 37.0 |
| ජල වේලි සුරැකුම් සහ ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතිය - අතිරේක මූල්‍යයනය | 83.0 |
| **එකතුව** | **1,957.6** |





| අංශය | ප්‍රමාණය (ඇ.ඩො මිලියන) |
|---|---|
| නාගරික සංවර්ධන | 313.0 |
| ආපදා කළමනාකරණය | 254.0 |
| අධ්‍යාපන හා නිපුණතා සංවර්ධන | 438.5 |
| වාරිමාර්ග හා කෘෂිකර්ම | 291.0 |
| ජල හා සනීපාරක්ෂක කටයුතු | 87.1 |
| ප්‍රවාහන හා මහාමාර්ග | 125.0 |
| මුදල් | 75.0 |
| සමාජ සුභසාධන | 125.0 |
| පරිසරය | 45.0 |
| සෞඛ්‍යය | 200.0 |
| වෙනත් | 4.0 |

## ලෝක බැංකු සහයෝගීතා රාමුව 2018-2020

දරිද්‍රතාවය අවසන් කිරීම හා සමෘද්ධිමත්භාවය ඉහළ නැංවීම යන අරමුණු පෙරදැරිව, ලෝක බැංකු සමූහයේ සහයෝගීතා රාමුව වඩා විධිමත්, සාධනීය හා වරණීය ප්‍රවේශයකින් යුත් සංවර්ධනයක් ඉලක්ක කර ඇති අතර, ලෝක බැංකු සහයෝගීතා රාමුව මූලිකව අරමුණු තුනක් යටතේ අංශගත කර ඇත. එනම්, සාර්ව මූල්‍ය ස්ථාවරත්වය හා තරඟකාරීත්වය වැඩිදියුණු කිරීම, සියල්ලන් සඳහා ප්‍රවේශයන් සහ අවස්ථාවන් වැඩි කිරීම, හරිත සංවර්ධන අවස්ථා අත්පත් කර ගැනීම, පාරිසරික කළමනාකරණය වැඩිදියුණු කිරීම සහ අනුගතවීමේ සහ අහිතකර බලපෑම් අවම කිරීමේ හැකියාව වැඩි දියුණු කිරීම ලෙස වේ.

## 2019-2020 වර්ෂ සඳහා ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වීමට නියමිත ව්‍යාපෘති


ශ්‍රී ලංකාව සහනදායී ජාත්‍යන්තර සංවර්ධන සමායතනයෙන් ණය ලබාගැනීමේ සිට ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ අන්තර්ජාතික බැංකුවෙන් වාණිජ පොළී අනුපාත යටතේ ණය ලබාගැනීම දක්වා වර්ධනය වීම නිසා වැඩි වූ මූල්‍ය පිරිවැය සම්බන්ධ කර ගනිමින් ලෝක බැංකුවේ 2019 - 2020 වර්ෂ සඳහා ක්‍රියාත්මක වීමට නියමිත ව්‍යාපෘති හඳුනා ගැනීම සිදුකර ඇත.



# උපයෝජනය


ලෝක බැංකු ආයෝජන යටතේ 2018 වසර සඳහා උපයෝජන ප්‍රමාණය ඇ.ඩො. මිලියන 104ක් වේ.

## 2013 - 2018 වසර තුළ උපයෝජනයන්හි ආංශික ව්‍යාප්තිය




2013 සිට 2018 දක්වා කාලය තුළ ලෝක බැංකු අරමුදල් වල ඉහළම උපයෝජනය වන මුළු උපයෝජන වලින් සියයට 22ක ප්‍රතිශතය අධ්‍යාපන හා නිපුණතා සංවර්ධන අංශය විසින් වාර්තා කළ අතර, ආපදා කළමනාකරණ අංශය විසින් දෙවැනි ඉහළ අගය වන මුළු උපයෝජන වලින් සියයට 13ක ප්‍රතිශතය වාර්තා කරන ලදී.

## 2018 වසරේ උපයෝජනයන්හි ආංශික ව්‍යාප්තිය




2018 දී ලෝක බැංකු අරමුදල් ව්‍යාපෘති සඳහා වාර්තා කර ඇති මුළු උපයෝජනය ඇ.ඩො මිලියන 153ක් වන අතර, ඉහළම උපයෝජනය වන නාගරික සංවර්ධන අංශය සියයට 29ක දායකත්වයක් ලබාදී ඇත. දෙවන ඉහළම උපයෝජනය වන අධ්‍යාපන හා නිපුණතා සංවර්ධන හා සෞඛ්‍යය හා සමාජ සුභසාධන යන අංශ දෙක විසින් සමස්ත උපයෝජනයෙන් සියයට 16 බැගින් දායක වී ඇත.

# නව සංවර්ධන මූලාරම්භයන්

## දේශගුණික විපර්යාසයන්ට අනුගතවන කෘෂි-වාරි සංවර්ධන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ ගොවි ප්‍රජාවගේ දේශගුණ ප්‍රත්‍යස්ථතා හැකියාව වැඩිදියුණු කිරීම හා ශ්‍රී ලංකාවේ තෝරාගත් දේශගුණික අවදානම් කලාප තුළ වාරි කෘෂිකාර්මික ඵලදායීතාව වැඩිදියුණු කිරීමයි. දේශගුණ ප්‍රත්‍යස්ථ කෘෂිකාර්මික ක්‍රමවේදයන් හා තාක්ෂණයන්ට අනුගතවීම වැඩි කිරීම, කෘෂිකාර්මික ඵලදායීතාව ඉහළ නැංවීම, ඉලක්කගත කුඩා ගොවි සංවිධාන සඳහා වෙළඳපොළ ප්‍රවේශ අවස්ථා වැඩිකිරීම තුළින් එම අරමුණු වලට ළඟා කර ගැනීම මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් අපේක්ෂිතය.

**ණය සාකච්ඡා කරන ලද වසර** 2018
**ණය ප්‍රමාණය** : ඇ.ඩො මිලියන 125
**ක්‍රියාත්මක කරන කාලසීමාව** : 2018 - 2024

## ප්‍රාදේශීය සංවර්ධන ආධාර ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතියෙහි සංවර්ධන ඉලක්කය වනුයේ වගකීමෙන් හා වගවිය යුතු ආකාරයෙන් ප්‍රජාව වෙත සේවා සැපයීම සඳහා පළාත් පාලන ආයතන සවිබල ගන්වමින් පළාත්වල ආර්ථික හා යටිතල පහසුකම් සංවර්ධනයට සහය වීමයි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සමස්ත වගකීම අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය සතු වේ. මෙම ව්‍යාපෘතිය මඟින් උතුරු, නැගෙනහිර, උතුරු මැද හා ඌව පළාත්වල පළාත් පාලන ආයතන 134ක ජනගහනයෙන් අධික අවදානම් කණ්ඩායම් වන අන්ත දිළිඳු කොටස්, කාන්තාවන්, කාන්තා මූලික පවුල්, රැකියා විරහිත තරුණයන්, අබාධ සහිත පුද්ගලයන් ඉලක්ක කරගෙන පළාත් පාලන සැලසුම් ශක්තිමත් කිරීම, පළාත් පාලන සේවා සහ ආර්ථික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ ආර්ථික පොකුරු සහයෝගීතාව, ආයතනික සංවර්ධනය සහ හදිසි ප්‍රතිචාර දැක්වීම තුළින් සිදු කිරීමට අපේක්ෂිතය.

**ණය සාකච්ඡා කරන ලද වසර** 2019
**ණය ප්‍රමාණය** : ඇ.ඩො. මිලියන 70
**ක්‍රියාත්මක කරන කාලසීමාව**: 2019 - 2024

## ප්‍රාථමික සෞඛ්‍යය සේවා ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය

ව්‍යාපෘතියේ පරමාර්ථය වන්නේ රටෙහි තෝරාගත් ප්‍රදේශවල අධි අවදානම් සහිත ජනගහන කාණ්ඩවල බෝ නොවන රෝග හඳුනාගෙන ඒවා පාලනය කිරීම සඳහා ප්‍රාථමික සෞඛ්‍යය සේවා භාවිතා කිරීම හා ගුණාත්මකභාවය ඉහළ නැංවීමයි. ශ්‍රී ලංකාවේ ප්‍රාථමික සෞඛ්‍යාරක්ෂක පද්ධතිය ප්‍රතිසංවිධානය හා ශක්තිමත් කිරීම මඟින් මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතියේ මූලික ප්‍රතිලාභීන් වනුයේ රටේ තෝරාගත් ප්‍රජාවන්හි ප්‍රාථමික සෞඛ්‍යය සේවා (PHC) භාවිතා කරන්නන් වේ. ප්‍රාථමික සෞඛ්‍ය සේවාවන්හි ප්‍රාථමික භාවිතා කරන්නන් ජනගහනයේ දිළිඳු කොටස් වේ. මෙම ව්‍යාපෘතියේ මූලික ඉලක්කය වනුයේ ව්‍යාපෘතිය මඟින් ආධාර සපයන ප්‍රජාවන් තුළ බරපතල හෝ විනාශකාරී නොවන බෝ නොවන රෝග (NCD) ඇතිවීම හෝ වැඩිදියුණු වීමේ අවදානමක් ඇති අය වේ. හැකියා සංවර්ධනය, සහ ප්‍රාථමික සෞඛ්‍යය සේවා සැලසුම් කිරීම හා උපායමාර්ගික ශක්තිමත් කිරීම සඳහා සම්පත් දායකත්වය ඇති කිරීම මඟින් මෙම ව්‍යාපෘතියේ බලපෑම සෞඛ්‍යය සේවකයන්ට ද වාසිදායක වනු ඇත.

**ණය සාකච්ඡා කරන ලද වසර** 2108
**ණය ප්‍රමාණය:** ඇ.ඩො. මිලියන 200
**ක්‍රියාත්මක කරන කාලසීමාව :** 2018 - 2024

# ලෝක බැංකු තාක්ෂණික දූත මණ්ඩල - 2018

| තාක්ෂණික මෙහෙවර | මෙහෙවර දින |
|---|---|
| ශ්‍රී ලංකා බලශක්ති යටිතල පහසුකම් ආංශික ඇගයුම් වැඩසටහන සඳහා තාක්ෂණික මෙහෙවර | මාර්තු 16-30, 2018 |
| රාජ්‍ය අංශයේ කාර්යක්ෂමතාව ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය - තාක්ෂණික මෙහෙවර | මාර්තු 16-30, 2018 |
| විදේශ සංචිත කළමනාකරණය හා කාර්යසාධන සඳහා තාක්ෂණික සහයෝගීතාවය සඳහා මෙහෙවර | මාර්තු 16-30, 2018 |
| උතුරු නැගෙනහිර පළාත් සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (NELSIP) - තාක්ෂණික සහාය මෙහෙවර | මාර්තු 16-30, 2018 |
| ආයෝජන ප්‍රවර්ධන සංඝටක සඳහා තාක්ෂණික සහාය මෙහෙවර | මාර්තු 16-30, 2018 |
| නාගරික ප්‍රවාහන යටිතල පහසුකම් ආංශික ඇගයුම් වැඩසටහන (InfraSAP) - තාක්ෂණික සංචාර | මාර්තු 16-30, 2018 |
| දේශගුණික ප්‍රත්‍යස්ථතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය II (CRIP II), AIIB සමඟ ඒකාබද්ධ තාක්ෂණික මෙහෙවර | මාර්තු 16-30, 2018 |
| දේශගුණික විපර්යාස අවම කිරීමේ ක්‍රියාකාරකම් සඳහා සහයෝගීතා ව්‍යාපෘතිය (P106552), තාක්ෂණික මෙහෙවර | මාර්තු 16-30, 2018 |
| දේශගුණික ප්‍රත්‍යස්ථතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය I (CRIP I), තාක්ෂණික මෙහෙවර | මාර්තු 16-30, 2018 |
| කොළඹ අගනගර පරිවර්තන ක්‍රමවේදය - තාක්ෂණික මෙහෙවර | මාර්තු 16-30, 2018 |
| වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම් ව්‍යාපෘතිය - තාක්ෂණික මෙහෙවර | මාර්තු 16-30, 2018 |
| ප්‍රාථමික සෞඛ්‍යය සේවා පද්ධති ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය පිළිබඳ පූර්ව ඇගයීම පිළිබඳ මෙහෙවෙර | මාර්තු 16-30, 2018 |
| ආපදා අවදානම් මූල්‍යකරණය සහ රක්ෂණය හා පුළුල් ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධන සඳහා යෝග්‍ය පරිසරයක් නිර්මාණය කිරීම. | මාර්තු 16-30, 2018 |
| රාජ්‍ය අංශයේ කාර්යක්ෂමතාව ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය - තාක්ෂණික මෙහෙවර | මාර්තු 16-30, 2018 |
| ස්වභාවික ගංවතුර අනාවැකිකරණ හා පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතියක් ස්ථාපිත කිරීම පිළිබඳ තාක්ෂණික මෙහෙවර | මාර්තු 16-30, 2018 |
| ශ්‍රී ලංකාව තුළ වෙළෙඳ හා තරඟකාරිත්වය වැඩි දියුණු කිරීම සඳහා තාක්ෂණික සහාය මෙහෙවර | මාර්තු 26-29,2018 |
| ශ්‍රී ලංකා ශ්‍රම වෙළඳපොළ අභියෝග පිළිබඳ ඉදිරි දර්ශන - තාක්ෂණික මෙහෙවර | අප්‍රේල් 2-7, 2018 |
| ශ්‍රී ලංකා බලශක්ති යටිතල පහසුකම් අංශයේ ඇගයුම් වැඩසටහන - තාක්ෂණික මෙහෙවර | අප්‍රේල් 30- මැයි 11, 2018 |
| ජනගහනය හා දරිද්‍රතාවය පිළිබඳව ප්‍රදේශීය ලේකම් කොට්ඨාශයන්හි තක්සේරු කිරීමේ යාවත්කාලීන කිරීම සඳහා වූ තාක්ෂණික මෙහෙවර | මැයි 21 - ජූනි 1, 2018 |
| වැඩිහිටියන් සඳහා ආදායම් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා - තාක්ෂණික මෙහෙවර | මැයි 21 - ජූනි 1, 2018 |
| ශ්‍රී ලංකා බලශක්ති යටිතල පහසුකම් සඳහා ආංශික ඇගයුම් වැඩසටහන - තාක්ෂණික මෙහෙවර | මැයි 28 - ජූනි 11, 2018 |
| වැවිලි අංශයේ දායකත්වය - තාක්ෂණික සහාය මෙහෙවර | මැයි 31- ජූනි 5, 2018 |
| දේශගුණික විපර්යාස බලපෑම අවම කිරීමේ ක්‍රියාකාරී ව්‍යාපෘතිය (P160552) - තාක්ෂණික මෙහෙවර | ජූලි 2-6, 2018 |
| ප්‍රාථමික සෞඛ්‍යය සේවා පද්ධතිය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය - තාක්ෂණික සහාය මෙහෙවර | ජූලි 2-6, 2018 |
| ප්‍රත්‍යස්ථ තාක්ෂණික ආධාර විෂය පරාසය සඳහා නීති පද්ධති සැකසීම පිළිබඳව - තාක්ෂණික මෙහෙවර | ජූලි 25-27, 2018 |
| ජනගහනය හා දරිද්‍රතාවය පිළිබඳව ප්‍රදේශීය ලේකම් කොට්ඨාශයන්හි තක්සේරු කිරීමේ යාවත්කාලීන කිරීම සඳහා වූ තාක්ෂණික මෙහෙවර | අගෝස්තු 1-7, 2018 |
| ජනගහනය හා දරිද්‍රතා මෙහෙවරේ ප්‍රගති සමාලෝචනය කිරීම සඳහා තාක්ෂණික සහාය | අගෝස්තු 6-17, 2018 |
| ජාතික ජල ගැලීම් පුරෝකථන හා පූර්ව අනතුරු ඇඟවීම් පද්ධතියක් පිහිටුවීම පිළිබඳ - තාක්ෂණික මෙහෙවර | අගෝස්තු 6-17, 2018 |
| වෙළඳ ප්‍රතිපත්ති සහ වෙළඳ පහසුකම් සැලසීම පිළිබඳව තාක්ෂණික සහාය | අගෝස්තු 13-16,2018 |
| වැඩිහිටි සත්කාර ව්‍යාපෘතිය - තාක්ෂණික මෙහෙවර | සැප්තැම්බර් 10 - 17, 2018 |
| දේශගුණික ප්‍රත්‍යස්ථතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (CRIP) පිළිබඳ මෙහෙවර | සැප්තැම්බර් 17-22, 2018 |
| ජාතික ස්වභාවික ආපදා රක්ෂණ ක්‍රම - තාක්ෂණික මෙහෙවර | සැප්තැම්බර් 24-28, 2018 |
| ප්‍රාදේශීය සංවර්ධන ආධාර ව්‍යාපෘතිය - තාක්ෂණික මෙහෙවර | ඔක්තෝම්බර් 7-12, 2018 |
| වෙළඳ ප්‍රතිපත්ති සහ වෙළඳ පහසුකම් සැලසීම පිළිබඳ - තාක්ෂණික සහාය | ඔක්තෝම්බර් 8-19, 2018 |
| ශ්‍රී ලංකා දේශගුණික ප්‍රත්‍යස්ථතා වැඩසටහන බහු අවධි ක්‍රමෝපායික ප්‍රවේශය - තාක්ෂණික මෙහෙවර | ඔක්තෝම්බර් 20-26, 2018 |
| ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘතිය | ඔක්තෝම්බර් 26 - නොවැම්බර් 2, 2018 |

# මැදපෙරදිග හා දකුණු ආසියා අංශය

## මැදපෙරදිග

1970 දශකයේ මැද භාගයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ සමාජයීය හා ආර්ථික සංවර්ධනය කෙරෙහි මැදපෙරදිග සංවර්ධන පාර්ශ්වකරුවන් විසින් කැපී පෙනෙන මෙහෙයක් සිදු කරනු ලබයි.

මැදපෙරදිග ද්විපාර්ශ්වීය සංවර්ධන පාර්ශ්වකරුවන් වන සංවර්ධනය සඳහා වන සෞදි අරමුදල (SFD), අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වන කුවේට් අරමුදල (KFAED) හා ඉස්ලාමීය ඉරාන අපනයන සංවර්ධන බැංකුව (EDBI) මෙන්ම බහුපාර්ශ්වීය ආයතන වන අන්තර්ජාතික සංවර්ධනය සඳහා වන ඔපෙක් අරමුදල (OFID) සහනදායී ණය හා අපනයන ණය පහසුකම් හරහා ශ්‍රී ලංකාව වෙත සිය මහඟු දායකත්වය ලබා දෙනු ලබයි. එමෙන්ම බහරේන් රජය, කසකස්ථාන රජය සහ ඕමාන රජය විසින් ශ්‍රී ලංකාවේ සංවර්ධන ව්‍යාපෘති සඳහා ප්‍රදාන ද ලබා දී ඇත.

1975 සිට මේ දක්වා ව්‍යාපෘති 14ක් සඳහා ඇ.ඩො. මිලියන 281ක ණය ආධාර කුවේට් අරමුදල විසින් ලබා දී ඇත. තවද මොරගහකන්ද කෘෂිකාර්මික හා වාරි කර්මාන්ත සංවර්ධන ව්‍යාපෘතියෙහි ශක්‍යතා අධ්‍යයනය සහ මොරගොල්ල ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය සඳහා ඇ.ඩො මිලියන 2ක ප්‍රදානයක්ද ලබා දී ඇත.

2018 වර්ෂය අවසන් වනවිට මාර්ග, සෞඛ්‍යය, වාරිමාර්ග, ප්‍රජා සංවර්ධනය හා උසස් අධ්‍යාපනය යන ක්ෂේත්‍රයන් සඳහා ඇ.ඩො. මිලියන 386ක පමණ ණය ආධාර සෞදි අරමුදල මගින් ශ්‍රී ලංකාව වෙත ලබාදී ඇත.


ඔපෙක් අරමුදල එහි ආරම්භයේ සිට රාජ්‍ය අංශයේ ණය පහසුකම් ලෙස ඇ.ඩො මිලියන 333ක ණය ලබා දී ඇති අතර, ඉන් වැඩි ප්‍රමාණයක් මාර්ග සංවර්ධනය සඳහා ලබා දී ඇත. ඔපෙක් අරමුදලෙහි අනෙකුත් ප්‍රමුඛතා ක්ෂේත්‍ර වන්නේ අධ්‍යාපන, වාරිමාර්ග, විදුලිබල හා බලශක්ති, තේ සංවර්ධනය සහ විද්‍යා හා තාක්ෂණයයි.

උමා ඔය සංවර්ධන බහුකාර්ය ව්‍යාපෘතිය සහ ග්‍රාමීය විදුලියනය ව්‍යාපෘතිය - 8 සඳහා මූල්‍ය ආධාර ලෙස ඇ.ඩො මිලියන 530ක ණය මුදලක් ඉරාන අපනයන සංවර්ධන බැංකුව විසින් ශ්‍රී ලංකා රජය වෙත ලබා දී ඇත. උමා ඔය සංවර්ධන බහුකාර්ය ව්‍යාපෘතියේ මුළු පිරිවැයෙන් සියයට 85ක් එනම් ඇ.ඩො මිලියන 450ක් ලබා දීමට ඉරාන රජය විසින් එකඟතාවය පළ කර තිබුන ද, ඉරානයේ ජාත්‍යන්තර සබඳතා සඳහා සම්බාධක පැනවීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය සඳහා අරමුදල් ලබාදීම නතර කිරීමට සිදුවිය. මේ දක්වා, ඉරාන රජය විසින් මෙම ව්‍යාපෘතිය සඳහා ඇ.ඩො මිලියන 51ක පමණ උපයෝජනය කර ඇත. ඉරානය සහ ශ්‍රී ලංකාව අතර ද්විපාර්ශවික සබඳතා තහවුරු කිරීම සඳහා ඉරාන කොන්ත්‍රාත්කරුවන් යොදවා ශ්‍රී ලංකා රජයේ අරමුදල් මගින් මෙම ව්‍යාපෘතියේ කටයුතු තවදුරටත් කරගෙන යාමට රජය තීරණය කරන ලදී.


තවද, ඉරාන මූල්‍ය ආධාර යටතේ යුරෝ මිලියන 77ක වියදමින් "ග්‍රාමීය විදුලියනය ව්‍යාපෘතිය - 8" ව්‍යාපෘතියද ආරම්භ කර ඇත. එම ව්‍යාපෘති වියදමින් සියයට 75ක ප්‍රමාණයක් එනම් යුරෝ මිලියන 58ක් මූල්‍යකරණය කිරීමට ඉරානය සිය එකඟතාවය ලබා දී ඇත. එසේම මෙම ව්‍යාපෘතිය සඳහා ඉරානය විසින් යුරෝ මිලියන 32ක් උපයෝජනය කර ඇත.

මැදපෙරදිග කලාපයෙන් ලබා ගන්නා ණය අරමුදල් බොහොමයක් වාරිමාර්ග, මාර්ග හා පාලම්, බලශක්ති හා සෞඛ්‍යය ක්ෂේත්‍ර සඳහා ආයෝජනය කර ඇත. මෙම ණය පහසුකම්වලට අදාළ ප්‍රසම්පාදන නිර්දේශයන් වැනි මැදපෙරදිග සංවර්ධන පාර්ශ්වකරුවන්ගේ නම්‍යශීලී කොන්දේසි මෙන්ම සහනදායි පොළී අනුපාතික සහ දීර්ඝ නැවත පියවීමේ කාලය ශ්‍රී ලංකාව වෙත වඩා වාසිදායක වේ.

### මැදපෙරදිග සංවර්ධන පාර්ශ්වකරුවන් සමඟ ඇතිකරගත් මුළු එකඟතා (ඇ.ඩො. මිලියන)





### මැදපෙරදිග සංවර්ධන පාර්ශ්වකරුවන් සමඟ ඇතිකරගත් ක්ෂේත්‍ර එකඟතා (ඇ.ඩො. මිලියන)




## 2018 වසරේදී උපයෝජන

2018 වර්ෂයේදී මැදපෙරදිග සංවර්ධන පාර්ශ්වකරුවන් වෙතින් ඇ.ඩො. මිලියන 51ක් උපයෝජනය වී ඇත.



## 2018 වසරේදී මැදපෙරදිග සංවර්ධන පාර්ශ්වකරුවන් විසින් ලබාදුන් ආංශික එකඟතා

ශ්‍රී ලංකා රජය විසින් 2018 වර්ෂය තුළ දී සෞදි අරමුදල හා ඔපෙක් අරමුදල සමඟ පහත ව්‍යාපෘති සඳහා ණය ගිවිසුම් අත්සන් කරන ලදී



**සංවර්ධනය සඳහා වන සෞදි අරමුදල**

**ඇ.ඩො මිලියන 16**

**කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය - අතිරේක මූල්‍යයනය**

අනපේක්ෂිත භූගෝල තත්ත්වයන් හේතුවෙන් අත්තිවාරම්වල සිදුවූ වෙනස්වීම් සහ සැලසුම්වල සිදුවූ අත්‍යවශ්‍ය සංශෝධනයන් හේතුවෙන් කළුගඟ සංවර්ධන ව්‍යාපෘතියෙහි පිරිවැය ඉහළ යාමක් සිදුවිය. මේ හේතුවෙන් සෞදි අරමුදල, කුවේට් අරමුදල හා ඔපෙක් අරමුදල විසින් ණය මුදලක් ලබාදීමට එකඟ වූ අතර සෞදි අරමුදල සමඟ 2018 ජුලි 18 වන දින ඒ සඳහා ණය ගිවිසුම් අත්සන් කරන ලදී

**අන්තර්ජාතික සංවර්ධනය සඳහා වන ඔපෙක් අරමුදල**

**ඇ.ඩො මිලියන 50**

**තාක්ෂණික අධ්‍යාපන සංවර්ධන වැඩසටහන**

පාසල් සඳහා තාක්ෂණ විද්‍යාගාර ඉදිකිරීම සහ අවශ්‍ය යන්ත්‍ර සහ උපකරණ ලබා දීම මෙම ව්‍යාපෘතියේ අපේක්ෂාවයි. 2018 ජූලි 03 වන දින වියානා හි ඔපෙක් අරමුදල් මූලස්ථානයේ දී මේ සඳහා වන ණය ගිවිසුම් අත්සන් තබන ලදී.



## 2018 වසරේදී ක්‍රියාත්මක වූ ව්‍යාපෘති

| මැද පෙරදිග අංශය ක්‍රියාත්මක වන ව්‍යාපෘති | ණය මුදල (ඇ.ඩො මිලියන) |
|---|---|
| **සංවර්ධනය සඳහා වන සෞදි අරමුදල** | |
| අපස්මාර රෝහල හා සෞඛ්‍ය මධ්‍යස්ථාන ව්‍යාපෘතිය | 12.0 |
| කළු ගඟ සංවර්ධන ව්‍යාපෘතිය - අතිරේක මූල්‍යයනය | 16.0 |
| මාර්ග ජාලා සංවර්ධන ව්‍යාපෘතිය | 60.0 |
| බදුල්ල සිට චෙන්කලාඩි දක්වා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 60.0 |
| කළුගඟ වම් ඉවුරු සංවර්ධන ව්‍යාපෘතිය | 45.0 |
| වයඹ විශ්වවිද්‍යාල නාගරික සංවර්ධන ව්‍යාපෘතිය | 28.0 |
| **අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වන කුවේට් අරමුදල** | |
| අග්නිදිග විශ්වවිද්‍යාල සංවර්ධන ව්‍යාපෘතිය (B –I අදියර) | 11.0 |
| කළු ගඟ සංවර්ධන ව්‍යාපෘතිය - අතිරේක මූල්‍යයනය | 16.0 |
| පාලම් 25ක් ප්‍රතිසංස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය | 35.0 |
| නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞඛ්‍යය ආරක්ෂණ විද්‍යා පීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම | 33.0 |
| **අන්තර් ජාතික සංවර්ධනය සඳහා වන ඔපෙක් අරමුදල** | |
| මාර්ග ජාලා සංවර්ධන ව්‍යාපෘතිය | 40.0 |
| කොළඹ ජාතික මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය | 50.0 |
| බස්නාහිර පළාත් සංවර්ධන ව්‍යාපෘතිය | 17.0 |
| A 05 මාර්ගයේ බදුල්ල සිට චෙන්කලාඩි දක්වා ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය | 60.0 |
| කළු ගඟ සංවර්ධන ව්‍යාපෘතිය - අතිරේක මූල්‍යයනය | 18.0 |

## මැදපෙරදිග සංවර්ධන පාර්ශ්වකරුවන්ගේ අනාගත ආයෝජනයන්

2019 වසර තුළදී පහත දැක්වෙන ව්‍යපෘති මූල්‍යයනය කිරීම සඳහා මැදපෙරදිග සංවර්ධන පාර්ශ්වකරුවන් සමඟ ණය ගිවිසුම් වෙත එළඹීමට අපේක්ෂා කරනු ලැබේ.

**අන්තර් ජාතික සංවර්ධනය සඳහා වන ඔපෙක් අරමුදල**

- **A 017 මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (රක්වාන සිට සූරියකන්ද දක්වා)**
- ඇ.ඩො. මිලියන 40
- මෙම ව්‍යාපෘතිය යටතේ දකුණු හා සබරගමු පළාත් යා කරමින් කි.මී 18ක 'A' පංතියේ මාර්ග තීරුවක් වැඩිදියුණු කිරීමට අපේක්ෂිතය.

**සංවර්ධනය සඳහා වන සෞදි අරමුදල**

- **සබරගමුව විශ්වවිද්‍යාලයෙහි වෛද්‍ය පීඨයක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය**
- ඇ.ඩො මිලියන 50
- මෙම ව්‍යාපෘතිය මඟින් වෛද්‍ය පීඨ සඳහා ඇතුළත් කර ගන්නා ශිෂ්‍ය/ ශිෂ්‍යාවන්ගේ ප්‍රමාණය ඉහළ නැංවීමට හැක.

- ඉහත දැක්වෙන ව්‍යාපෘති වලට අතිරේකව, මොරටුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයක් ස්ථාපිත කිරීමට අදාළ ව්‍යාපෘති යෝජනාව කුවේට් අරමුදල වෙත ලබා දී ඇති අතර, එම ව්‍යාපෘතියේ මුළු පිරිවැය රුපියල් මිලියන 8,011 (ආසන්න වශයෙන් කුවේට් ඩිනාර් මිලියන 15)
- තවද පේරාදෙණිය ශික්ෂණ රෝහල සඳහා තට්ටු 14ක මධ්‍යම බහුකාර්ය ගොඩනැගිල්ලක් ඉදිකිරීමට අදාළ ව්‍යාපෘති යෝජනාව ඔපෙක් අරමුදල වෙත ලබා දී ඇත. මෙම ව්‍යාපෘතියේ මුළු පිරිවැය රුපියල් මිලියන 7,950වේ. (ආසන්න වශයෙන් ඇ.ඩො. මිලියන 46කි)

# දකුණු ආසියාව

## ඉන්දියාව

වර්තමානයේදී, ප්‍රධාන වශයෙන්ම ආර්ථික යටිතල පහසුකම් පුළුල් කිරීම, ජීවනෝපාය සංවර්ධනය, අධ්‍යාපනය, සෞඛ්‍යය, ධාරිතා සංවර්ධනය, ආර්ථික නවීකරණය යන ක්ෂේත්‍ර සඳහා ණය, ප්‍රදාන සහ තාක්ෂණික ආධාර යන ක්‍රමවේද ඔස්සේ ඉන්දියානු සංවර්ධන සහායන් ශ්‍රී ලංකාව වෙත ලබා දේ.

### 2018 වර්ෂයේ ක්‍රියාත්මක වන ඉන්දීය ණය මූල්‍යයන

**ණය මාලාව**

ණය මාලාවක් යනු අනුමත උපරිම සීමාවක් තුල අවශ්‍යතාවය පරිදි කොටස් වශයෙන් ගැනීම සඳහා විදේශ බැංකුවක් හෝ ණය දෙන ආයතනයක් විසින් සපයනු ලබන ණය පහසුකමකි. එම සීමාව තුළින් ගනු ලබන ණය මුදල සඳහා පමණක් පොළී අයකරනු ලබයි.

- ත්‍රිවිධ හමුදාවට සහ පොලීසියට උපකරණ සැපයීම/මිලදී ගැනීම - ඇ.ඩො. මිලියන 100
- උතුරු දුම්රිය මාර්ගය යළි ඉදිකිරීම - ඇ.ඩො. මිලියන 416 ක් හා - ඇ.ඩො. මිලියන 382ක්.
- දුම්රිය ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම - ඇ.ඩො. මිලියන 318ක්.
- කන්කසන්තුරේ වරාය සංවර්ධනය කිරීම - ඇ.ඩො. මිලියන 45.27ක්.


**ගැනුම්කරුගේ ණය පහසුකම්**

භාණ්ඩ හෝ සේවාවන් මිලදී ගැනීම සඳහා සම්පාදනය කරනු ලබන ණය පහසුකමකි.

- විසල් දඹුල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය - ඇ.ඩො. මිලියන 60.69
- ශ්‍රී ලංකා නාවික හමුදාවට අධි තාක්ෂණික නෞකා මිලදී ගැනීම - ඇ.ඩො. මිලියන 124
- අලව්ව, පොතුහැර සහ පොල්ගහවෙල ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය - ඇ.ඩො. මිලියන 91.8
- අළුත්ගම, මතුගම සහ අගලවත්ත ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය - ඇ.ඩො. මිලියන 164.9

## ණය ආධාර යටතේ එකඟතා සහ උපයෝජන

කන්කසන්තුරේ වරාය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ඇ.ඩො. මිලියන 45ක ණය මුදලට අදාළ ගිවිසුම 2018 වර්ෂයේ දී අත්සන් තබන ලද අතර, 2018 වර්ෂයේ වාර්ෂික උපයෝජනය ඇ.ඩො. මිලියන 49ක් වේ.




## ඉන්දියානු ප්‍රදාන මූලාරම්භයන්

ඉන්දියානු රජය විසින් විශේෂ සංවර්ධන ව්‍යාපෘති සහ කුඩා සංවර්ධන ව්‍යාපෘති යෝජනා ක්‍රම තුළින් ප්‍රදාන ආධාර සම්පාදනය කරනු ලබයි.

| විශේෂ සංවර්ධන ව්‍යාපෘති | කුඩා සංවර්ධන ප්‍රදාන ව්‍යාපෘති |
| --- | --- |
| උතුරු, නැගෙනහිර, මධ්‍යම සහ ඌව පළාත්වල නිවාස ඒකක 50,000ක් ඉදිකිරීම සඳහා විශේෂ සංවර්ධන ව්‍යාපෘති යෝජනා ක්‍රමය යටතේ ශ්‍රී ලංකා රජය වෙත ඇ.ඩො. මිලියන 270ක ප්‍රදාන ආධාර ලබා දී ඇත.<br><br>මෙම ව්‍යාපෘතිය “UN හැබිටෑට්” (UNHABITAT), අන්තර්ජාතික රතුකුරුස සංවිධානය (IFRC), Habitat for Humanity Sri Lanka සහ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලබයි. අවශේෂ නිවාස 131ක් හැරුණු විට 46,000ක් සම්පූර්ණ කර ඇති අතර ඉතිරි නිවාස 4,000 ඌව හා මධ්‍යම පළාත තුළ ඉදිකිරීමට අපේක්ෂිතය. මේ යටතේ නිවාස 1,000ක් මේ වනවිට ඉදිකර අවසන් වීමට ආසන්න වන අතර ඉතිරි නිවාස 3,000, 2019 වර්ෂයේ මැද වනවිට අවසන් කිරීමට නියමිත වේ. | ඉන්දියානු රජය විසින් කුඩා සංවර්ධන ව්‍යාපෘති කාණ්ඩය යටතේ ව්‍යාපෘතියක් සඳහා උපරිමය රුපියල් මිලියන 300 දක්වා ප්‍රදාන ආධාර ලබාදෙනු ලබයි. මෙම කාණ්ඩය යටතේ පහත සඳහන් අංශ කෙරෙහි විශේෂ සැළකිල්ලක් යොමු කරමින් ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත. එම අංශ වන්නේ නැවත පදිංචි කිරීම, ජීවනෝපාය සංවර්ධනය, කාන්තාවන් සවිබල ගැන්වීම, වෘත්තීය පුහුණුව, රැකියා උත්පාදනය, අධ්‍යාපනය හා පර්යේෂණ, සංස්කෘතික ක්‍රියාකාරකම්, ක්‍රීඩා, කර්මාන්ත සංවර්ධනය, රෝහල් හා වෛද්‍ය මධ්‍යස්ථානයන්හි යටිතල පහසුකම් සංවර්ධනය සහ වෛද්‍ය උපකරණ සැපයීම යන අංශයන්ය. |

## ශ්‍රී ලංකාව තුළ හදිසි පූර්ව රෝහල් ප්‍රතිකාර ගිලන් රථ සේවාවක් ස්ථාපිත කිරීම

ශ්‍රී ලංකාව තුළ මාර්ග අනතුරු, හෘද රෝග, විෂ ශරීර ගතවීම්, හදිසි ආපදා තත්ත්වයන්, කම්පනය (Traumas) ආදී විවිධ හේතූන් නිසා හදිසි වෛද්‍ය ප්‍රතිකාර සඳහා වන අවශ්‍යතාවය වේගයෙන් ඉහළ යමින් පවතී. මෙම තත්ත්වය තුළ හදිසි අවස්ථාවන්ට ගොදුරුවූවන්ගේ ජීවිත රැක ගැනීම සඳහා වහාම වෛද්‍ය ප්‍රතිකාර ලබාදීම අත්‍යවශ්‍ය කරුණකි. මෙම අවශ්‍යතාවය හඳුනාගත් ශ්‍රී ලංකා රජය, ඉන්දියානු රජයේ සහයෝගය ඇතිව, ශ්‍රී ලංකාව තුළ හදිසි පූර්ව රෝහල් ප්‍රතිකාර ගිලන් රථ සේවාවක් ස්ථාපිත කිරීම සඳහා මූලික අඩිතාලම දමන ලදී. මෙම ව්‍යාපෘතිය 2018 වර්ෂයේ දී අවසන් වූ අතර, දීප ව්‍යාප්තව ගිලන් රථ 297ක් ලබා දී ඇත. එසේම, මෙම ව්‍යාපෘතිය හේතුවෙන් දුෂ්කර පළාත් වල ජීවත්වන ජනතාවගේ හදිසි අවශ්‍යතාවයන්හි දී සාර්ථකව ක්‍රියාත්මක වීමට හැකියාව ලැබුණු අතර, ඉන්දියානු රජය විසින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ඇ.ඩො. මිලියන 22.06ක ප්‍රදාන ආධාර ලබා දෙන ලදී.

පාර්ලිමේන්තුවේ සම්මත කරගත් පනතක් මඟින් "1990 සුවසැරිය පදනම" මේ වනවිට ස්ථාපනය කර ඇත. ඉන්දියානු ප්‍රදාන ආධාර මඟින් ක්‍රියාත්මක කරන ලද සියලුම ව්‍යාපෘති කාර්යයන් මේ වන විට අවසන් කර ඇති අතර, ව්‍යාපෘතියේ සියලුම වත්කම් හා ගිලන් රථ 297ක් මේ වනවිට රජය හිමිකම් දරණ ඉහත සුවසැරිය පදනම වෙත ලබා දී අතර, එම පදනම යටතේ ව්‍යාපෘතිය ඉදිරියේ දී ක්‍රියාත්මක වනු ඇත.

## 2018 වසරේදී ක්‍රියාත්මක ප්‍රදාන

| ව්‍යාපෘති | (රුපියල් මිලියන) |
|---|---|
| හදිසි පූර්ව රෝහල් ප්‍රතිකාර ගිලන් රථ සේවාවක් ස්ථාපිත කිරීම | 3,530(ඇ.ඩො.මි22) |
| නිවාස ඒකක 5,0000ක් ඉදිකිරීම - විශේෂ සංවර්ධන ව්‍යාපෘති | 43,200(ඇ.ඩො.මි 270) |
| නිවාස ඒකක 10,000ක් ඉදිකිරීම - විශේෂ සංවර්ධන ව්‍යාපෘති | 11,200(ඇ.ඩො.මි 70) |
| යාපනය නව සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීම | 1,800(ඇ.ඩො.මි 11.35) |
| උතුරු පළාතේ පාසැල් 27ක් ප්‍රතිසංස්කරණය කිරීම | 250 |
| මඩකලපුව ශික්ෂණ රෝහලේ ශල්‍ය කර්ම ඒකකයක් ඉදිකිරීම සහ වෛද්‍ය උපකරණ සැපයීම | 275 |
| මහනුවර, පල්ලෙකැලේ දළඳා මාළිගාව සඳහා පුහුණු පාසලක් ස්ථාපිත කිරීම | 145 |
| යාපනය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු හා කෘෂිකර්ම පීඨයන් සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් සහ අවශ්‍ය පහසුකම් සම්පාදනය කිරීම | 600 |
| මඩකලපුව දිස්ත්‍රික්කයේ සනීපාරක්ෂක ඒකක /වැසිකිළි 3,400ක් ඉදිකිරීම | 300 |
| මඩු, මන්නාරම් හි අඩු වියදම් නිවාස 300ක් ඉදිකිරීම | 300 |
| ආදර්ශ ගම්මාන නිවාස ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 25 තුළ නිවාස 600ක් ඉදිකිරීම | 300 |
| පොළොන්නරුව, ත්‍රෛභාෂා පාසැලක් ඉදිකිරීම | 300 |
| හැටන් තොන්ඩමන් වෘත්තීය මධ්‍යස්ථානය නවීකරණය කිරීම | 199 |
| යාපනය දිස්ත්‍රික්කයේ වැසි ජල එකතුකිරීමේ පද්ධති 3,000ක් ඉදිකිරීම | 294 |
| නැගෙනහිර විශ්වවිද්‍යාලයේ, ස්වාමි විපුලානන්ද සෞන්දර්යය පීඨය නවීකරණය කිරීම | 275 |
| අනුරාධපුර සෝභිතගිමි ගම්මානයේ නිවාස 153ක් ඉදිකිරීම සහ යටිතල පහසුකම් සම්පාදනය කිරීම | 300 |
| නුවරඑළිය, පුස්සැල්ලාව සරස්වතී විද්‍යාලය වැඩි දියුණු කිරීම | 95 |
| දකුණු පළාතේ ග්‍රාම ශක්ති නිවාස ව්‍යාපෘතිය | 300 |
| උතුරු පළාතේ ග්‍රාම ශක්ති නිවාස ව්‍යාපෘතිය | 300 |
| දඹුල්ලේ උෂ්ණත්ව පාලක ගබඩා සංකීර්ණයක් ස්ථාපිත කිරීම | 300 |

# පාකිස්තානය

පාකිස්තානයෙන් ලබාගත් ප්‍රථම ණය ආධාරය වන ඇ.ඩො. මිලියන 5ක් 1991 වර්ෂයේ දී දුම්රිය බලවේග කට්ටල මිලදී ගැනීම සඳහා ලබා ගෙන ඇත. තවදුරටත්, පාකිස්තානු රජය විසින් ඇ.ඩො. මිලියන 50ක් වන ණය මාලාවක් වර්ෂ 2006 දී ආරක්ෂක අංශ වෙත පිරිනමා ඇත. තවද පාකිස්තානු රජය විසින් ඇ.ඩො. මිලියන 10ක ණය මාලාවක් 2017 වර්ෂයේදී පිරිනමා ඇත.

වර්ෂ 2014 දී මන්නාරම සහ වව්නියා දිස්ත්‍රික්කවල අවතැන්වූවන් සඳහා වූ නිවාස වැඩසටහනට ඇ.ඩො. මිලියන 1ක ප්‍රදාන ආධාර පාකිස්තානයෙන් ලබා ගෙන ඇත. මෙම ව්‍යාපෘතිය මේ වන විටත් ක්‍රියාත්මක වෙමින් පවතී. මීට අමතරව, සංවර්ධන ව්‍යාපෘති 06ක් ක්‍රියාත්මක කිරීම සඳහා ඇ.ඩො. 350,000ක ප්‍රදාන ආධාර 2014 වර්ෂයේ දී ප්‍රදානය කොට ඇත.

පාකිස්තානු රජය විසින් ඇ.ඩො. මිලියන 200ක ණය මාලාවක් ශ්‍රී ලංකාව වෙත ලබාදීමට එකඟ වී ඇති අතර, එහි කොන්දේසි හා නියමයන් සම්බන්ධයෙන් මේ වනවිට විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හා පාකිස්තානු බලධාරීන් අතර සාකච්ඡා පැවැත්වේ.

# දියුණු ආර්ථික අංශය

## දියුණු ආර්ථිකයන් සමඟ සංවර්ධන සහයෝගීතාවය

බටහිර අර්ධ ගෝලීය රටවලින් මෙන්ම ඕස්ට්‍රේලියාව, නවසීලන්තය, සහ රුසියාව වැනි රටවලින්ද නිල සංවර්ධන සහායයන් එක් රැස් කිරීම විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ දියුණු ආර්ථික අංශය මඟින් සිදු කෙරේ. ජර්මනිය, නෙදර්ලන්තය, යුරෝපා සංගමය, ඇමරිකා එක්සත් ජනපදය, ප්‍රංශය, ස්පාඤ්ඤය, ඔස්ට්‍රියා, බෙල්ජියම, රුසියාව, ඕස්ට්‍රේලියාව, එක්සත් රාජධානිය, හංගේරියාව හා පින්ලන්තය යන රටවල් මෙම කලාපය තුළ ශ්‍රී ලංකාවට මූල්‍ය සහන ලබාදෙන ප්‍රධාන පාර්ශ්වකරුවෝ වෙති.


2010 වසරේදී ශ්‍රී ලංකාව මැදි ආදායම් ආර්ථිකයක් දක්වා ක්‍රමයෙන් වෙනස්වීමත් සමඟ බටහිර රටවලින් හා ණය නියෝජිතායතනවලින් ලැබෙන මූල්‍යයන්හි සංයුතිය හා ස්වරූපය සැලකිය යුතු පරිදි වෙනස් වී ඇත. අඩු පොළී අනුපාතිකයන් සමඟ ලැබෙන සහනදායී මූල්‍යයන්හි අඩුවීම හේතු කොටගෙන මෙකී රටවලින් හා ආයතනවලින් ලබාගන්නා සංවර්ධන සහය සහනදායී නොවන හා සහනදායී ණය පහසුකම්හි සංකලනයක් සහ අපනයන ණය පහසුකම් දක්වා විතැන් වීමකට ලක්වී ඇත.

මෙකී මූල්‍යයනයන් ප්‍රධාන වශයෙන්, අපනයන ණය, වාණිජ ණය, සහනදායී ණය ආධාර සහ ප්‍රදාන ආධාර යන ස්වරූපයන්ගෙන් ලබාගන්නා ලදි. බටහිර රටවලින් ලැබෙන සහනදායී නොවන ණයවලින් වැඩි ප්‍රමාණයක් මාර්ග, පාලම් හා ජල සම්පාදන වැනි කඩිනම් සහ ප්‍රමුඛ සංවර්ධන ව්‍යාපෘති සඳහා මෙන්ම ජනතාව සඳහා ගුණාත්මක, උසස් තාක්ෂණික හා විශ්වාසනීය සෞඛ්‍යාරක්ෂණ පහසුකම් සලසාදීමේ අරමුණින් යුතුව රෝහල් සංවර්ධනය සහ සෞඛ්‍යාරක්ෂණ පහසුකම් වැඩිදියුණු කිරීම වැනි සමාජ යටිතල පහසුකම් ව්‍යාපෘති සම්පූර්ණ කිරීම සඳහා භාවිතා කරනු ලැබ ඇත.

## එකඟතා හා උපයෝජන

දියුණු ආර්ථිකයන්ගේ 2007 - 2018 කාල පරිච්ඡේදය තුළ ලැබූ මූල්‍ය එකඟතා සහ උපයෝජන (ඇ.ඩො මිලියන)

| | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| එකඟතා | 337 | 439 | 138 | 547 | 124 | 234 | 488 | 370 | 224 | 713 | 177.27 | 349 |
| උපයෝජන | 264 | 313 | 295 | 361 | 202 | 223 | 312 | 246 | 307 | 233 | 188.61 | 196 |




## 2018 වසරේදී සිදුකරන ලද විදේශීය මූල්‍ය එකඟතාවයන්

2018 වසරේදී දියුණු ආර්ථිකයන්ගෙන් අපනයන ණය, සහනදායී ණය සහ ප්‍රදාන ආධාර යටතේ පිරිනමන ලද පහත සඳහන් ව්‍යාපෘති වලට අදාළ මූල්‍ය පහසුකම් ලබාගැනීමට අදාළ පියවරයන් ගනු ලැබීය.

## 2018 වර්ෂයේ එකඟතාවයන්

| සංවර්ධන පාර්ශ්වකරු | ව්‍යාපෘතිය | මුදල (ඇ.ඩො.මිලියන) |
|---|---|---|
| ප්‍රංශ සංවර්ධන ආයතනය (AFD) | හරිත බලශක්ති සංවර්ධන හා බලශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - අදියර 2 | 34.7 |
| නෙදර්ලන්තයේ අයි.එන්.ජී බැංකුව | හෙම්මාතගම ජල සම්පාදන යෝජනා ක්‍රමය | 96.5 |
| ඕස්ට්‍රේලියා රජය | සංවර්ධනය සඳහා යහපාලන වැඩසටහන | 25.0 |
| නෙදර්ලන්තයේ රාබෝ බැංකුව | ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය | 59.1 |
| ප්‍රංශ රජය | කුඩා ප්‍රමාණයේ කිරි සැකසීමේ මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම | 16.2 |
| ඔස්ට්‍රියාවේ ERSTE බැංකුව | මෙහෙයුම් ශල්‍යාගාර සහ ICU උපකරණ වැඩි දියුණු කිරීම | 11.3 |
| ඔස්ට්‍රියාවේ යුනික්‍රෙඩිට් බැංකුව | රජරට හා නැගෙනහිර විශ්වවිද්‍යාලවල වෛද්‍ය විද්‍යා පීඨවලට සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍යය විද්‍යා පීඨයට අවශ්‍ය වෛද්‍ය උපකරණ සැපයීම | 6.1 |
| ඔස්ට්‍රියාවේ යුනික්‍රෙඩිට් බැංකුව | ඔරුගොඩවත්ත අඹතලේ මාර්ග සංවර්ධන ව්‍යාපෘතියට සමගාමීව ජලනල පද්ධතිය වැඩිදියුණු කිරීම | 62.7 |
| ඔස්ට්‍රියාවේ යුනික්‍රෙඩිට් බැංකුව | කිරම - කටුවන ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය | 13.0 |
| ඇමරිකා එක්සත් ජනපදය | ශ්‍රී ලංකා රජය සහ සහශ්‍ර අභියෝග ආයතනය (MCC) අතර, කම්පැක්ට් (Compact) ගිවිසුම (අතිරේක ප්‍රතිපාදන) | 2.6 |
| USAID | සමාජ ඒකාබද්ධතාවය සහ ප්‍රජාතාන්ත්‍රික ප්‍රතිසංස්කරණ උදෙසා වූ සහයෝගීතාවය ශක්තිමත් කිරීමේ වැඩසටහන | 9.7 |
| USAID | තිරසාර සහ ආවරණීත ආර්ථික වර්ධනයක් ඇතිකිරීමේ වැඩසටහන | 12.4 |



## 2018 වසරේදී සම්මුති සාකච්ඡා පවත්වන ලද ව්‍යාපෘතීන්

2018 වසරේදී පහත සඳහන් ප්‍රධාන ව්‍යාපෘතීන් සඳහා දියුණු ආර්ථිකයන් සමඟ ණය සම්මුති සාකච්ඡා නිම කරන ලදි.

| සංවර්ධන පාර්ශ්වකරු | ව්‍යාපෘතිය | මුදල (ඇ.ඩො මිලියන) |
|---|---|---|
| ඔස්ට්‍රියාව | කොළඹ මහනගර සභාව සඳහා ගිනි නිවීමේ වාහන/උපකරණ ලබාදීම. | 11.93 |
| ඔස්ට්‍රියාව | දුම්රිය මාර්ග ජාලය නඩත්තු කිරීම හා ප්‍රසාරණය කිරීම සඳහා දුම්රිය පාලම් හා හැරවුම් මේස සහ ආධාරක සේවා සැපයීම | 8.64 |
| ඔස්ට්‍රියාව | කැළණිය පැරණි දුම්රිය පාලම වෙනුවට නව පාලමක් ඉදිකිරීම | 10.23 |
| බ්‍රසීලය | කඳුරට දුම්රිය මාර්ගයේ ධාවනය සඳහා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට දුම්රිය එන්ජින් හා මැදිරි ප්‍රසම්පාදනය කිරීම - දුම්රිය එන්ජින් 12 ක් මිලදී ගැනීම | 49.00 |
| ඇමරිකා එක්සත් ජනපදය | ශ්‍රී ලංකා රජය සහ සහශ්‍ර අභියෝග ආයතනය (MCC) අතර කම්පැක්ට් (Compact) ගිවිසුම | 480.00 |
| ප්‍රංශ සංවර්ධන ආයතනය | රත්මලාන /මොරටුව අපජල බැහැර කිරීමේ ව්‍යාපෘතිය | 86.00 |
| ප්‍රංශ සංවර්ධන ආයතනය | මුන්දෙණි ආරු ඒකාබද්ධ වාරිමාර්ග ව්‍යාපෘතිය | 172.00 |
| එක්සත් රාජධානිය | ග්‍රාමීය පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 63.00 |
| ප්‍රංශය | ද සොයිසා මාතෘ රෝහලෙහි ළදරු සහ ප්‍රසව විමර්ශන මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම | 30.00 |
| නෙදර්ලන්තය | උතුරු පළාතේ සෞඛ්‍යය සේවා සැපයීම ශක්තිමත් කිරීම | 60.00 |
| නෙදර්ලන්තය | පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම | 33.00 |
| නෙදර්ලන්තය | ග්‍රාමීය පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 54.00 |
| ජර්මනිය | පානදුර මූලික රෝහල ප්‍රතිසංස්කරණය කිරීම | 120.00 |
| | **එකතුව** | **1,178.00** |

## 2018 වර්ෂයේදී ක්‍රියාවට නංවමින් පැවති ප්‍රධාන ව්‍යාපෘති

### හෙම්මාතගම ජල සම්පාදන ක්‍රම ව්‍යාපෘතිය

වඩාත් ඉහළ සෞඛ්‍යය තත්ත්වයක් සහ සමාජ ආර්ථික සංවර්ධනයක් ඇති කරලීම සඳහා පිරිසිදු පානීය ජල පහසුකම් පවත්නා පරිසරයක් රට තුළ නිර්මාණය කිරීම ඉතා වැඳගත් සාධකයක් වේ. මේ වන විට රටෙහි පිරිසිදු පානීය ජල ආවරණ අනුපාතය සියයට 86ක් පමණ වන අතර, පානීය නළ ජල පහසුකම් ආවරණ අනුපාතය සියයට 46ක් පමණ වේ. රටේ ජාතික මට්ටමෙන් පිරිසිදු පානීය ජල ආවරණ අනුපාතයේ සැලකිය යුතු ප්‍රගතියක් සපුරාගෙන තිබුණ ද, පානීය ජල ආවරණ අනුපාතයේ කලාපීය වශයෙන් විෂමතාවයන් තවමත් දිස්ත්‍රික්ක, ප්‍රාදේශීය සහ ග්‍රාම නිලධාරී වසම් මට්ටමෙන් දක්නට ලැබේ. නුවර එළිය, බදුල්ල සහ මොණරාගල වැනි දිස්ත්‍රික්ක වල රටෙහි සමස්ත සාමාන්‍ය පිරිසිදු පානීය ජල ආවරණ අනුපාතයට වඩා අඩු පිරිසිදු පානීය ජල ආවරණ

අනුපාතයක් ඇත. රට තුළ පානීය නළ ජල පහසුකම් සැලකූ විට ඌව, සබරගමුව වයඹ සහ උතුරු පළාත් ජාතික මට්ටමට වඩා අඩු අගයක් ගනී.

ඉහත සඳහන් කරුණු අනුව, සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ හෙම්මාතගම හා අරණායක ප්‍රදේශවල ජනතාවට පානීය ජලය ලබා දීම සඳහා හෙම්මාතගම ජල සම්පාදන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට රජය තීරණය කර තිබේ. හෙම්මාතගම ප්‍රදේශයේ ජීවත්වන ගෘහ ඒකකවලින් සියයට 70ක් පමණ පානීය ජල අවශ්‍යතා සඳහා මූලිකවම භූගත ජල ප්‍රභවයන් මත යැපේ. වියළි කාලවලදී මෙම භූගත ජල ප්‍රභවයන් වියළී යන අතර, මේ කාලය තුළ ගෘහ අවශ්‍යතා සඳහා අවශ්‍යවන ජලය ලබා ගැනීමට බොහෝ කාලයක් ගත කිරීමට සිදුව ඇත. අරණායක හා හෙම්මාතගම ප්‍රදේශයේ පවතින මතුපිට ජල ප්‍රභවයන් ප්‍රධාන වශයෙන් තේ සහ රබර් වතු ආශ්‍රිතව පිහිටා ඇති අතර, එහි ජල දූෂණය ඉහළ මට්ටමක පවතින නිසා පානීය අවශ්‍යතාවයන්ට යෝග්‍ය නොවේ. එමනිසා මෙම ප්‍රදේශයේ ජීවත්වන බහුතර ජනතාව ඔවුන්ගේ නිවෙස්වලට පිරිසිදු පානීය ජලය ඉල්ලා සිටියි. ඉහත තත්ත්වය සැලකිල්ලට ගනිමින් ප්‍රදේශයේ ජීවත්වන 197,000ක් පමණ පිරිසකට පානීය ජලය සැපයීම සඳහා ඉහත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇත. ව්‍යාපෘතියේ ඇස්තමේන්තු කොන්ත්‍රාත් පිරිවැය යුරෝ මිලියන 81.9ක් වේ. නෙදර්ලන්තයේ ING බැංකුව විසින් මෙම ව්‍යාපෘතිය මූල්‍යයනය කිරීම සඳහා එකඟ වී ඇත.

## කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනය දියුණු කිරීම සහ ඉහළ නැංවීම

ශ්‍රී ලාංකීය කර්මාන්ත ක්ෂේත්‍රයේ සහ විදේශ සේවා නියුක්තියේ අඛණ්ඩ සාර්ථකත්වය සහතික කර ගැනීම සඳහා වැදගත්ම සාධකය වන්නේ මානව සම්පතයි. එබැවින් ආර්ථික වර්ධනය ස්ථාවර කිරීමටත්, වැඩි දියුණු කිරීමටත්, දේශීය සහ විදේශ රැකියා සුරක්ෂිතතාවය ඇතිකිරීම සඳහාත්, අධ්‍යාපනය හා පුහුණුව රටෙහි ආයෝජන උපායමාර්ගයන්හි ප්‍රධාන අංගයක් බවට පත් වී තිබේ.

කටුනායක කාර්මික තාක්ෂණික ආයතනය එය ස්ථාපනය කල 1985 සිට කර්මාන්ත සඳහා සුදුසුකම්ලත් ශ්‍රමිකයින් බිහිකිරීම සඳහා ක්‍රියාකාරීව දායක වී ඇත. අනාගතයේදී කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ භූමිකාව විශේෂයෙන් ඉංජිනේරු ක්ෂේත්‍රය සඳහා මිනිස්බල වර්ධනය සහ මිනිස්බල සංවර්ධනය සඳහා වැදගත් වනු ඇත. වර්තමානයේ ශිෂ්‍යයන් 1,500ක් පමණ මෙම ආයතනයේ පුහුණුව ලබන අතර, වාර්ෂිකව සිසුන් 450ක් බඳවා ගැනීම සඳහා 2,000කට ආසන්න අයදුම්පත් සංඛ්‍යාවක් ආයතනයට ලැබෙයි. ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 06 වන කාර්මිකයින් සඳහා විශාල ඉල්ලුමක් ඇති බව වාර්තාවලින් හෙළි වී තිබේ.

පසුගිය වසර කිහිපය තුළ ඇතුළත් කළ සිසුන් සංඛ්‍යාව වැඩිවීමත් සමඟ කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනයෙහි පහසුකම් වැඩිදියුණු වී නොමැති අතර, පන්ති කාමර, උපකරණ සහ අධ්‍යයන කාර්ය මණ්ඩලය වැනි පහසුකම් ප්‍රමාණවත් නොමැති තත්ත්වයක් නිර්මාණය වී ඇත. ඉහත කරුණු සැලකිල්ලට ගනිමින් කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනය වැඩි දියුණු කිරීමට සහ තත්ත්වය උසස් කිරීමට රජය තීරණය කර ඇත. ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය යුරෝ මිලියන 9.5කි. ඔස්ට්‍රියානු රජය ඔස්ට්‍රියානු රයිෆයිසෙන් බැංකුව මඟින් ඉහත ව්‍යාපෘතිය මූල්‍යයනය කිරීම සඳහා පොළී රහිත සහනදායී ණයක් ලබා දී තිබේ.

## ඔස්ට්‍රියානු සහන ණය යෝජනා ක්‍රමය යටතේ රජයේ රෝහල් සඳහා ගිලන් රථ 100ක් ලබාගැනීම

හදිසි වෛද්‍ය සේවාවන් සෞඛ්‍යය ආරක්ෂණ පද්ධතියේ ප්‍රමුඛ අවශ්‍යතාවයක් බවට පත් වී තිබේ. ජාත්‍යන්තර පර්යේෂණයන් අනුව කම්පන අවස්ථාවේ සහ බරපතල තත්ත්වයේ පසුවන රෝගීන් සඳහා ඉතාමත්ම තීරණාත්මක කාල සීමාව වනුයේ, පළමුවන පැය වන අතර, එය "රන් පැය" ලෙස ද හැඳින්වේ. මේ හේතුවෙන් ගිලන් රථවල කාර්යභාරය ප්‍රවාහන ඒකකයක සිට රෝහල් සේවාවන්හි ජංගම දිගුවක් දක්වා වෙනස් වී තිබේ.

මෙම ව්‍යාපෘතිය මඟින් ගිලන්රථ 100ක් ලබා දීමට නියමිත අතර, එමඟින් ලබාදෙන පූර්ව ප්‍රතිකාර හේතුවෙන් රෝහල් ගත කිරීමට පෙර ලබා දෙනු ලබන හානිකර සහ ප්‍රමාණවත් නොවන ප්‍රතිකාර මඟින් ඇතිවන සංකූලතා නැති කර ගැනීමට හැකි වේ. මෙම ව්‍යාපෘතිය මඟින් රෝහල් ගත කිරීම අතරතුර දී ලබා දිය යුතු ප්‍රතිකාර සඳහා අවශ්‍ය වන උපකරණ සැපයීම ද සිදු කරනු ලබන අතර, එමඟින් රෝහල් ගත කරන රෝගීන් ක්‍රියාශීලී පුරවැසියන් ලෙස නැවත සමාජයට එක් කිරීම සඳහා වෛද්‍යවරුන්ට සහ හෙද කාර්ය මණ්ඩලයට රෝහල තුළදී වෘත්තීය මට්ටමේ ප්‍රතිකාර ලබාදීම පහසු කරනු ඇත. මෙම ව්‍යාපෘතිය මඟින් සපයනු ලබන ගිලන් රථ වඩා සුබෝපභෝගී වන අතර, හදිසි ප්‍රථමාධාර අවශ්‍ය රෝගීන් ප්‍රවාහනය සඳහා ඉතා සුදුසු වෙයි. මෙමඟින් ඉතා සුවපහසු ප්‍රවාහන සේවාවක් අවශ්‍ය වන ගර්භණී මාතාවන් වෙත එම පහසුකම සැපයිය හැකි වන අතර, එමඟින් ළදරු මරණ අනුපාතිකය අඩුකර ගැනීම සඳහා හදිසි වෛද්‍ය ප්‍රතිකාර සේවාවන් හි නියුතු පිරිසට තම කාර්යය පහසු කරනු ඇත. ව්‍යාපෘතියේ මුළු පිරිවැය යුරෝ මිලියන 9.8කි. මෙම ව්‍යාපෘතිය පොළී රහිත ඔස්ට්‍රියානු සහන ණය යෝජනා ක්‍රමය යටතේ මූල්‍යයනය කරන ලදී.

# එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන සහ තාක්ෂණික ආධාර අංශය

## එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන

එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන සහ තාක්ෂණික ආධාර අංශය, මෙම දෙපාර්තමේන්තුවේ වඩාත්ම විවිධාංගිකරණය වූ අංශයන්ගෙන් එකකි. මෙම අංශය මඟින් රජයේ සංවර්ධන ප්‍රයත්නයේ කොටසක් ලෙස විවිධ ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා මූල්‍ය හා තාක්ෂණ සහය ලබාගැනීමට එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන සමඟ සම්බන්ධීකරණය කරනු ලබයි. තවද, විවිධ සංවර්ධන පාර්ශ්වකරුවන් විසින් ලබාදෙන විදේශීය පුහුණු අවස්ථා හා ස්වේච්ඡා සේවාවන් ඒකරාශී කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීමද මෙම අංශය මඟින් සිදුකරනු ලබයි.

එක්සත් ජාතීන්ගේ සංවිධානය එහි විශේෂිත නියෝජිතායතන, අරමුදල්, වැඩසටහන් හා ශ්‍රී ලංකාවේ ඇති කාර්යාල හරහා සෑම වසර 5ක කාලයක් සඳහා ශ්‍රී ලංකා රජය හා එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන විසින් ඒකාබද්ධව අත්සන් කරනු ලබන "සංවර්ධන සහය රාමුව" යටතේ හඳුනාගනු ලබන ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මඟින් සාමුහිකව ශ්‍රී ලංකා රජයට සහය ලබා දෙනු ලබයි. මෙම රාමුව මඟින් එක්සත් ජාතීන්ගේ එක් එක් නියෝජිතායතන සඳහා විශේෂිත ඉලක්ක හා විස්තරාත්මක ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන් සහිතව මෙරටට අදාළ වැඩසටහන් පිළියෙල කිරීම සඳහා මාර්ගෝපදේශ ලබාදෙන අතරම ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා රජය සමඟ සමීපව කටයුතු කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ නියෝජිතායතනයන්ට උපායමාර්ගික උපදෙස් ලබා දීමද සිදුකරනු ලබයි.

ශ්‍රී ලංකා රජය හා එක්සත් ජාතීන් අතර ඇති වත්මන් හවුල්කාරිත්වය රජයේ ජාතික ප්‍රමුඛතාවන්ට අනුකූලව ශ්‍රී ලංකාවේ ඇති එක්සත් ජාතීන්ගේ කාර්යයන් සඳහා පුළුල් රාමුවක් සපයන (2018 - 2020) "එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධනය රාමුව" සමඟ අඛණ්ඩව ක්‍රියාත්මක වේ.

ශ්‍රී ලංකා රජය හා එක්සත් ජාතීන්ගේ නියෝජිත ආයතන අතර 2018 වසර තුළ පහත දැක්වෙන ප්‍රධාන ව්‍යාපෘති සඳහා ගිවිසුම් අත්සන් කරන ලදී.

| එක්සත් ජාතීන්ගේ නියෝජිතායතනය | ව්‍යාපෘතිය | මුදල (ඇ.ඩො. මිලියන) |
|---|---|---|
| ලෝක ආහාර වැඩසටහන | දේශීය උපායමාර්ගික සැලැස්ම 2018 - 2022 | 46.83 |
| කෘෂිකර්ම සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික අරමුදල | කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර හවුල්කාරිත්ව වැඩසටහන (අරමුදල් ඉහළ නැංවීම) | 6.18 |
| එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල | දේශීය වැඩසටහන් ක්‍රියාකාරී සැලැස්ම 2018 - 2022 | 4.00 |
| ආහාර සහ කෘෂිකර්ම සංවිධානය | ඊ - කෘෂිකාර්මික පරිසරය ශක්තිමත් කිරීම සහ ITC මැදිහත් වීම මත කෘෂිකාර්මික විසඳුම් ලබා දීම | 0.10 |
| එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය | කිළිනොච්චි, පුත්තලම සහ මන්නාරම දිස්ත්‍රික්කවල නැවත පදිංචිකරුවන්ට ඔවුන්ගේ අයිතිවාසිකම් ලබාගැනීමට හැකියාව ඇති කිරීම | 0.01 |


මීට අමතරව, ශ්‍රී ලංකා රජය හා අදාළ නියෝජිත ආයතන අතර 2018 - 2022 කාල රාමුවට අදාළව අත්සන් තබන ලද දේශීය වැඩසටහන් ක්‍රියාකාරී සැලැස්ම යටතේ එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) හා එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල (UNFPA), යන ආයතන 2018 වසරට අදාළ වන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අත්සන් තබන ලදී. ආහාර සහ කෘෂිකර්ම සංවිධානය (FAO ) හා ශ්‍රී ලංකා රජය ද 2018 - 2022 කාල රාමුවට අදාළ වන දේශීය වැඩසටහන් සැලැස්ම 2018 වසරේද අත්සන් තබන ලදී. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා තක්සේරු කරන ලද වටිනාකම ඇ.ඩො. මිලියන 28කි.





ශ්‍රී ලංකා රජය හා ලෝක ආහාර වැඩසටහන, 2018- 2022 සඳහා වූ දේශීය උපායමාර්ගික සැලැස්ම 2018.07.19 දින මුදල් අමාත්‍යංශයේදී අත්සන් තබන ලදී. 2025 දැක්ම හා රාජ්‍ය ආයෝජන වැඩසටහන (2017 - 2022) හා සබැඳි එම දේශීය උපායමාර්ගික සැලැස්ම, ශ්‍රී ලංකා රජය හා ලෝක ආහාර සංවිධාන අතර පහත උපායමාර්ග ලඟා කර ගැනීම සඳහා ක්‍රියාත්මක වේ. එය 2018 - 2022 සඳහා වූ එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන රාමුව යටතේ ප්‍රමුඛතා ක්‍රියාත්මක කිරීමට සහයෝගය දක්වයි.

## 2018 වසරේ එකඟතා හා උපයෝජනයන්

2018 වසර තුළ එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන හරහා ලද සහයෝගයන් සමාජීය හා ව්‍යාපාර සංවර්ධන ව්‍යාපෘති මූලික කොට ගත් සහන සැලසීම, නැවත ගොඩනැගීම් හා ප්‍රතිසංස්කරණ, ක්‍රියාකාරකම් හරහා කෘෂිකාර්මික නිෂ්පාදනවල ඵලදායිතාවය ඉහළ නැංවීම, ධීවර ක්‍රියාකාරකම් සංවර්ධනය, ග්‍රාමීය සමාජය තුළ ජීවනෝපාය සංවර්ධනය, ළමා හා මාතෘ සෞඛ්‍යය නැංවීම, පූර්ව ළමාවිය සංවර්ධනය හා ප්‍රාථමික අධ්‍යාපනය නැංවීම, ග්‍රාමීය සංවර්ධනය, ආපදා සඳහා සහන ලබාදීම, පාරිසරික සංවර්ධනය හා කාන්තා කටයුතු ආදිය සඳහා උපයෝගී කරගන්නා ලදී. වාර්තා අනුව, කෘෂිකර්ම සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික අරමුදල (IFAD) හා ඉන්පසුව එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) හා ලෝක ආහාර වැඩසටහන (WFP) යන ආයතනවල සහයෝගයෙන් සිදුකරන ලද ව්‍යාපෘති සඳහා වැඩිම උපයෝගිතා ප්‍රමාණයක් වාර්තා කොට ඇති අතර, එය ළමා හා මාතෘ සෞඛ්‍යය, අධ්‍යාපනය, පානීය ජලය හා සනීපාරක්ෂාව වැනි අංශ සඳහා යොදවා ඇත.




*සටහන : 1. විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා සිදු කරන ලද එකඟතා හා උපයෝජනයක් පමණක් අදාළ වේ.*


*2. ලෝක ආහාර වැඩසටහන සහ එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදලින් පමාවී ලද උපයෝජනයන්ද ඇතුළත්ය.*

## 2018 වසරේ ක්‍රියාත්මක කළ ප්‍රධාන ව්‍යාපෘති

| එක්සත් ජාතීන්ගේ නියෝජිතායතනය | ව්‍යාපෘතිය | ණය /ප්‍රදාන |
|---|---|---|
| කෘෂිකර්ම සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික අරමුදල | කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර හවුල්කාරිත්ව වැඩසටහන | ණය |
| | ශ්‍රී ලංකාවේ කුඩා පරිමාණ තේ හා රබර් වගාකරුවන් පුනර්ජනනය කිරීමේ ව්‍යාපෘතිය | ණය |
| ලෝක ආහාර වැඩසටහන | දේශීය උපායමාර්ගික සැලැස්ම 2018 - 2022 | ප්‍රදාන |
| | මහවැලි ගංගා ද්‍රෝණියේ ජීවත්වන ප්‍රජාවන් කෙරෙහි පාරිසරික විපර්යාසයන්හි බලපෑමට විසඳුම් සෙවීම | ප්‍රදාන |
| එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන | පාරිසරික වශයෙන් සංවේදී ප්‍රදේශ ජෛව විවිධත්වය සංරක්ෂණය වැඩිදියුණු කිරීම හා පරිසර පද්ධති සේවා පවත්වාගෙන යාම | ප්‍රදාන |
| | ගෝලීය පරිසරය පිළිබඳ සලකා බැලීම හා ප්‍රශස්ත ක්‍රියාමාර්ග | ප්‍රදාන |
| එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන වැඩසටහන | මිනිමාටා සම්මුතිය ආරම්භක ඇගයීම (MIA) | ප්‍රදාන |
| | ශ්‍රී ලංකාවේ පොලික්ලෝරිනේටඩ් බයිෆිනයිල් (PCBs) අපද්‍රව්‍ය හා දූෂිත / ආවරණ උපකරණ පරිසර හිතකාමී ලෙස කළමනාකරණය කිරීම | ප්‍රදාන |
| ආහාර සහ කෘෂිකර්ම සංවිධානය | ඊ - කෘෂිකාර්මික පරිසරය ශක්තිමත් කිරීම සහ ICT මැදිහත් වීම මත කෘෂිකාර්මික විසඳුම් ලබා දීම | ප්‍රදාන |
| | කෘෂි ආර්ථිකය සංවර්ධන ව්‍යාපෘතිය (ADP) | ප්‍රදාන |
| | මධ්‍යම කඳුකරයේ නුවර, බදුල්ල සහ නුවරඑළිය දිස්ත්‍රික්කයන්හි හායනයට පත් කෘෂිකාර්මික ඉඩම් ප්‍රනරුත්ථාපනය කිරීම | ප්‍රදාන |
| | ජාතික ජෛව ස්ථිර රාමුව ක්‍රියාත්මක කිරීම | ප්‍රදාන |
| | ස්ථානීය විශේෂිත පොහොර කළමනාකරණ පද්ධති සංවර්ධනය කිරීම | ප්‍රදාන |
| | ආසියාවේ නිල් ආර්ථිකය දියුණු කිරීම සඳහා නව්‍යකෘත ආකාරයට වී සමඟ කුඹුරුවල මත්ස්‍ය වගාව ප්‍රචලිත කිරීම හා දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දෙන ලෙස පොකුණු තුළ තිලාපියා මසුන් වගා කිරීම | ප්‍රදාන |
| එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල | 2018 වර්ෂයේ ක්‍රියාකාරකම් සඳහා වැඩ සැලැස්ම | ප්‍රදාන |
| එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල | 2018 වර්ෂයේ ක්‍රියාකාරකම් සඳහා වැඩ සැලැස්ම | ප්‍රදාන |
| එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය | කිළිනොච්චි, පුත්තලම සහ මන්නාරම දිස්ත්‍රික්කවල නැවත පදිංචිකරුවන්ට ඔවුන්ගේ අයිතිවාසිකම් ලබාගැනීමට ඇති හැකියාව ඇති කිරීම | ප්‍රදාන |

# තාක්ෂණික ආධාර

විදේශීය පුහුණු අවස්ථාවන් ඵලදායි ලෙස උපයෝජනය කිරීම සඳහා පහසුකම් සලසමින් රාජ්‍ය අංශයේ මානව සම්පත් සංවර්ධනය සඳහා දායකත්වය ලබාදීම මෙම අංශයේ ප්‍රධාන වගකීම වේ. ඒ අනුව විදේශ පුහුණු අවස්ථාවන් විනිවිදභාවයකින් යුතුව පරිපාලනය කිරීම සඳහා සංවර්ධන පාර්ශ්වකරුවන් සහ රේඛීය අමාත්‍යාංශ/ ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීමෙන් තාක්ෂණික සහයෝගිතා සම්බන්ධීකරණ කේන්ද්‍රස්ථානය වශයෙන් මෙම අංශය කටයුතු කරනු ලබයි.





ඒ අනුව, 2018 වසරේදී විදේශ පුහුණු අවස්ථාවන් 1,734ක් ලබාගනිමින් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව ඉහළ කාර්යසාධනයක් ලබාගැනීමට සමත්වී ඇත. එය පෙර වසරට සාපේක්ෂව සියයට 11ක වර්ධනයකි. මෙම පුහුණු වැඩසටහන් සෞඛ්‍යය, කෘෂිකර්මය, සත්ත්ව පාලනය, කර්මාන්ත, යටිතල පහසුකම්, පරිසරය, අධ්‍යාපනය, ආපදා කළමනාකරණය සහ රාජ්‍ය පරිපාලනය වැනි පුළුල් පරාසයක වූ විෂය ක්ෂේත්‍ර ගණනාවක් ආවරණය කර ඇත.

### 2018 වසරේදී සංවර්ධන පාර්ශ්වකරුවන් විසින් ලබා දුන් විදේශ පුහුණු අවස්ථාවන් සංඛ්‍යාව


| | ප්‍රදායකයා | | වැඩසටහන් ගණන | | ලැබුණු නාම යෝජනා ගණන | |
|---|---|---|---|---|---|---|
| | කෙටිකාලීන | දිගුකාලීන | කෙටිකාලීන | දිගුකාලීන | කෙටිකාලීන | දිගුකාලීන |
| චීනය | 243 | 1 | 1,217 | 2 | 1,038 | 2 |
| ඉන්දියාව | 166 | 1 | 524 | 1 | 183 | - |
| කොරියාව | 33 | 25 | 191 | 66 | 135 | 11 |
| ආසියානු සංවර්ධන බැංකුව | 55 | - | 174 | | 131 | - |
| ජපානය | 73 | 12 | 309 | 46 | 93 | 17 |
| සිංගප්පූරුව | 26 | - | 245 | | 29 | - |
| මැලේසියාව | 15 | - | 58 | | 22 | - |
| තායිලන්තය | 27 | 19 | 149 | 6 | 21 | - |
| කොළඹ ක්‍රමය | 10 | - | 26 | | 15 | - |
| ඕස්ට්‍රේලියාව | - | 1 | - | 36 | - | 36 |
| ඊශ්‍රායලය | 2 | - | 3 | | 1 | - |
| **එකතුව** | **650** | **59** | **2,896** | **157** | **1,668** | **66** |

2018 වසරේදී, කෙටිකාලීන පුහුණු වැඩසටහන්වලින් විශාල ප්‍රමාණයක් ලබාදී ඇත්තේ චීන රජය මඟින් වන අතර, එය සියයට 62ක ප්‍රමාණයකි. ඊට පසුව වැඩි ප්‍රමාණයක් පිළිවෙලින් ඉන්දීය රජය (සියයට 11), කොරියානු රජය (සියයට 8) සහ ආසියානු සංවර්ධන බැංකුව (සියයට 8) ප්‍රමාණයක් ලබාදී ඇත.




# විවිධ සංවර්ධන පාර්ශ්වකරුවන්ගේ දායකත්වය


## චීන රජය





විශාල ප්‍රමාණයක විෂය ක්ෂේත්‍රයන් ආවරණය කරමින් රාජ්‍ය අංශයේ නිලධාරීන් පුහුණු කිරීම සඳහා චීන රජය මඟින් ලබාදෙන සහයෝගය පසුගිය කාලය තුළ ක්‍රමානුකූලව ඉහළ නංවා ඇත. 2018 වසරේදී 1,000කට අධික නිලධාරීන් ප්‍රමාණයක් චීනයේ විදේශ අත්දැකීම් ලබාදීම සඳහා තෝරා ගෙන ඇත. එය පෙර වසරට සාපේක්ෂව සියයට 15ක වර්ධනයකි.

## කොරියානු රජය

2013 සිට 2018 වසර දක්වා කාල පරිච්ඡේදය තුළ කොරියානු රජය, කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය (KOICA) හරහා පුහුණු අවස්ථාවන් 753ක් පමණ ලබා දී ඇත.




## ජපාන රජය





ජපාන ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය හරහා ඔවුන්ගේ සංවර්ධන අත්දැකීම් මඟින් පුහුණු වන්නන්හට ඵලදායී තීරණ ගැනීමට සහ රටෙහි පුරවැසියන්හට කාර්යක්ෂමවූත් ඵලදායීවූත් හොඳ තත්ත්වයෙන් යුත් සේවාවක් ලබා දීමට හැකි වන පරිදි වසරකට සැලකිය යුතු ප්‍රමාණයක කෙටිකාලීන හා දිගුකාලීන පුහුණු වැඩසටහන් ප්‍රමාණයක් ජපාන රජය විසින් ලබා දේ.

### විද්‍යා විෂයට අදාළව ජපාන සහ ආසියානු තරුණ හුවමාරු වැඩසටහන (සකුරා)


ජපානයේ විශ්වවිද්‍යාල, පර්යේෂණ ආයතන සහ පෞද්ගලික ආයතනවල පවතින ජපන් විද්‍යා හා තාක්ෂණය සම්බන්ධයෙන් ආසියානු තරුණයින්ගේ කැමැත්ත ඉහළ නැංවීමේ අරමුණ ඇතිව ජපන් විද්‍යා හා තාක්ෂණ ආයතනය (JST) විසින් ජපානයේ පවත්වනු ලබන සකුරා විද්‍යා වැඩසටහනට සහභාගී වීම සඳහා 2018 වසරේදී සිසුන් දහදෙනෙකුට සහ සුපරීක්ෂකවරුන් දෙදෙනෙකුට අවස්ථාව හිමිවිය.

## ඉන්දියානු රජය

2018 වසරේදී ඉන්දියානු රජය විසින් සෞඛ්‍යය, කෘෂිකර්මය, ව්‍යවසායකත්වය, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර, මූල්‍ය සහ ගණකාධිකරණය, ඉංග්‍රීසි භාෂාව, තොරතුරු තාක්ෂණය සහ අනෙකුත් අංශයන්හි විශාල ප්‍රමාණයක පුහුණු වැඩසටහන් ලබාදී ඇත.



## ඕස්ට්‍රේලියානු රජය




ඕස්ට්‍රේලියානු රජය විසින් ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශයේ හා රාජ්‍ය අංශයේ නිලධාරීන්හට ඕස්ට්‍රේලියාවේ ප්‍රමුඛ විශ්වවිද්‍යාලයන්හි පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරීම සඳහා අවස්ථාව ලබා දේ. 2018 වසරේදී ආර්ථික සංවර්ධනය, යහපාලනය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය යන ක්ෂේත්‍රයන් සඳහා අවස්ථාවන් 36ක් ලබා දී ඇත.

## ආසියානු සංවර්ධන බැංකුව

විදේශීය අත්දැකීම් ලබා ගැනීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව මඟින් සංවිධානය කරනු ලබන දින 2 - 8 කාලයක් සඳහා වන වැඩසටහන් ප්‍රධාන වශයෙන් සම්මන්ත්‍රණ හා සමුළුවලින් සමන්විත වන අතර, එම වැඩසටහන් රජයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ඉලක්ක කර ගනී. වාර්තා වී ඇති ආකාරයට 2018 වසරේදී පරිසරය, වෙළඳ සහ මූල්‍ය, ප්‍රාග්ධන වෙළඳපොළ, රාජ්‍ය කළමනාකරණය, රාජ්‍ය අංශයේ අභියෝග සහ සමාජ ආරක්ෂාව වැනි ක්ෂේත්‍රයන් සඳහා නිලධාරීන් 131 දෙනෙකුට පමණ අවස්ථාවන් ලබා දී ඇත.


## ස්වේච්ඡා සේවකයින්ගේ සේවය

පුහුණු වැඩසටහන්වලට අමතරව, තාක්ෂණික ආධාර අංශය මඟින් රේඛීය අමාත්‍යාංශ සඳහා විදේශීය විශේෂඥයින් හා ස්වේච්ඡා නිලධාරීන්ගේ සේවය ලබා ගැනීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම සහ සම්බන්ධීකරණය කිරීම සිදු කරනු ලබයි. ඒ අනුව, රේඛීය අමාත්‍යාංශ මඟින් සිදු කරන ඉල්ලීම් සඳහා සුදුසු විශේෂඥයින් හා ස්වේච්ඡා නිලධාරීන් හඳුනාගෙන ඔවුන්ව බඳවා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගනු ලබයි. 2018 වසර තුළදී ශ්‍රී ලංකා රජය කොරියාව, ජපානය, කැනඩාව සහ ඕස්ට්‍රේලියාව යන රටවලින් ස්වේච්ඡා සේවකයින් පිළිවෙලින් 69, 33, 14 සහ 5 යන ප්‍රමාණයක් ලබා ගෙන ඇත.

## අන්තර්ජාතික ස්වේච්ඡා සේවය සම්බන්ධව විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ භූමිකාව

- අන්තර්ජාතික ස්වේච්ඡා නිලධාරීන් විවිධ ආයතනවලට අනුයුක්ත කිරීම සම්බන්ධීකරණය කිරීම
- හඳුනාගත් ස්වේච්ඡා නිලධාරීන් සඳහා පැමිණීමේ වීසා බලපත් සඳහා එකඟතාව ලබාදීම
- ස්වේච්ඡා නිලධාරීන් සඳහා නේවාසික වීසා සඳහා එකඟතාව ලබාදීම
- අවශ්‍ය අවස්ථාවන්හිදී සේවා දිගු සඳහා එකඟතාව ලබාදීම
- ශ්‍රී ලංකාව තුළ ස්වේච්ඡා සේවකයින්ගේ ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම
- ස්වේච්ඡා සේවකයින් සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීම

2018 වසරේදී ලබා ගත් ස්වේච්ඡා සේවකයින්ගේ ප්‍රතිශතය




# 2018 සුවිශේෂිතා

## ජපාන සංවර්ධන ශිෂ්‍යත්ව වැඩසටහන (JDS)

- මානව සම්පත් සංවර්ධනය සඳහා වන ජපාන ආධාර වැඩසටහනෙහි තුන්වන කාර්ය රාමුව (2018-2021) 2018 වසරේදී ආරම්භ කරන ලදී. ඒ අනුව, එහි ප්‍රථම කණ්ඩායමට පහසුකම් සැලසීම සඳහා 2018 වසරේදී මිලියන 265ක (ආසන්න වශයෙන් රුපියල් මිලියන 374ක්) ආධාර ප්‍රදානයක් ජපාන රජය විසින් ලබා දෙන ලදී

## ජාත්‍යන්තර සෙමාවුල් සමුළුව

- ජාත්‍යන්තර සෙමාවුල් සමුළුව 2018 වසරේ දෙසැම්බර් 12 දින ශ්‍රී ලංකාවේදී පවත්වන ලදී

## වාර්තා සැසි

- ජපාන සහ කොරියා පශ්චාත් උපාධි පාඨමාලාව හදාරා නැවත ශ්‍රී ලංකාවට පැමිණි නිලධාරීන් සඳහා වාර්තා සැසි 02ක් පිළිවලින් 2018 ජනවාරි 23 සහ 2018 නොවැම්බර් 14 යන දිනවලදී පවත්වන ලදී

## තොරතුරු සැසි

- ඕස්ට්‍රේලියානු පශ්චාත් උපාධි පාඨමාලාවන් පිළිබඳව නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් 2018 මාර්තු 09 වැනි දින පවත්වන ලදී

## ස්වේච්ඡා සහයෝගිතාවය

- ජපාන ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය (JICA) ස්වේච්ඡා නිලධාරීන් අදාළ ආයතනවලට අනුයුක්ත කිරීමේ නිල උත්සව 12ක් එම ආයතනවල සහභාගිත්වයෙන් 2018 වසරේදී පවත්වන ලදී
- ශ්‍රී ලංකාවේ ස්වේච්ඡා සේවක වැඩසටහන් සම්බන්ධව විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ භූමිකාව යන මැයෙන් කොරියානු ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය (KOICA) ස්වේච්ඡා නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් 04ක් 2018 වසරේදී පවත්වන ලදී
- ජයිකා සහ කොයිකා ස්වේච්ඡා නිලධාරීන් සඳහා හැඳුනුම්පත් 100ක් නිකුත් කරන ලදී

## ශ්‍රී ලංකාවේ පවත්වන ලද පුහුණු වැඩසටහන්

- "නිදහස් වෙළඳ කලාප කළමනාකරණය" හා "වෘත්තීය අධ්‍යාපනය" නමින් වැඩසටහන් 02ක් චීන රජයේ සහභාගිත්වය ද ඇතිව 2018 වසරේදී ශ්‍රී ලංකාවේදී පවත්වන ලදී

# ප්‍රාග්ධන වෙළඳපොළ හා ආයෝජන අංශය

සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා දේශීය බැංකු වෙතින් අරමුදල් සම්පාදනය කිරීම සහ ජාත්‍යන්තර වෙළඳපොළ තුළින් විදේශ විනිමය ණය ලබාගැනීම සඳහා පහසුකම් සැලසීම ප්‍රාග්ධන වෙළඳපොළ අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ. තවද, රජයේ අරමුදල් අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා ගෝලීය වෙළඳපොළට ප්‍රවේශ වීමට වඩාත් සුදුසු අවස්ථා හඳුනාගැනීම සඳහා, ජාත්‍යන්තර ණය ප්‍රාග්ධන වෙළඳපොළ අධීක්ෂණය කිරීම ද, මෙම අංශය මඟින් සිදු කරනු ලැබේ.

## දේශීය බැංකුවලින් මූල්‍යයනය සම්පාදනය කිරීම

ප්‍රමුඛතා මාර්ග පුනරුත්ථාපනය කිරීමේ සහ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති 64ක් මූල්‍යයනය කිරීම සඳහා රුපියල් බිලියන 151.7ක් දක්වා දේශීය බැංකුවලින් අරමුදල් සම්පාදනය කරගැනීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියට අවශ්‍ය සහය ලබා දෙන ලදි. ඒ අනුව, 2018 වසර අවසාන වන විට මාර්ග සංවර්ධන අධිකාරිය රුපියල් මිලියන 149.6ක් උපයෝජනය කර ඇති අතර, මාර්ග පුනරුත්ථාපන සහ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති 64හි ඉදිකිරීම් කටයුතු සම්පූර්ණයෙන්ම පාහේ අවසන් කර ඇත. තවද, මාර්ග සංවර්ධන අධිකාරිය විසින් මෙම ප්‍රමුඛතා මාර්ග සංවර්ධන ව්‍යාපෘතිවලට අමතරව, විදේශ අරමුදල් සපයන ව්‍යාපෘති 03ක දේශීය මූල්‍යයන සංරචකය සඳහා පරිපූරක වශයෙන් දේශීය බැංකුවලින් අරමුදල් සම්පාදනය සඳහා ප්‍රවේශ වන ලදි. කොළඹ කටුනායක අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ (CKE) කාර්යය විෂය පථයෙහි වෙනස්වීම් ක්‍රියාත්මක කිරීම සඳහා මූල්‍ය පහසුකම් ලෙස ඇ.ඩො. මිලියන 44.7ක් සැපයීම, පිටත වටරවුම් අධිවේගී මාර්ගය (OCH) අදියර III කඩවත සිට කෙරවළපිටිය දක්වා වූ මාර්ග කොටසේ ඉදිකිරීම් සුපරීක්ෂණය සඳහා උපදේශන සේවා සැපයීම වෙනුවෙන් මූල්‍ය පහසුකම් සැපයීම සඳහා රුපියල් මිලියන 1,810ක මුදලක් ලබාගැනීම සහ මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ පළමු කොටසේ උපදේශන සේවා සැපයීම මූල්‍යයනය කිරීම සඳහා රුපියල් මිලියන 2,551ක් සැපයීම ඊට ඇතුළත් වේ.

මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය රජයේ ප්‍රමුඛතම ව්‍යාපෘතියක් වන අතර, එහි දෙවන කොටස මූල්‍යයනය කිරීම සඳහා ද, දේශීය බැංකු වෙත ප්‍රවේශ වන ලදි. මීරිගම සිට කුරුණෑගල දක්වා වන මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ II කොටසෙහි සම්පූර්ණ දිග කි.මී 39.3ක් වේ. මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ II කොටසට ප්‍රවේශ වීම සඳහා මීරිගම, නාකලගමුව, පොතුහැර, දම්බොක්ක සහ කුරුණෑගල යන ප්‍රදේශවලින් අන්තර් හුවමාරු 05 ක් ගාස්තු අයකිරීමේ කුටි සමඟ පිහිටවනු ලබයි. ව්‍යාපෘතිය කොන්ත්‍රාත් පැකේජ 04කට බෙදා ඇති අතර, එක් කොටසක දුර ප්‍රමාණය ආසන්න වශයෙන් කි.මී 10ක් පමණ වේ. මෙම දෙවන කොටසෙහි ඉදිකිරීම් කටයුතු, කොන්ත්‍රාත්කරුවන් 15 දෙනෙකුගෙන් සමන්විත දේශීය කොන්ත්‍රාත් සමාගම් සමූහ හතරක් මඟින් සිදු කරනු ලබන අතර, ඉඩම් අත්පත් කරගැනීම, සිවිල් ඉදිකිරීම් සහ ඉදිකිරීම් සුපරීක්ෂණය සඳහා උපදේශන සේවා සැපයීම මූල්‍යයනය කිරීම සඳහා 2018 වර්ෂය අවසාන වන විට රුපියල් බිලියන 52.3ක පමණ ණය මුදල් මහජන බැංකුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව, සම්පත් බැංකුව සහ ලංකා බැංකුව වෙතින් ලබා ගෙන ඇත. 2018 දෙසැම්බර් මස අවසන් වන විට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 55.2ක් වන අතර, මූල්‍යමය ප්‍රගතිය සියයට 44.3ක් පමණ වේ. මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ II කොටසෙහි ඉදිකිරීම් කටයුතු 2019 වසර අවසන් වන විට නිම කිරීමට අපේක්ෂිතය.

සුරක්ෂිත පානීය ජල පහසුකම් සැපයීම රජයේ ප්‍රමුඛතාවයක් ලෙස හඳුනාගෙන ඇති අතර, 2014 වසරේ සිට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින්, ජල සම්පාදන ව්‍යාපෘති 18ක් මූල්‍යයනය කිරීම සඳහා දේශීය බැංකු වෙතින් රුපියල් බිලියන 71.5ක පමණ ණය මුදල් ලබාගැනීම සඳහා ණය ගිවිසුම්වලට එළඹ ඇත.

තවද, මෙම ප්‍රමුඛ ජල සම්පාදන ව්‍යාපෘතිවලට අමතරව, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ඉන්දියානු ආනයන අපනයන බැංකුව විසින් අරමුදල් සපයනු ලබන අලුත්ගම, මතුගම සහ අගලවත්ත ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය, පොල්ගහවෙල, පොතුහැර, අලව්ව ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය සහ කුණ්ඩසාලේ, හාරගම ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය යන ජල සම්පාදන ව්‍යාපෘති තුන සඳහා අවශ්‍ය ප්‍රතිපාර්ශ්ව අරමුදල් සම්පාදනය කරගැනීම සඳහා දේශීය බැංකු වෙත ප්‍රවේශ වන ලදී.

## දේශීය බැංකු වෙතින් අරමුදල් සම්පාදනය කරන ලද ජල සම්පාදන ව්‍යාපෘති පිළබඳ විස්තර

| ජල සම්පාදන ව්‍යාපෘතිය | කොන්ත්‍රාත්කරු | බැංකුව | මුදල *(රුපියල් මිලියන)* |
|---|---|---|---|
| කොළඹ නගරයේ ජල සම්පාදනය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - අදියර 1 | V.V. Karunaratne& Company | ලංකා බැංකුව | 2,792.07 |
| කොළඹ නගරයට නැගෙනහිරින් පිහිටි නගර - 1 වන පැකේජය සහා වන ජල සම්පාදන ව්‍යාපෘතිය (දියගම සහ පාදුක්ක ආශ්‍රිත ප්‍රදේශ) | Access Engineering PLC | ලංකා බැංකුව | 5,170.00 |
| බෙන්තොට ජල සම්පාදන ව්‍යාපෘතිය | K.D.A.Weerasinghe& Co (Pvt) Ltd | ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 1,239.47 |
| රුහුණුපුර බෙදාහැරීමේ ජල සම්පාදන ව්‍යාපෘතිය | K.D.A.Weerasinghe& Company (pvt) Ltd | කොමර්ෂල් බැංකුව | 1,929.61 |
| අම්පාර බෙදාහැරීමේ ජල සම්පාදන ව්‍යාපෘතිය | Sunpower Construction (pvt) Ltd | ජාතික සංවර්ධන බැංකුව, ලංකා බැංකුව සහ ඩීඑෆ්සීසී බැංකුව | 6,848.06 |
| ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් ආවරණය කරන නළ ජල සැපයුම් සේවා ප්‍රදේශය පුළුල් කිරීම සඳහා ජල සම්පාදන ව්‍යාපෘති 22ක් ක්‍රියාත්මක කිරීම | National Water Supply & Drainage Board | ලංකා බැංකුව | 3,499.00 |
| ලග්ගල ජල සම්පාදන ව්‍යාපෘතිය | Hovael, CML-MTD Joint Venture | හැටන් නැෂනල් බැංකුව | 4,495.87 |
| විල්ගමුව ජල සම්පාදන ව්‍යාපෘතිය | Hovael, CML-MTD Joint Venture | හැටන් නැෂනල් බැංකුව, ජාතික සංවර්ධන බැංකුව | 3,580.42 |
| කොළඹ දිස්ත්‍රික්කයේ නැගෙනහිර නගර සඳහා වන ජල සම්පාදන ව්‍යාපෘතිය - III වන පැකේජය වන හෝමාගම, පාදුක්ක සහ සීතාවක ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයන්හි බෙදාහැරීමේ ජාලය සඳහා HDPE/DI නල සපයා ඇතිරීමේ ව්‍යාපෘතිය | Sierra Construction (Pvt) Ltd | ලංකා බැංකුව | 10,049.41 |
| ඌරගස්මන්හංදිය, ගෝනාපීනුවල, දික්කුඹුර, වැලිගම ජල සම්පාදන ව්‍යාපෘතිය | Squire Mech Engineering (Pvt) Ltd | ලංකා බැංකුව, මහජන බැංකුව | 1,754.78 |
| කොළඹ දිස්ත්‍රික්කයේ නැගෙනහිර නගර සඳහා වන ජල සම්පාදන ව්‍යාපෘතිය - II වන පැකේජය | Maga Engineering Ltd | ලංකා බැංකුව | 4,822.96 |
| ගලගෙදර / මාවතගම ජල සම්පාදන ව්‍යාපෘතිය | Maga Engineering (pvt) Ltd | ඩීඑෆ්සීසී බැංකුව | 3,126.24 |
| කොස්ගම, අවිස්සාවේල්ල ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය | International Construction Consortium (pvt) Ltd | ලංකා බැංකුව | 1,382.43 |
| මැදිරිගිරිය ජල සම්පාදන ව්‍යාපෘතිය | Sanken Construction (Pvt) Ltd | ලංකා බැංකුව | 1,500.03 |
| ඇටැම්පිටිය ජල සම්පාදන ව්‍යාපෘතිය | Tudawe Brothers (Pvt) Ltd. | මහජන බැංකුව | 2,243.89 |
| විසල් රත්නපුර ජල සම්පාදන ව්‍යාපෘතිය | Subasinghe Contractors & Earth Movers Finite Lanka (Pvt) Ltd | ලංකා බැංකුව | 1528.98 |
| ගිරිඳුර ජල සම්පාදන ව්‍යාපෘතිය | SquireMech Engineering (Pvt) Ltd. | මහජන බැංකුව | 513.28 |
| කුණ්ඩසාලේ - හාරගම ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය | Pratibha Industries Limited | ලංකා බැංකුව | 3,378.00 |
| මාතර අදියර IV ජල සම්පාදන ව්‍යාපෘතිය | Kolon-Samsung C&T JV | ජාතික සංවර්ධන බැංකුව | ඇ.ඩො.මි. 76.83 ට සමාන රුපියල් වටිනාකම + රු. මිලියන 2,448.81 |
| අළුත්ගම, මතුගම සහ අගලවත්ත ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය | Ion Exchange India Limited | ලංකා බැංකුව | ඇ.ඩො.මි. 29.10 ට සමාන රුපියල් වටිනාකම |
| පොල්ගහවෙල, පොතුහැර, අලව්ව ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය | Va Tech Wabag Limited | ලංකා බැංකුව | ඇ.ඩො.මි. 16.20 ට සමාන රුපියල් වටිනාකම |

*මූලාශ්‍රය: විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය*

මෙම ව්‍යාපෘතිවලින් බහුතරයක් මූල්‍යයනය කිරීම සඳහා සාමාන්‍ය බර තැබූ ප්‍රමුඛ ණය දීමේ අනුපාතය (AWPLR)ට එකතු කළ සියයට 2.25ක වාර්ෂික පොළී අනුපාතිකයක් මත වසර 2 1/2ක සහන කාලයක් ද ඇතුළුව වසර 14 1/2ක ණය ආපසු ගෙවීමේ කාලයක් සහිතව දේශීය බැංකු විසින් අරමුදල් සම්පාදනය කර ඇත. මෙහිදී, නිදන්ගත වකුගඩු රෝගය සහිත ප්‍රදේශ ආවරණය කරන ජල සම්පාදන ව්‍යාපෘති සඳහා ප්‍රමුඛතාවය දී ඇත.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සැලකිල්ලට ගනිමින්, අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද පරිදි, 2016 වසරේ ජනවාරි මාසයෙන් පසු ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ග්‍රාමීය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ලබාගන්නා ලද ණය මුදල් වලින් සියයට 75ක ප්‍රමාණය සහ නාගරික ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ලබාගන්නා ලද ණය මුදල්වලින් සියයට 50ක ප්‍රමාණය සේවාකරණය කිරීම රජය විසින් සිදුකරනු ලැබේ.

තවද, 2018 වසර තුළ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් විදේශ අරමුදල් මඟින් ක්‍රියාත්මක ව්‍යාපෘතිවල ශ්‍රී ලංකා රජය විසින් දැරිය යුතු ප්‍රතිපාර්ශ්වීය අරමුදල් දැරීම වෙනුවෙන් මහජන බැංකුව වෙතින් රු. මිලියන 9,613ක ණය මුදලක් ලබාගන්නා ලදි. අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කළ පරිදි, එම ණය මුදල, ව්‍යාපෘතිවල අගය මත එකතු කළ බදු සහ රේගු බදු ගෙවීම සඳහා ද උපයෝජනය කරන ලදි.

එමෙන්ම, නාගරික සංවර්ධන අධිකාරිය විසින් ද, ශ්‍රී ලංකා රජය විසින් සැපයිය යුතු ප්‍රතිපාර්ශ්වීය අරමුදල් සපයා ගැනීම වෙනුවෙන් රුපියල් මිලියන 11,510ක ණය මුදලක් ලබාගැනීම සඳහා මහජන බැංකුව වෙත ප්‍රවේශ වන ලදි.

## යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රාජ්‍ය ව්‍යවසායන්වලට දේශීය බැංකු ණය සපයා දීම

| රාජ්‍ය ව්‍යවසායේ සහ ව්‍යාපෘතියේ නම | බැංකුව | 2018.12.31 දිනට ගිවිසුම්ගත මුදල (රු. බිලියන) | 2018.12.31 දිනට උපයෝජනය වූ මුදල (රු. බිලියන) |
|---|---|---|---|
| මාර්ග සංවර්ධන අධිකාරිය - ප්‍රමුඛතා මාර්ග සංවර්ධන ව්‍යාපෘති | ලංකා බැංකුව | 36.66 | 35.78 |
| | මහජන බැංකුව | 14.59 | 14.45 |
| | ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 55.37 | 55.27 |
| | හැටන් නැෂනල් බැකුව | 28.26 | 27.63 |
| | කොමර්ෂල් බැංකුව | 7.21 | 7.11 |
| | ඩීඑෆ්සීසී බැංකුව | 1.33 | 1.31 |
| | ජාතික සංවර්ධන බැංකුව | 8.35 | 8.13 |
| මාර්ග සංවර්ධන අධිකාරිය - කොළඹ කටුනායක අධිවේගී මාර්ග ව්‍යාපෘතිය | මහජන බැංකුව | ඇ.ඩො.මි. 44.72 | ඇ.ඩො.මි. 43.56 |
| මාර්ග සංවර්ධන අධිකාරිය - පිටත වටරවුම් අධිවේගී මාර්ගය (කොන්ත්‍රාත් සුපරීක්ෂණය සඳහා උපදේශන සේවා සැපයීම මූල්‍ය පහසුකම් සැපයීම) | ලංකා බැංකුව | 1.81 | 0.98 |
| මාර්ග සංවර්ධන අධිකාරිය - මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය- පළමුවන කොටස- ඉදිකිරීම් අධීක්ෂණය සඳහා උපදේශක සේවා සැපයීම | ලංකා බැංකුව | 2.55 | 0.23 |
| මාර්ග සංවර්ධන අධිකාරිය - මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - දෙවන කොටස (ඉඩම් අත්පත් කරගැනීම සහ උපදේශන සේවා ද ඇතුළුව) | මහජන බැංකුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව, සම්පත් බැංකුව, ලංකා බැංකුව | 52.33 | 52.33 |
| ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධන සංස්ථාව - වේරස් ගඟ වැසි ජල අපවහන හා පරිසර වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 14.2 | 2.80 |
| ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | ජාතික ඉතිරිකිරීමේ බැංකුව, ලංකා බැංකුව, මහජන බැංකුව, හැටන් නැෂනල් බැංකුව, ඩීඑෆ්සීසී බැංකුව, ජාතික සංවර්ධන බැංකුව, කොමර්ෂල් බැංකුව | 79.53 | 41.45 |
| ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව විද්‍යායතනය (NSBM) - යෝජිත ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව විද්‍යායතනයේ විශ්වවිද්‍යාල සංකීර්ණය හෝමාගම ඉදිකිරීම | ලංකා බැංකුව | 8.60 | 8.59 |
| කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (KDU) | ජාතික ඉතිරිකිරීමේ බැංකුව | ඇ.ඩො.මි. 201.6 | රු.බි.3.16 +ඇ.ඩො.මි. 177.33 |
| සීමාසහිත ලංකා නැව් සංස්ථාව -නෞකා දෙකක් මිලදී ගැනීම (පැනමැක්ස් භාණ්ඩ ප්‍රවාහන නෞකා 02ක්) | මහජන බැංකුව | ඇ.ඩො.මි 80.7 | ඇ.ඩො.මි. 80.7 |
| උසස් අධ්‍යාපන අමාත්‍යාංශය - මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික ආයතනය සංවර්ධනය කිරීම හා ප්‍රතිස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය | කොමර්ෂල් බැංකුව, හැටන් නැෂනල් බැංකුව | 10.29 | 10.26 |

*මූලාශ්‍ර: ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව, හැටන් නැෂනල් බැංකුව, කොමර්ෂල් බැංකුව, ඩී.එෆ්.සී.සී බැංකුව, ජාතික සංවර්ධන බැංකුව*

### ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළඳපොළ තුළින් විදේශ විනිමය කාලීන ණය පහසුකම් ලබාගැනීම

ශ්‍රී ලංකා රජය විසින් 2018 වර්ෂය තුළදී, එම වර්ෂය සඳහා අනුමත ණය ගැනීම් සීමාව තුළ ඇ.ඩො. මිලියන 1,000ක ණය මුදලක් විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකමක් තුළින් ලබාගන්නා ලදි. මෙම ගනුදෙනුව සාර්ථක ලෙස අවසන් කරමින්, ඇ.ඩො. මිලියන 1,000ක මුදල 2018 ඔක්තෝබර් මාසයේදී චීන සංවර්ධන බැංකුව විසින් ලබාදෙන ලදි.

ඇ.ඩො. මිලියන 1,000ක් වූ ණය මුදල සය මාසික ලන්ඩන් අන්තර් බැංකු අර්පණ අනුපාතිකය මත සියයට 2.56ක් වූ වාර්ෂික පොලියක් මත සහ සියයට 1.25ක පෙර ගෙවුම් ගාස්තුවක් මත සහ වසර 03ක සහන කාලයක් ඇතුළුව වසර 08ක කල්පිරීමේ කාලයක් සහිතව ලබාගන්නා ලදි. මෙම ණය පහසුකම සඳහා තරඟකාරී මිල කැඳවීමේ ක්‍රමවේදයක් තුළින්, දේශීය සහ අන්තර්ජාතික බැංකු/ ආයෝජන ආයතන 04ක් වෙතින් ලද මූල්‍ය යෝජනා විකල්ප 10ක් ඇගයීමෙන් පසු චීන සංවර්ධන බැංකුව තෝරාගන්නා ලදි.

## ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කිරීම්

2018 වර්ෂයේ අප්‍රේල් මාසය තුළදී වසර 05ක කල්පිරීමේ කාලයකින් යුතුව ඇ.ඩො. මිලියන 1,250ක් සහ වසර 10ක කල්පිරීමේ කාලයකින් යුතුව ඇ.ඩො. මිලියන 1,250ක් වශයෙන් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කරන ලදි. මෙම බැඳුම්කර සමමිල මත සියයට 5.75 සහ සියයට 6.75කට මිල කරන ලදි. මෙම නිකුතුව, 2007 වසරේ සිට ශ්‍රී ලංකාව විසින් ජාත්‍යන්තර බැඳුම්කර වෙළඳපොළ තුළ සිදුකරන ලද දොළොස්වන එක්සත් ජනපද ඩොලර් බැඳුම්කර නිකුතුව සනිටුහන් කරන ලදි. ශ්‍රී ලංකාව විසින් මේ දක්වා සිදුකර ඇති විශාලතම අක්වෙරළ බැඳුම්කර නිකුතුව ද මෙය වේ. ඉතා හොඳ භූගෝලීය විවිධාංගීකරණයක් පෙන්නුම් කරමින් වසර 05ක කල්පිරීමේ කාලයකින් යුත් බැඳුම්කර, සියයට 66ක ප්‍රමාණය එක්සත් ජනපද ආයෝජකයින් වෙත ද, සියයට 24ක ප්‍රමාණය යුරෝපා ආයෝජකයින් වෙත ද, ඉතිරි සියයට 10ක ප්‍රමාණය ආසියානු ආයෝජකයින් වෙත ද විභජනය වී ඇත. එමෙන්ම, වසර 10ක කල්පිරීමේ කාලයකින් යුත් බැඳුම්කර සියයට 65ක ප්‍රමාණය එක්සත් ජනපද ආයෝජකයින් වෙත ද, සියයට 29ක ප්‍රමාණය යුරෝපා ආයෝජකයින් වෙත ද, ඉතිරි සියයට 6ක ප්‍රමාණය ආසියානු ආයෝජකයින් වෙත ද බෙදී යන ලදි.

**ශ්‍රී ලංකා ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කිරීම පිළිබඳ තොරතුරු**

| නම | නිකුත් කළ දිනය | ශ්‍රේණිගත කිරීම (Moody's/ S&P/ Fitch) | වටිනාකම (ඇ.ඩො. මිලියන) | කූපන් අගය (%) | කල්පිරීමේ කාලය (අවුරුදු) | කල්පිරීමේ දිනය | 2018.12.31 දිනට මිල | 2018.12.31 දිනට ඵලදාව (%) |
|---|---|---|---|---|---|---|---|---|
| **SL'19** | 06/01/2014 | B1/B+/B+ | 1,000.0 | 6.000 | 5 | 14/01/19 | 100.00 | 5.83 |
| **SL'19** | 07/04/2014 | B1/B+/B+ | 500.0 | 5.125 | 5 | 11/04/19 | 99.62 | 6.51 |
| **SL'20** | 30/10/2010 | B1/B+/B+ | 1,000.0 | 6.250 | 10 | 04/10/20 | 97.88 | 7.57 |
| **SL'21** | 27/07/2011 | B1/B+/B+ | 1,000.0 | 6.250 | 10 | 27/07/21 | 96.50 | 7.78 |
| **SL'22** | 25/07/2012 | B1/B+/B+ | 1,000.0 | 5.875 | 10 | 25/07/22 | 94.62 | 7.77 |
| **SL'22** | 11/07/2016 | B1/B+/B+ | 500.0 | 5.750 | 5 1/2 | 18/01/22 | 94.12 | 7.80 |
| **SL'23** | 11/04/2018 | B1/B+/B+ | 1,250.0 | 5.750 | 5 | 18/04/23 | 92.75 | 7.77 |
| **SL'25** | 28/05/2015 | B1/B+/B+ | 650.0 | 6.125 | 10 | 03/06/25 | 90.50 | 8.05 |
| **SL'25** | 27/10/2015 | B1/B+/B+ | 1,500.0 | 6.850 | 10 | 03/11/25 | 93.62 | 8.08 |
| **SL'26** | 18/07/2016 | B1/B+/B+ | 1,000.0 | 6.825 | 10 | 18/07/26 | 93.00 | 8.08 |
| **SL'27** | 04/05/2017 | B1/B+/B+ | 1,500.0 | 6.200 | 10 | 11/05/27 | 88.75 | 8.08 |
| **SL'28** | 11/04/2018 | B1/B+/B+ | 1,250.0 | 6.750 | 10 | 18/04/28 | 91.00 | 8.15 |

*මූලාශ්‍ර: බාක්ලේස් බැංකුව, එච්.එස්.බී.සී. සහ සිටි බැංකුව (නිකුත් කිරීම් සඳහා බද්ධ නියමු කළමනාකරුවන්)*

# ණය කළමනාකරණ අංශය

## ණය කළමනාකරණ අංශයේ කාර්යභාර්ය

- පොදු රාජ්‍ය මණ්ඩලීය ණය වාර්තා කිරීමේ හා කළමනාකරණ පද්ධතිය (CS-DRMS) තුළ නව එකඟතාවයන්හි දත්ත සටහන් කිරීම, අවලංගු කිරීමේ සහ ණය/ ප්‍රදාන එකඟතාවයන්හි ගැනීම් කාල සීමාවන්ගේ වර්ධනය පිළිබඳ උප ඇමුණුම් වල දත්ත සටහන් කිරීම
- ණය ගිවිසුම් වලට අදාළ ප්‍රතිලබ්ධීන්, ණය වාරික ගෙවීම්, ණය පොළී නැවත ගෙවීම් සහ වෙනත් ගෙවීම් පොදු රාජ්‍ය මණ්ඩලීය ණය වාර්තා කිරීමේ හා කළමනාකරණ පද්ධතියට (CS-DRMS) ඇතුලත් කිරීම
- පොදු රාජ්‍ය මණ්ඩලීය ණය වාර්තා කිරීමේ හා කළමනාකරණ පද්ධතිය (CS-DRMS) අනුව ගෙවීම සඳහා පුරෝකතන අගයන් ණය ලබාදෙන නියෝජිතායතන අගයන් සමඟ සංසන්දනය කිරීම සහ ශ්‍රී ලංකා මහ බැංකුවට මුදල් ගෙවීම් පිළිබඳව උපදේශ ඉදිරිපත් කිරීම
- ණය එකඟතාවයන්ට අනුව පොදු රාජ්‍ය මණ්ඩලීය ණය වාර්තා කිරීමේ හා කළමනාකරණ පද්ධතිය (CS-DRMS) මඟින් ගෙවීම් සඳහා පුරෝකතනය කරන ලද අගයන් ණය ලබාදෙන නියෝජිතායතනයන්හි එම අගයන් සමඟ සංසන්දනය කිරීමේදී වෙනසක් තිබේ නම් ඒ පිළිබඳ අදාළ අංශය මඟින් තහවුරු කර ගැනීමට කටයුතු කිරීම
- නව ණය එකඟතාවයන්ට අදාළ එකඟතා සහ කොන්දේසීන්ගේ සාරාංශයක් සහ අදාළ එකඟතා ගිවිසුම්වල පිටපත් ශ්‍රී ලංකා මහ බැංකුවේ ආර්ථික විශ්ලේෂණ දෙපාර්තමේන්තුවට භාරදීම
- ණය සංඛ්‍යානයන් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට සහ අදාළ නියෝජිතායතන වෙත නිකුත් කිරීම සහ පොදු රාජ්‍ය මණ්ඩලීය ණය සටහන් කිරීමේ හා කළමනාකරණ පද්ධතිය (CS-DRMS) මඟින් ලබාගන්නා 814 වාර්තාව මඟින් ව්‍යාපෘති වශයෙන්ද ප්‍රතිලබ්ධීන් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ පළකිරීම
- විදේශ අධාර විමසුම, සැකසීම හා ප්‍රකාශයට පත්කිරීම හා මුදල් අමාත්‍යාංශය සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙහි වාර්ෂික වාර්තා, විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ කාර්යසාධන වාර්තාව, අයවැයට අදාළ දෙපාර්තමේන්තු ප්‍රකාශය සහ වෙනත් ප්‍රකාශන සඳහා අවශ්‍ය පිළියෙල කිරීම් හා සම්බන්ධීකරණය කිරීම
- විදේශ ණය ප්‍රදානයන්ට අදාළ විශ්ලේෂණ වාර්තා නියමිත කාලයන්හි පිළියෙල කිරීම සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ වෙනත් අංශ සහ වෙනත් බාහිර ආයතනවලට නියමිත කාලවලදී ලබාදීම
- පාර්ලිමේන්තුව මඟින් ණය සම්බන්ධව අසන ප්‍රශ්න සඳහා විදේශ ණය සම්බන්ධ පිළිතුරු සැපයීම හා විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් අසනු ලබන විදේශ ණය සම්බන්ධ විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම
- ණය කළමනාකරණය සම්බන්ධව මුදල් අමාත්‍යවරයාගේ සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යවරයාගේ නිර්දේශ අමාත්‍ය මණ්ඩලය වෙත ලබාදීම
- විදේශ ණය සම්බන්ධ පැන නඟින ගැටලු සඳහා මනා සම්බන්ධීකරණයක් ඇති කර ගැනීමට එම නියෝජිතායතන සහ දෙපාර්තමේන්තුවේ අදාළ අංශ සමඟ නිරන්තරයෙන් කටයුතු කිරීම

- විදේශ මූල්‍යයනය සහ ණය සම්බන්ධයෙන් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, මුදල් අමාත්‍යාංශ ලේකම් වෙතින් විවිධ ආයතන මඟින් සිදු කරනු ලබන ඉල්ලීම් සඳහා කටයුතු සිදු කිරීම
- රටේ ණය කළමනාකරණ ධාරිතාව වැඩිදියුණු කර ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව සහ පොදු රාජ්‍ය මණ්ඩලීය කණ්ඩායම සමඟ නිරන්තර ක්‍රියාදාමයන්හි නිරත වීම
- ලෝක බැංකුව, අන්තර්ජාතික මූල්‍ය අරමුදල මඟින් විදේශ ණය සංඛ්‍යානයන්ට අදාළ ඔවුන්ගේ වාර්ෂික ප්‍රකාශන සඳහා ඒ සඳහාම ආවේනික වූ ආකෘතිවලට විදේශීය ණය සංඛ්‍යානයන් ලබාදීම

## 2018 වසරේ කාර්යසාධනය

- 2018 වසරේ සිදු වූ නව එකඟතාවයන් 57ට අදාළ එකඟතා පොදු රාජ්‍ය මණ්ඩලීය ණය සටහන් කිරීමේ හා කළමනාකරණ පද්ධතියට (CS-DRMS) ඇතුළත් කිරීම හා උප ඇමුණුම් අනුව තොරතුරු පද්ධතිය යාවත්කාලීන කිරීම
- ණය ගිවිසුම්වලට අදාළව 2018 වසරේ සිදුවූ ප්‍රතිලබ්ධීන්, ණය වාරික ගෙවීම්, ණය පොළී ගෙවීම් සහ වෙනත් ගෙවීම් පොදු රාජ්‍ය මණ්ඩලීය ණය සටහන් කිරීමේ හා කළමනාකරණ පද්ධතිය (CS-DRMS) ඇතුළත් කිරීම
- 2018 වසර තුළ ණය ගිවිසුම් අනුව නියමිතව තිබූ නැවත ගෙවීම් වාරික, පොළී ගෙවීම් ඇතුළු අනෙකුත් ගෙවීම් සිදු කිරීම, ණයදෙන ආයතන වලින් ලද ගෙවීම් අගයන් CS-DRMS ඇස්තමේන්තු සමඟ සසඳා බලා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත උපදේශ ඉදිරිපත් කෙරිණි
- පොදු රාජ්‍ය මණ්ඩලීය ණය සටහන් කිරීමේ හා කළමනාකරණ පද්ධතිය (CS-DRMS) මඟින් ගෙවීම් සඳහා පුරෝකතනය කරන ලද අගයන් ණය ලබාදෙන නියෝජිතායතනයන්හි එම අගයන් සමඟ සංසන්දනය කිරීමේදී වෙනසක් සිදුවූ අවස්ථාවන්හි ණය එකඟතාවයන්ට/ ගිවිසුම් අනුව ඒ පිළිබඳ අදාළ අංශය මඟින් තහවුරු කරගැනීමට කටයුතු කිරීම
- 2018 වසරේ සිදු වූ නව එකඟතාවයන්හි අදාළ එකඟතා සහ කොන්දේසි සාරාංශ කොට පළ කිරීම
- 2018 වසර සඳහා ණය සංඛ්‍යානයන් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව සහ අදාළ නියෝජිතායතන වෙත නිකුත් කිරීම. පොදු රාජ්‍ය මණ්ඩලීය ණය සටහන් කිරීමේ හා කළමනාකරණ පද්ධතිය (CS-DRMS) මඟින් ලබාගන්නා 814 වාර්තාව මඟින් ව්‍යාපෘති වශයෙන් ප්‍රතිලබ්ධීන් විදේශ සම්පත් දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළ කිරීම
- ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය හා මුදල් අමාත්‍යාංශයෙහි 2018 වසර සඳහා විදේශ ආධාර සම්බන්ධව වාර්ෂික වාර්තාව, කාර්යසාධන වාර්තාව, අයවැයට අදාළ දෙපාර්තමේන්තු ප්‍රකාශය සහ වෙනත් ප්‍රකාශන පිළියෙල කිරීම
- විදේශ මූල්‍යයනය සහ ණය සම්බන්ධයෙන් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, මුදල් අමාත්‍යාංශ ලේකම් වෙතින් විවිධ ආයතන මඟින් සිදු කරනු ලබන ඉල්ලීම් සඳහා අවශ්‍යතාව අනුව කාලානුරූපව කටයුතු සිදු කිරීම
- 2018 වසරේ පාර්ලිමේන්තුව මඟින් ණය සම්බන්ධව අසන ප්‍රශ්න 03ක් සඳහා විදේශ ණය සම්බන්ධ පිළිතුරු සැපයීම හා විදේශ ණය සම්බන්ධව අසන ලද විගණන විමසුම් 09ක් සඳහා පිළිතුරු සැපයීම

- විදේශ ණය සම්බන්ධ පැන නඟින ගැටළු සඳහා මනා සම්බන්ධීකරණයක් ඇති කර ගැනීම සඳහා එම නියෝජිතායතන සහ දෙපාර්තමේන්තුවේ අදාළ අංශ සමඟ නිරන්තරයෙන් කටයුතු කිරීම
- රටේ ණය කළමනාකරණය ධාරිතාවය වර්ධනය කිරීමේ අභිලාෂයෙන් පොදු රාජ්‍ය මණ්ඩල ලේකම් කාර්යාලය හා ලෝක බැංකුව/ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මඟින් සිදුකරන ලද විදේශ දූත මණ්ඩල 03කට පහසුකම් සැපයිම
- ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා ලෝක බැංකුව වෙත ඔවුන්ගේ වාර්ෂික වාර්තා සඳහා අවශ්‍ය තොරතුරු අදාළ ආකෘති අනුව ලබාදීම
- ලෝකයේ පිළිගත් සිද්ධාන්ත අනුව අනුගත වෙමින් දේශීය හා විදේශීය ණය කළමනාකරණය සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පහසුකම් සැපයීම සඳහා තනි දත්ත පද්ධතියක් මඟින් වඩා කාර්යක්ෂමව පහසුකම් සැපයීම සඳහා දැනට පවතින පොදු රාජ්‍ය මණ්ඩලීය ණය සටහන් කිරීමේ හා කළමනාකරණ පද්ධතිය යාවත්කාලීන කිරීමේ කටයුතු අවසන් කරන ලදී

# අංශ සම්බන්ධීකරණ හා කාර්යසාධන අධීක්ෂණ ඒකකය

ශ්‍රී ලංකා රජය විසින් ප්‍රකාශ කර ඇති සංවර්ධන ප්‍රතිපත්ති රාමුව මඟින් ප්‍රමුඛතා පදනම මත හඳුනා ගන්නා ලද සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම සඳහා වන විදේශ මූල්‍ය ප්‍රභවයන් ආකර්ශනය කර ගැනීම, නිල සංවර්ධන ආධාර උපයෝජනය හා කළමනාකරණය, විදේශ ආධාර සම්බන්ධීකරණ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම යනාදී කාර්යයන් ඉටු කිරීම මෙම ඒකකයේ මූලික වගකීමයි.

මෙම ඒකකය මඟින් දෙපාර්තමේන්තුව තුළ පවතින එක් එක් සංවර්ධන පාර්ශ්වකරුවන්ට අදාළ සියලුම අංශ සම්බන්ධීකරණය කරන අතර, 2018 වසරේදී පහත සඳහන් කාර්යයන්හි සාර්ථකව නියැලිණි.

## 2018 ක්‍රියාකාරකම්

- රජයේ සංවර්ධන මූලාරම්භයන් ලෙස ක්‍රියාත්මක කිරීමට නියමිත සංවර්ධන ව්‍යාපෘති සහ වැඩසටහන් සඳහා අවශ්‍ය අරමුදල් පහසුකම් ලබාගැනීම සඳහා රේඛීය අමාත්‍යාංශ වලින් ලැබෙන ව්‍යාපෘති යෝජනා 62ක් සමාලෝචනය කරන ලදි
- ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මඟින් අනුමත කරන ලද ව්‍යාපෘති යෝජනා 19ක් විදේශ මූල්‍යයනය ලබාගැනීම සඳහා අදාළ සංවර්ධන පාර්ශ්වකාර අංශ වෙත යොමු කිරීම
- දෙපාර්තමේන්තුවේ සංවර්ධන පාර්ශ්වකාර අංශයන්ගෙන් තොරතුරු විමසීම මඟින් විදේශ ආධාර මඟින් ක්‍රියාත්මක කිරීමට නියමිත නව ව්‍යාපෘති යෝජනා මාලාව පිළියෙල කිරීම
- 2017 වර්ෂය සඳහා වූ දෙපාර්තමේන්තු කාර්යසාධන වාර්තාව පිළියෙල කිරීමට අවශ්‍ය යෙදවුම් ලබාදීම
- දෙපාර්තමේන්තුවේ සංවර්ධන පාර්ශ්වකාර අංශ මඟින් ඉදිරිපත් කරනු ලබන ඇස්තමේන්තු එකතු කර, 2019 වසර සඳහා ක්‍රියාත්මක හා නව ව්‍යාපෘති යෝජනා ඇතුලත් විදේශ මූල්‍යයන අයවැය ඇස්තමේන්තුව පිළියෙල කිරීම හා සම්බන්ධීකරණය කිරීම
- දෙපාර්තමේන්තුවේ සියලුම අංශයන්හි සහයෝගීත්වයෙන් 2018 වසරට අදාළ දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරකම් සැලැස්ම සකස් කිරීම සහ 2017 වසරේ ක්‍රියාකාරකම් සැලැස්මට අදාළ ප්‍රගතිය වාර්තා කිරීම
- පාර්ලිමේන්තුව, ජනාධිපති ලේකම් කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය, විගණකාධිපති දෙපාර්තමේන්තුව, භාණ්ඩාගාරයේ විවිධ දෙපාර්තමේන්තු සහ නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම් කාර්යාලය වෙතින් විදේශ මූල්‍යයන ව්‍යාපෘති, ඒවායේ ප්‍රගතිය, ඉදිරියේදී ණය ගෙවන ආකාරය, ප්‍රසම්පාදන ගැටළු ආදී විවිධ විෂය පිළිබඳ ඉල්ලීම් 38ක් ඉදිරිපත් වූ අතර, ඊට අදාළ යාවත්කාලීන කරන ලද තොරතුරු සපයන ලදි

# පාලන හා ගිණුම් අංශවල කාර්යසාධනය

## පාලන

දෙපාර්තමේන්තුව කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් හා අවශ්‍ය සහායක සේවා සපයනු ලබන්නේ පාලන හා ගිණුම් අංශ මඟිනි. එම සේවා යටතේ භෞතික හා මානව සම්පත් සංවර්ධනය හා කළමනාකරණය, සේවාවන් සම්බන්ධ භෞතික සම්පත් සැපයීම කළමනාකරණය කිරීම හා නඩත්තුව සහ මූල්‍ය කළමනාකරණය ප්‍රධාන වශයෙන් සිදුකරනු ලබයි.

### තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබූ 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතෙහි විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා, විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ නම් කළ නිලධාරියා වශයෙන් අධ්‍යක්ෂ ජනරාල්, ආර්.එම්.පී. රත්නායක මහතා කටයුතු කරනු ලබයි. අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, ඩී.ඒ.පී. අබේසේකර මහතා සහ අධ්‍යක්ෂ, සී.ඩබ්ලිව්.කේ. ධර්මසේන මහතා තොරතුරු නිලධාරීන් ලෙස පත්කර ඇත.

පනතෙහි විධිවිධාන ප්‍රකාරව ස්ථාපිත කරන ලද තොරතුරු ඒකකය වෙත 2018 වර්ෂය තුළදී තොරතුරු ඉල්ලීම් 08ක් ලැබී ඇති අතර, ඒ සෑම ඉල්ලීමක් සඳහාම අවශ්‍ය තොරතුරු ලබාදීමෙන් නියමිත කාලය තුළදී ප්‍රතිචාර දක්වා ඇත.

### කාර්ය මණ්ඩල නිපුණතා සංවර්ධනය හා පුහුණු කිරීම

දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල නිපුණතා සංවර්ධනය වෙනුවෙන් 2018 වර්ෂයේදී විශේෂ අවධානයක් යොමු කරන ලදී. ඒ අතුරින් කාර්ය මණ්ඩලය සඳහා දේශීය මෙන්ම විදේශීය පුහුණු අවස්ථා ලබාදීම මඟින් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ කුසලතා වර්ධනය කර ගැනීමට සහ කාර්යක්ෂමතාවය ඉහළ මට්ටමකට ගෙන ඒම සඳහා කටයුතු කරන ලදී. ආයතනයේ නිලධාරීන්ට 2018 වර්ෂය තුළදී ලබාදෙන ලද දේශීය හා විදේශීය පුහුණු ක්ෂේත්‍රයන් සහ පුහුණු කරන ලද කාර්ය මණ්ඩල සංඛ්‍යාව පහත සඳහන් පරිදි වේ.

#### නිලධාරීන් ලැබූ දේශීය පුහුණු

| පුහුණු පාඨමාලාව | පුහුණුව ලද නිලධාරීන් ගණන |
|---|---|
| ඖෂධ මිලදී ගැනීමේ ප්‍රසම්පාදන කටයුතු සඳහා මෙවලමක් ලෙස රාමුගත ගිවිසුම | 1 |
| ටෝස්ට් මාස්ටර් ඉන්ටර්නැෂනල් ආයතනය සමඟ ලබාදෙන දීප ව්‍යාප්ත සේවාවන්හි විශේෂ ශ්‍රේණියේ නිලධාරීන් සඳහා කථා කිරීමේ පුහුණුව | 2 |
| ටෝස්ට් මාස්ටර් ඉන්ටර්නැෂනල් ආයතනය සමඟ ලබාදෙන දීප ව්‍යාප්ත සේවාවන්හි I පන්තියේ නිලධාරීන් සඳහා කථා කිරීමේ පුහුණුව | 5 |
| MS Access දත්ත ගබඩා කළමනාකරණය | 1 |
| උසස් පැතුරුම්පත් (Advanced Excel) පාඨමාලාව | 6 |
| ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ I පන්තියේ නිලධාරීන්ගේ හැකියා වර්ධන පුහුණු වැඩසටහන | 4 |
| USAID ව්‍යාපෘතිය යටතේ හැකියා වර්ධන පුහුණු වැඩසටහන | 5 |
| වාර්තා ලිවීමේ හැකියාව | 2 |

| පුහුණු පාඨමාලාව | පුහුණුව ලද නිලධාරීන් ගණන |
|---|---|
| ව්‍යාපෘති කළමනාකරණය හා ව්‍යාපෘති යෝජනා ලිවීම | 10 |
| ඉදිරිපත් කිරීමේ හා කථන හැකියා වර්ධනය | 5 |
| වෘත්තිකයන් සඳහා ඉංග්‍රීසි ඩිප්ලෝමාව - 2018 | 3 |
| යෙදවුම් - නිමවුම් විශ්ලේෂණය පිළිබඳ ක්‍රමෝපායික දැනුම පාදක විසඳුම් ලබාදීමේ සහයක වැඩමුළුව | 3 |
| නව සිගාස් පුහුණු වැඩමුළුව | 2 |
| රැකියාමය කාර්යයන් සඳහා සහතිකපත් වැඩසටහන | 5 |

## නිලධාරීන් ලැබූ විදේශීය පුහුණු

| පුහුණු වැඩසටහන | පැවැත්වූ රට | සහභාගීවූ නිලධාරීන් ගණන |
|---|---|---|
| ආර්ථික හා රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ විද්‍යාපති උපාධි වැඩසටහන | ඕස්ට්‍රේලියාව | 1 |
| පොදු රාජ්‍ය මණ්ඩලීය ලේකම් කාර්යාලයේ ණය වාර්තාකරණය හා කළමනාකරණ පද්ධති පිළිබඳ පුහුණුව | එක්සත් රාජධානිය | 1 |
| ශ්‍රී ලංකාවේ නිදහස් වෙළඳ කලාප කළමනාකරණය පිළිබඳ සමුළුව - 2018 | චීනය | 1 |
| ආයෝජන ව්‍යාපෘතිවල ආර්ථික විශ්ලේෂණය | කොරියාව | 1 |
| IMF –SARTTAC මූල්‍ය විශ්ලේෂණය හා පුරෝකථනය | ඉන්දියාව | 1 |
| සංවර්ධනය වන රටවල් සඳහා එක් තීරයක් එක් මාවතක් සේ සංවර්ධන වැඩසටහන ප්‍රවර්ධනය කිරීමේ සමුළුව | චීනය | 1 |
| රටවල් අතර RMB නිරවුල් කිරීම හා RMB ජාත්‍යන්තරකරණය | චීනය | 2 |
| සංවර්ධනය වන රටවල් සඳහා මූල්‍යමය උපායමාර්ග | චීනය | 1 |
| රාජ්‍ය මූල්‍ය කළමනාකරණය/රාජ්‍ය ණය කළමනාකරණය පිළිබඳ විධායක වැඩසටහන | ජපානය | 1 |
| විදේශීය නිලධාරීන් සඳහා එක් තීරයක් එක් මාවතක් සේ මාර්ග ඉදිකිරීම පිළිබඳ සමුළුව | චීනය | 5 |
| සංවර්ධනය වන රටවල් සඳහා දකුණු - දකුණු සහයෝගීතා සමුළුව | චීනය | 4 |
| රාජ්‍ය ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් පාලනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ විදේශ පුහුණුව | ඉන්දියාව | 2 |
| ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I නිලධාරීන්ගේ හැකියා වර්ධනය පිළිබඳ පාඨමාලාවේ විදේශ පුහුණුව | මලයාසියාව | 1 |
| සෝයා බෝංචි නිෂ්පාදනය හා සැකසීමේ තාක්ෂණය හා සංවර්ධනය වන රටවල් සඳහා කාර්මික ධාරිතා සංවර්ධනය පිළිබඳ සමුළුව | චීනය | 1 |
| විධායක සංවර්ධන සහයෝගීතාවය සඳහා ගෝලීය හවුල්කාරිත්වය හා 2018 කොරියානු ඉගෙනුම් හා කඩිනම් කිරීමේ වැඩසටහන | කොරියාව | 1 |
| Saemoul ආදර්ශ ගම්මාන නායකත්ව පුහුණු වැඩසටහන | කොරියාව | 1 |
| ආසියානු රටවල් සඳහා තොරතුරු සම්බන්ධීකරණය ප්‍රවර්ධනය කිරීම පිළිබඳ සමුළුව | චීනය | 2 |

# මූල්‍ය විග්‍රහය

## වියදම් පිළිබඳ මූල්‍ය තොරතුරු

විදේශ සම්පත් දෙපාර්තමේන්තුව රජයට ආදායම් උපයා දෙන දෙපාර්තමේන්තුවක් නොවන නිසා එය මුදල් එක්රැස් කිරීමේ ආයතනයක් ලෙස නොසැලකේ. 2018 වර්ෂයේ අයවැය ශීර්ෂ අංක 239 යටතේ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල පුද්ගල පඩිනඩි, ප්‍රාග්ධන වියදම්, අත්තිකාරම් ගිණුම්, පුනරාවර්ථන හා වෙනත් වියදම් සඳහා මෙහෙයවීම් වලට අදාළ මූල්‍ය ප්‍රතිපාදන පහත වගුවෙන් දැක්වේ.

| පුද්ගල පඩිනඩි සඳහා ප්‍රතිපාදන | |
|---|---|
| | (රු) |
| මුදල් ප්‍රතිපාදන | 80,985,000.00 |
| **එකතු කලා** | |
| පරිපූරක ප්‍රතිපාදන | |
| මු.රෙ. 66 යටතේ මාරු කිරීම් | 1,745,000.00 |
| **අඩු කලා** | |
| මු.රෙ.66 යටතේ මාරු කිරීම් | - |
| **මුළු ප්‍රතිපාදන** | 82,730,000.00 |
| වසර තුළ වියදම් | 82,470,025.44 |

| වෙනත් පුනරාවර්ථන වියදම් | |
|---|---|
| | (රු) |
| මුදල් ප්‍රතිපාදන | 372,360,000.00 |
| **එකතු කලා** | |
| පරිපූරක ප්‍රතිපාදන | 11,100,000.00 |
| මු.රෙ. 66 යටතේ මාරු කිරීම් | - |
| **අඩු කලා** | |
| මු.රෙ. 66 යටතේ මාරු කිරීම් | 1,745,000.00 |
| **මුළු ප්‍රතිපාදන** | 381,715,000.00 |
| වසර තුළ වියදම් | 380,911,635.92 |

| ප්‍රාග්ධන වියදම | |
|---|---|
| | (රු) |
| මුදල් ප්‍රතිපාදන | 3,601,700,000.00 |
| **එකතු කලා** | |
| පරිපූරක ප්‍රතිපාදන | 345,200,000.00 |
| මු.රෙ. 66 යටතේ මාරු කිරීම් | 940,000.00 |
| **අඩු කලා** | |
| මු.රෙ. 66 යටතේ මාරු කිරීම් | 940,000.00 |
| **මුළු ප්‍රතිපාදන** | 3,946,900,000.00 |
| වසර තුළ වියදම් | 3,890,313,442.32 |

## ප්‍රාග්ධන වියදම

| වැය සංකේතය | වැය ශීර්ෂය | 2018 ඇස්තමේන්තුව (රු) | 2018 ශුද්ධ ප්‍රතිපාදන (රු) | වියදම් (රු) |
|---|---|---|---|---|
| 2001 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 50,000.00 | 50,000.00 | 3,840.00 |
| 2002 | යන්ත්‍ර හා උපකරණ පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 200,000.00 | 200,000.00 | 69,837.50 |
| 2003 | වාහන පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 1,000,000.00 | 1,190,000.00 | 1,182,807.30 |
| 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ අත්පත් කර ගැනීම | 1,000,000.00 | 60,000.00 | 28,900.00 |
| 2103 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අත්පත් කර ගැනීම | 1,000,000.00 | 1,750,000.00 | 1,712,325.00 |
| 2204 (21) | ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව | 3,443,200,000.00 | 3,634,400,000.00 | 3,578,579,569.94 |
| 2205 (17) | රාජ්‍ය නොවන ආයතන සඳහා ප්‍රාග්ධන ප්‍රදානයන් | 250,000.00 | 250,000.00 | 19,618.00 |
| 2401 | කාර්ය මණ්ඩල පුහුණු | 5,000,000.00 | 5,000,000.00 | 4,982,607.78 |
| 2401 (13) | කාර්ය මණ්ඩල පුහුණු - (ජපන් ශිෂ්‍යත්ව ආධාර) | 150,000,000.00 | 304,000,000.00 | 303,733,936.80 |
| | **එකතුව** | **3,601,700,000.00** | **3,946,900,000.00** | **3,890,313,442.32** |

## අයවැය ප්‍රතිපාදනයන් උපයෝජනයේ සාරාංශය

| වියදම් විස්තරය | 2018 ඇස්තමේන්තුව (රු) | 2018 ශුද්ධ ප්‍රතිපාදන (රු) | 2018 සත්‍ය වියදම (රු) |
|---|---|---|---|
| පුනරාවර්ථන වියදම් | 453,345,000.00 | 464,445,000.00 | 463,381,661.36 |
| ප්‍රාග්ධන වියදම් | 3,601,700,000.00 | 946,900,000.00 | 3,890,313,442.32 |
| **එකතුව** | **4,055,045,000.00** | **4,411,345,000.00** | **4353695103.68** |

## අත්තිකාරම් "බී" ගිණුම

රාජ්‍ය නිලධාරීන්ට ණය දීම සඳහා මෙම දෙපාර්තමේන්තුවේ එක් අත්තිකාරම් ගිණුමක් ඇත. සමාලෝචිත වර්ෂය තුළ අත්තිකාරම් ගිණුමේ නිශ්චිත සීමාවන් පිළිපැද ඇති අතර, එම ගිණුමේ මෙහෙයුම් පහත පරිදි වේ.

| විස්තරය | අනුමත සීමාව (රු) | සත්‍ය වියදම (රු) |
|---|---|---|
| වියදම් කිරීමේ උපරිම සීමාව | 7,500,000.00 | 5,262,180.00 |
| ලැබීමේ අවම සීමාව | 3,700,000.00 | 4,849,463.00 |
| හර ශේෂයේ උපරිම සීමාව | 30,000,000.00 | 19,554,496.00 |


## විගණන විමසුම

2018 වර්ෂය තුළ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙන් විගණන විමසුම් 01ක් හා විගණකාධිපති දෙපාර්තමේන්තුවෙන් විගණන විමසුම් 06ක් ද ලැබී ඇති අතර, සියළුම විමසුම් සඳහා පිළිතුරු යවා ඇත.

## මූල්‍ය ප්‍රකාශන 2018

2018 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශ 2019 පෙබරවාරි 27 දින ජාතික විගණන කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇත.

# සංවිධාන ව්‍යුහය




**ණක** – ණය කළමණාකරන අංශය
**ප්‍රාවෙ** –ප්‍රාග්ධන වෙළඳපොළ හා ආයෝජන අංශය
**හවඅ** - හවුල්කාරීත්ව ව්‍යාපෘති හා අධීක්ෂණ අංශය
**තොතා** - තොරතුරු තාක්ෂණ ඒකකය
**දිආ** - දියුණු ආර්ථික අංශය

**චී ආයප ආබැ** - චීන හා ආසියානු යටිතල පහසුකම් හා ආයෝජන බැංකු අංශය
**ලෝබැ ජාමූඅ** – ලෝක බැංකු හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල් අංශය
**මැ පෙ දආර** - මැදපෙරදිග හා දකුණු ආසියානු රටවල් අංශය
**අසකාසාඅ** – අංශ සම්බන්ධීකරණ හා කාර්යසාධන අධීක්ෂණ ඒකකය

**පෙආ** - පෙරදිග ආසියානු අංශය
**එජානිතාආ** - එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන සහ තාක්ෂණික ආධාර අංශය
**තොසස ප්‍රපඅ** - තොරතුරු සම්පත් සම්බන්ධීකරණ සහ ප්‍රතිපත්ති පර්යේෂණ අධ්‍යයන අංශය

**සඅ** - සහකාර අධ්‍යක්ෂ
**පනි** - පරිපාලන නිලධාරී
**තොතානි** - තොරතුරු තාක්ෂණ නිලධාරී